ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත



ඉහළ ගිය ඉන්ධන මිල සමඟ අසරණ වූ ධීවරයන්ගේ විරෝධතාවේ කවුරුත් නොකී කතාව

**හලාවත ධීවරයන් තනි නොකළ සලාපුර පදවි පියවරු**

3 පිටුව



**2013 වසරේ පළමුවන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කරගැනීම**

කොළඹ අගරදගුරු පදවියේ පෞද්ගලික පාඨශාලා අයදුම්පත් නිකුත් කිරීම පිළිබඳවයි

8 පිටුව



**සෙංකඩගලට පෙම් බැඳි ප්‍රංශයේ සුදු සුවාමි**

පුරා දශක පහකට අධික කාලයක් අම්පිටිය දෙව්සත්හලේ සිප් සතර ලබා දුන් ගරු මාටින් ක්‍යුරේ පියතුමා ගැනයි.

12 පිටුව



2010 වසරේ හොඳම ආගමික පුවත්පත

# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජූනි 07



චතාරිකයේ පළමු ඉරුදින (සාතන් විසින් ජේසුස් වහන්සේ පරීක්ෂා කරනු ලැබීම)

ක්‍රි.ව. 2012 ක් වූ පෙබරවාරි 26 ඉරිදා 146 වෙළුම 38 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 20 QD/12/NEWS/2012 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.

## ධීවරයන් එකමුතු කරන්නට ප්‍රබල කතෝලික වෘත්තීය සමිතියක් බිහිවේ?

### කතෝලික ධීවරයන්ගෙන් අන්තර් පදවි සසුන් නායකයන්ට ඉල්ලීමක්

**මෙරට වෙසෙන කතෝලික ධීවරයන්ට එරෙහිව එල්ලවන තාඩන පීඩන, අසාධාරණ හා අයුක්ති සහගත තත්ත්වයන් ජය ගැනීම සඳහා ජාතික මට්ටමෙන් කතෝලික ධීවරයන් ඒකරාශී කර වෘත්තීය සමිතියක් ගොඩනැගීමේ අවශ්‍යතාව මේ වන විට ප්‍රබල ලෙස දැනෙන්නට පටන්ගෙන ඇතැයි කතෝලික ධීවරයෝ ප්‍රකාශ කරති. මෙවැනි සාමූහික එකමුතුවක් ඔස්සේ ධීවර ජනතාවගේ දැවෙන ප්‍රශ්න වලට විසඳුම් ලබා ගැනීමේ දී විවිධ දේශපාලන අතපෙවීම් රාජ්‍ය නොවන සංවිධාන වල ක්‍රියාකාරකම් මඟ හරවා ගනිමින් ඒකායන අරමුණකින් සැබෑ ඉලක්ක කරා යොමුවන්නට ධීවර ජනතාව හා අත්වැල් බැඳ ගැනීමට කතෝලික සභාව ඉදිරිපත් විය යුතු යුගය උදා වී ඇතැයි ධීවරයෝ කියා සිටිති.**

සංවිධාන ගත නොවූ ශ්‍රමික කොටස් අතර ප්‍රබල ජන කොටසක් වන ධීවර ජනතාවට ඒ නිසා ම මේ වන විට විවිධ දුක් ගැහැට වලට මුහුණ පෑමට සිදුවී ඇත. රැකියා බිම් අහිමිවීම, ධීවර රැකියාවේ සුරක්ෂිත භාවයට බලපෑම් එල්ල වීම, මත්ස්‍ය සම්පත් සඳහා සාධාරණ මිල ගණන් නොලැබීම, සහනාධාර සැබෑ ධීවරයා අතට පත් නොවීම ඇතුළු ගැටලු රැසක් ධීවර ක්ෂේත්‍රයේ පවතින අතර පටු පක්ෂ දේශපාලන ක්‍රියාකාරකම් නිසා ධීවරයන් බෙදා පාලනය කිරීමට යොමුවීමේ තත්ත්වයන් ද මතුව තිබේ.

විවිධ රාජ්‍ය නොවන සංවිධාන සැබෑ ධීවර ජනතාව උදෙසා ඇප කැප වෙනුවට තම තමන්ගේ න්‍යාය පත්‍රයන්ට ධීවර ජනතාව යොමුකර සිය අරමුණු ඉටුකර ගැනීමේ තත්ත්වයන් ද දක්නට ලැබේ.

15 පිටුවට ▶

## උගත් පාඩම් කොමිසම සහ ජනතා සංහිඳියාව

**ඒන්ස්ලි ජෝශප් විසිනි**

උගත් පාඩම් හා සංහිඳියා කොමිසම් වාර්තාව පිළිබඳ යම් හැදෑරීමක් කරමින් සිවිල් සංවිධාන සහ රටේ සාමය වෙනුවෙන් උනන්දුව දක්වන සිවිල් පුරවැසියන් වශයෙන් මෙහි සඳහන් නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා රජයට බලපෑම් කළ හැකි ආකාරය පිළිබඳව සොයා බැලීම සඳහා 2012 ජනවාරි 31 වැනි දින කරිටාස් ශ්‍රී ලංකා ආයතන ශ්‍රවණාගාරයේ දී බුද්ධිමතුන්ගේ හමුවක් පැවැත්විණි.

මෙහිදී පිළිගැනීමේ කථාව කළ කරිටාස් ශ්‍රී ලංකා ජාතික අධ්‍යක්ෂ ගරු ජෝර්ජ් සිගාමනි පියතුමා කියා සිටියේ ආගමික සංවිධානයක් වන කරිටාස් ශ්‍රී ලංකා ආයතනය ජාතික සමගිය අගයන බවත්, උගත් පාඩම් හා සංහිඳියා කොමිසම් සභාවේ

15 පිටුවට ▶

## ඔහු වීරයෙකි! ඔහු දිවි පිදුවේ මෙරට තෙල් මිල නිසා පීඩා විඳින සියල්ලන් වෙනුවෙනි





සේයා - පර්සි ප්‍රනාන්දු

හලාවත පැවැති ධීවර උද්ඝෝෂණයේ දී වෙඩි පහරකින් මියගිය වර්ණකුලසූරිය ඇන්තනි ප්‍රනාන්දු ධීවර තරුණයාගේ අවසන් කටයුතු සිදුකළ මොහොතේ ඔහුගේ දියණිය සිය පියාණන්ගේ දෙන අභියස සොවින් බරව...

## ඉන්දු - ශ්‍රී ලංකා තරුණ පරපුර අසල්වැසියන් සේ එකට වර්ධනය විය යුතුයි

### ඉන්දීය මහ කොමසාරිස් කොළඹ සා. පීතරයේ දී අවධාරණය කරයි

**ඉමෝජන් මෙල් විසිනි**

"බහු වාර්ගික, බහු - සංස්කෘතික සමාජයක හැදී වැඩෙන්න ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ තරුණ පරපුර වාසනාවක් උරුම කොට තිබෙනවා. ඒ ආභාෂයෙන් වර්ධනය වන ඔබ වර්තමානයේ තරුණ පරපුරක් සේ ජීවිත ගොඩනැංවීමේ දී අධ්‍යාපනය ලබා ගන්නා දෙයක් නොව ලබා ගත යුතු දෙයක් බවට පත් කරගන්න."

15 පිටුවට ▶



අශෝක් කේ. කාන්තා මහතාව හරසරින් පිළිගෙන අදියුරු පියතුමන් විසින් කැඳවාගෙන ආ අයුරු..

### කොළඹ අගරදගුරු පදවියේ චතාරික අරමුදල -2012

## ජීවිතය දෙවියන්ගෙන් ලැබෙන තිළිණයකි දරුවෝ ද, එසේම ය

**ගරු ලෝරන්ස් රාමනායක පියතුමා විසිනි**

අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරු හිමිපාණන්ගේ අදහසට අනුව කොළඹ අගරදගුරු පදවියේ මෙවර චතාරික අරමුදල යොදවනු ලබන්නේ "ජීවිත සංරක්ෂණය සහ නූපන් දරුවන්ගේ ජීවත් වීමේ අයිතිය සුරක්ෂිත කිරීමේ" අරමුණින් යුතුව පිහිටවනු ලබන අරමුදලක් ආරම්භ කිරීම සඳහා ය.

කොළඹ අගරදගුරු පදවිය තුළ මෙන්ම මුළු රටේ ද ගබ්සාව ව්‍යාප්ත වෙමින් පවතින නිසා, නොයෙකුත් හේතූන් මත තම දරු ගැබ විනාශ කිරීමට යොමුවන මව්වරුන්ට, තම නූපන් දරුවන්ගේ ජීවිතය ආරක්ෂා කොටගෙන මෙලොවට බිහි කිරීම සඳහා හැකි සෑම ආකාරයකින්ම සහාය වීම මෙම අරමුදලේ මූලික අරමුණයි.

මේ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් සෙත් සරණ කරිටාස් කොළඹ ආයතනය විසින් චතාරික කාලයේ දී දියත් කරනු ඇත. මීසම් සේවක පියතුමන් මඟින් ඉදිරියේ දී දැනුවත් කැරේ.

## අගරදගුරු පදවි ළමා දිනය 03 දා

"වචනයේ දාසියයි ඔබ, මරි මවේ, දරු අපේ" යන්න තේමා කර ගනිමින් අගරදගුරු පදවි ළමා දිනය 2012 මාර්තු මස 03 දා පෙ.ව. 8.00 කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් තේවත්ත ලංකා අප ස්වාමිදූගේ බැසිලිකා පුදබිමේ දී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. 6 වසරින් ඉහළ සියලුම දහම් පාසල් දූ දරුවන් ඇතුළු ගුරු භවතුන්ට මෙදින පැමිණෙන ලෙස අගරදගුරු පදවි ධර්මෝපදේශ මධ්‍යස්ථානය ඇරියුම් කර සිටී.

## ත්‍යාග ප්‍රදානෝත්සවය 110 වරටත්

කොළඹ 10, සා. ජෝශප් විදුහලේ 110 ත්‍යාග ප්‍රදානෝත්සවය පසුගිය 24 දා ස්ටැන්ලි අබේසේකර ශ්‍රවණාගාරයේ දී උත්කර්ෂවත්ව පැවැත්විණි. ජනාධිපති නීතිඥ හා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ප්‍රියශාත් ජෙරාඩ් ඩෙප් මහතා මෙහි ප්‍රධාන ආරාධිතයා වූ අතර පෞද්ගලික විශ්ව විද්‍යාල පිළිබඳ පැහැදිලි මත විමසුමක් කරමින් වසරේ වාර්තාව අදියුරු ගරු සිල්වෙස්ටර් රණසිංහ පියතුමන් විසින් ඉදිරිපත් කරන්නට යෙදිණි.

## ජුබිලිය වෙනුවෙන් පෝෂණ වැඩසටහනක්

කුරුණෑගල පදවි 25 වන ජුබිලිය නිමිත්තෙන් කුරුණෑගල මීසම විසින් සංවිධානය කරන ලද පවුල් හා තරුණ තරුණියන් සඳහා වූ පෝෂණ වැඩසටහනක් 19 වන ඉරිදා කුරුණෑගල සහ මල්කඩුවාව දේවස්ථානයන්හි මීසම් වාසීන් වෙනුවෙන්, සා. ආනා ආසන දෙව්මැඳුරේ දී පැවැත්විණි. (15 පිටුවට)

(✍ ශානක මුහන්දිරම්)

## නිවැරදි කිරීමක්

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව මඟින් සංවිධානය කරන 2012 පාස්කු අතිරේකය සඳහා එවන නිර්මාණ පහත ලිපිනයට යොමු කරන්න.

**අධ්‍යක්ෂ,**
**ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව,**
**අංක 155/10,**
**කාසල් වීදිය,**
**කොළඹ 08.**

"මම නුඹ සමඟ පිහිටුවන ලද ගිවිසුම සිහිකරන්නෙමි"

පදවියෙන් පදවියට

# මරිමවු හස්තය දිගු වූ බිහිසුණු මොහොතක්!

**වේලාව ප.ව. 1.30 පමණ වන්නට ඇත. කුරුණෑගල - පුත්තලම දිස්ත්‍රික්ක වෙන්වන ප්‍රධාන මාර්ගයේ කුරුණෑගල දිසාවට වන්නට අහස ගිගුම් දෙන විශාල ශබ්දයකි. පිපුරුම් හඬින් මුළු ප්‍රදේශයම කම්පා වෙද්දී පොළොවට පතිත වන ගිනි බෝලය කවරකු කොයි මොහොතේ බිලි ගනීවිදෝ යන අවිනිශ්චිත බිය සෑම හදවතකම දෝංකාර දුනි. මෙහි ගමන් මග ද අවිනිශ්චිතය. අන් කළ හැකි කිසිවක් නොවූ තැන ගුවන් නියමුවා සිය ජීවිත ආරක්ෂාව පතා යානයෙන් ඉවතට පැන ඇත.**

මිග් 27 යානය වරෙක පොල්ගහඅගාර දෙව්මැඳුරට ඉහළින් ගමන් ගත් අතර මිනිසුන්ගේ බිය දෙගුණ තෙගුණ කරමින්, පොළවට පතිත නොවී ඉහළ අහසේ ගමන් කළේ වක්‍රාකාරවය. කුඹුක්ගහමුල්ල මධ්‍ය විද්‍යාලය දරුවන් දහස් ගණනක් ඉගෙනුම ලබන පාසලකි. හැවන විද්‍යාලයේ දරුවන් පාසල ඇරී පාරට පැමිණ නැවත පාසලට දිව ගොස් ඇත. ගුරුවරුන් ද දරුවන්ගේ වගකීම ගනිද්දී දෙමාපියන් නිවෙස්වල සිට කෑ මොර දුන්නේ දරුවන්ට අනතුරක් වේය කියාය.

අවසානයේ මේ යානය වැටුණු තැන අවට, මිනිසුන් දහස් ගණනක් දිවි ගෙවන ගම්මාන රාශියකි. පොල්ගහආගර, වතුගහමුල්ල, පනාගොඩ, හැවන, ඉද්දගහපිටිය, උඩදෙනිය ඉන් කීපයකි. මෙම යානය පතිත වූයේ පොල් වත්තකටය. පැය ගණනක් එය ගිනිගෙන ඇවුණේය. කළු දුමාරයෙන් ප්‍රදේශයම වැසී ගියේය. දරුවෝ බියට පත්ව තවමත් කම්පිතව සිටිති. එහෙත්, කිසිදු ජීවිත හානියක් නොවීය.

අවසානයේ මෙම යානයේ සිදු වූ පිපුරුම් වලින් මීටර සිය ගණනක් දුරට ගින්න විහිදී ගොස් තිබේ. එහි සුන්බුන් ද තැනින් තැන වැටී තිබේ. විවිධ ස්ථානවලදී ඇසු, දුටු සිද්ධිවලින් හා යම් යම් කොටස් වැටී තිබූ තැන් අනුව ප්‍රත්‍යක්ෂ වන කරුණක් වූයේ, වැටීමට ආසන්නයේ මෙම යානයට සෘජු ගමන් මාර්ගයක් නොතිබූ බවයි. එනිසා එය කුමන හෝ ස්ථානයකට කඩා වැටීමේ අවදානම බහුල විය.

එහෙත්; අවසන කිසිවෙකුගේ ජීවිතයකට සිරීම් තුවාලයක් හෝ සිදු නොකරමින් එය පොල් වත්තට වැටිණි. අවම වශයෙන් එම වත්තේ තිබූ මුර නිවසද ආරක්ෂා වී තිබූ අයුරු පුදුම සහගතය. එම යානයේ ශබ්දය හා ගින්න කෙතරම් ප්‍රබල දැයි කිවහොත් මීටර ගණනාවක් දුරින් පොලගකු මැරී සිටියේය. මිනිස් ජීවිතයක් වුවද මුහුණ දෙන්නේ එම තත්ත්වයටමය.

පොල්ගහඅගාර ජනතාව ආරෝග්‍ය දේවමාතාවන්ගේ ආදරය විශ්වාස කරන්නේ තම ජීවිත අත්දැකීම් පදනම් කරගෙනය. මෙම තත්ත්වයේදී එතුමිය සියළු ජීවිත ආරක්ෂා කරමින්, මෙම යානය පොල් වත්තකට "තල්ලු කළා" යැයි පවසන්නෝ, කතෝලිකයන් පමණක් ම නොවෙති. එහෙයින් අපි එතුමිය මඟින් සමිඳුන්ට ප්‍රශංසා කරමු. එතුමියගේ මාතෘක ආදරය වැළඳ ගනිමු.

ජූඩ් ප්‍රැන්සිස්
පොල්ගහඅගාර

## වැලිගම්පිටියේ සිවුවන තලවිල චතාරික ගමන

වැලිගම්පිටිය මීසම් සේවක ගරු ශ්‍රී ලාල් පොන්සේකා පියතුමාගේ අධ්‍යාත්මික පෝෂණ සත්කාරයේ හතරවන තලවිල චතාරික ගමන මාර්තු 17 දින පැවැත්වේ.

මෙවරද සහභාගිවන සියලුම බැතිමතුන්ට දිවා ආහාරය නොමිලේ ලබාදීමට මීසමේ ව්‍යාපාරික ඩෙරික් රන්දෙනිය මහතා ඉදිරිපත් වී ඇත. වැලිග ම්පිටිය ක්‍රිස්තියානි පවුල් ව්‍යාපාරය ගමන සංවිධාන කරයි.

වෝල්ටර් රත්නායක

**අතිඋතුම් මැක්ස්වල් රදගුරු හිම්පාණන් විල්ලෝරාවත්තට පිළිගනිමින්..........**



විල්ලෝරාවත්ත මීසම් සේවක ගරු ටෝනි පිංතු පියතුමා ප්‍රධාන මීසම් ජනතාව විසින් මෝල්පේ පිහිටි එතුමාගේ නිවස ආසන්නයේ පිළිගනු ලැබීමෙන් පසුව, විවාත රථයක නංවා, පහත රට නැටුම් සහිත පෙරහරකින් විල්ලෝරාවත්ත දෙව්මැඳුර කරා කැඳවා ගෙන යන අයුරු.

සටහන - ට්‍රිසිල් ඇෆ්. මෙන්දිස්
සේයා - රෝෂාන් ප්‍රදීප්

**අතිඋතුම් එම්මානුවෙල් රදගුරු හිම්පාණන් සා. බෙනඩික් විද්‍යාලයට පිළිගනිමින්.........**



කොටහේනේ සා. බෙනඩික් විද්‍යාලයට නව රදගුරු හිම්පාණන් පිළිගත් මොහොතයි. විද්‍යාලයේ අදියුරු ගරු ජානක පොන්සේකා සහෝදර තුමා සහ කොටහේන මීසම් සේවක ගරු ටෝනි මාටින් පියතුමන් එතුමාණන්ව පෙරහරේ කැඳවාගෙන යන අයුරු.

සේයා - රෝෂාන් ප්‍රදීප්

## බදුල්ල කනිටු දෙව්සත්හලට ශ්‍රී හෘද සමිතියේ අවධානය

බදුල්ල සා. මරියා ආසන දෙව්මැඳුරේ ශ්‍රී හෘද සමිතිය නව වසරේදී බදුල්ල පදවියේ කනිටු දෙව්සත්හලට ආධාර කිරීමට තීරණය කර තිබේ.

මේ සඳහා ඔවුන්ට මඟ පෙන්වූයේ බදුල්ල මීසම් සේවක ගරු ප්‍රියලාල් කුරේ පියතුමාය. පදවියේ දේව කැඳවීම් වලට ගොස් සිටින පූජක සිසුන් මහත් දුෂ්කරතා මැද දිවිගෙවන බවත්, ඔවුන් දිරිගැන්වීම සඳහා හපුතලේ සා. එමාඩ් කනිටු දෙව්සත්හලේ පූජක සිසුන්ට අවශ්‍ය දේ ගැනීමට ආධාර කරන ලෙසත් ගරු පියතුමා ඉල්ලා සිටියේය.

ඒ අනුව බදුල්ල ශ්‍රී හෘද සමිතියේ සාමාජිකාවන් හපුතලේ සා. එමාඩ් දෙව්සත්හල් අධ්‍යක්ෂ ගරු යොහාන් ප්‍රනාන්දු පියතුමාගෙ න් දිනයක් ලබාගෙන දෙව්සත්හලට ගියේ පූජක සිසුන් 06 දෙනෙක් දිරිගන්වා තව තවත් දේව කැඳවීම් වලට තවත් අය යොමු කරන අදහසිනි. එදින එම දෙව්සත්හලේ සැමට දිවා ආහාරය ද මාස 03 ට වරක් යම් ආධාර මුදලක්ද රැගෙන යාමට පියවර ගෙන තිබේ.

ශ්‍රීකාන්ති ගුණවර්ධන



වත්තල - මාබෝල නගර සභාවේ නාගරික මන්ත්‍රී ලෙනාඩ් රෝහණ මහතා 14 වන වරටත් සංවිධානය කළ දුගී දරු දැරියන්ට පොත් බෙදාදීමේ උත්සවය ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හා විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ජෝන් අමරතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා පැවැත්විණි. මෙහිදී සිසු සිසුවියන් දහසකට පොත් බෙදා දුනි. මෙම අවස්ථාවට වත්තල ප්‍රාදේශිය සභාවේ විපක්ෂ නායක චානක සෙනරත් මහතාද සහභාගි විය. කතෝලික මන්ත්‍රීවරයකු වන ලෙනාඩ් රෝහණ මහතා පසෙකින් සිටි.

තිළිණ

# කඩලාන සා. අන්තෝනි විදුහල රැකගැනීමට කතෝලික සභාව ඉදිරිපත්වෙයි

කඩලාන සා. අන්තෝනි විදුහලට අවශ්‍ය මූලික පහසුකම් නොදී ගුරුවරුන් ස්ථාන මාරු වූ විට අවශ්‍ය අනුප්‍රාප්තිකයන් පත් නොකර පරිපාලනය පැත්තෙන් නිසි අවධානයක් සැලකිල්ලක් නොදක්වා පාසල කඩා වැටීමේ වරද දෙමාපියන්ටත්, ගමේ අපටත් පැටවීම අසාධාරණ බව කොළඹ දකුණ කලාපීය නාහිමි අතිගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු පියතුමා මොරටුව කොට්ටාශ අධ්‍යාපන අධ්‍යක්ෂිකා ජයලත් මැණිකේ මහත්මියගේ මූලිකත්වයෙන් ආදි ශිෂ්‍යයින් දෙමාපියන් හා විදුහලට හිතැති ග්‍රාමයේ ජනතාව එක්ව පැවති විශේෂ රැස්වීමක් අමතමින් ප්‍රකාශ කළේය.

එහිදී වැඩි දුරටත් අදහස් දැක්වූ කලාපීය නාහිම්පාණන් මේ පාසල වසා නොදමන පාසලක් ලෙස ලේඛන ගත කර ඇති බවත්, නිසි විනයක් ඇතිව දරු දැරියන්ට අධ්‍යාපනය ලබාදී ඔවුන්ගේ අනාගතය සාර්ථක කරනා ආකාරය සභාව හොඳින් දන්නා බවත් රජය හා අධ්‍යාපන දෙපාර්තමේන්තුව නිසි පහසුකම් ලබා දෙන්නේ නම් මෙම පාසල දියුණු කිරීමේ වගකීම කාදිනල් හිම්පාණන්ගේ මූලිකත්වයෙන් ගමේ ජනතාව සමඟ එක්ව සභාව භාර ගන්නා බවත් පැවසීය.

කඩලාන මීසම් සේවක ගරු ලලිත් පෙරේරා පියතුමා අදහස් දක්වමින් මෙම පාසලට සභාවෙන් කරන විවිධ උපකාර එහි පරිපාලනය විසින් අමතක කර කථා කිරීම ගැන කණගාටුවන බවත්, විදුහලට ශබ්ද විකාශන යන්ත්‍ර කට්ටලය ලබාදුන්නේ ද මොරටුව සා. සෙබස්තියන් විදුහලේ ශිෂ්‍ය නායක මණ්ඩලය විසින් බව සිහි ගැන්වීය. මෙම පාසල වසා දැමීමට හෝ වෙනත් පාසලක් හා බද්ධ කිරීමට කිසි සේත් ඉඩ නොදෙන බව ද ගරු පියතුමා වැඩි දුරටත් අවධාරණය කළේය.

මේ අවස්ථාවට සා. සෙබස්තියන් විදුහල නියෝජනය කරමින් පියතුමකු ද එක්වීම විශේෂත්වයක් වූ අතර නගරාධිපති, පලාත් සභා මන්ත්‍රීවරුන්, නාගරික මන්ත්‍රී වරුන් ද ආදි සිසුන් ලෙස එක්ව සිටීම විශේෂත්වයකි.

සුමිත් මාර්ක් ද සිල්වා



පහළ කඳවල සහ තිඹිරිගස්කටුව ජ්‍යෙෂ්ඨ පුරවැසි කමිටුවේ සාමාජික සාමාජිකාවෝ ඉතා ආදර්ශවත් කටයුත්තක නියැලුනහ. කිතුනු බොදුනු මේ දෙටු පුරවැසියෝ කඳවල වික්ෂෝප දේවමාතා දෙව්මැඳුරු භූමිය ශුද්ධ පවිත්‍ර කිරීමේ ශ්‍රමදානයක නියැලීමෙන් පසු මීසම් සේවක ගරු සරත් තිරිමාන්න පියතුමා සමඟ මෙසේ ඡායාරූපයකට පෙනී සිටියහ.

සිසිල් ඩැනීසියස්

**අද සමාජය ආකර්ෂනය කරනු ලබන විවිධ බලවේග තිබෙනවා. විශේෂයෙන් අප දරු පරපුර එයට යොමුවීමේ, යොමුකරලීමේ ප්‍රවනතාවයක් පෙනෙනවා. අපේ දෙමව්පියන් වැඩිහිටියන් තම දරුවන්, තරගකාරී විලාසිතාවනට උපකාරන පන්තිවලට, ජංගම දුරකතන ඇතුලු සංනිවේදන උපකාරක වලට නැඹුරු කරලීමේ ප්‍රවනතාවයක් තියනවා. මේ හරහා මත්ද්‍රව්‍ය භාවිතය වැනි කටයුතුත් දකින්ට ලැබෙනවා. හැබැයි මේ උනන්දුව, කැපවීම අපේ දහම් පාසල් ක්‍රියාකාරකම් වලට යොමුවී නැහැ. එහෙයින් ඉහතකී බලවේග හඳුනා ගෙන දරුවන් යහමගට යැවීමට දහම් පාසල් ක්‍රියාවලියට යොමු කිරීමට ඔබ සැම විශේෂ අවධානයක් යොමු කළ යුතු යයි රත්නපුර මීසමේ දහම් පාසල් නිරීක්ෂණය කිරීමට පෙරාතුව පැවති දේව මෙහෙයේදී රත්නපුර පදවි ධර්මෝපදේශ අධ්‍යක්ෂ** ගරු පෝල් ප්‍රනාන්දු පියතුමා පැවසීය.



තවදුරටත් මීසම් වාසින් ඇමතූ එතුමා "සමාජයේ විවිධ විෂම බලවේග පාලනය කරන විෂය ආගමයි. හදවත පාලනය කරනු ලබන විෂය ආගමයි. එහෙයින් වඩාත් පුලුල් අයුරින් සිතා ඔබේ දරු දැරියන් වැරදි මගට යාමට පෙරමඟ නොසලසා දරුවන් දහම් පාසලට එවීමට එහි ක්‍රියා කාරකම් වලට ප්‍රමුඛත්වය දීමට එම කටයුතු පිළිබඳව නිරන්තයෙන් සොයා බලන ලෙස ඉල්ලා සිටීමට කැමති යයි ද පැවසීය.

මෙදින 2011 කතෝලික සාහිත්‍ය, කථික, ලිවීම තරගාවලියේ පදවි මට්ටමින් ජයගත් ළමුන්ට සහතික පත් බෙදාදීම ද දමිළ සිංහල දහම් පාසල් ගුරු භවතුන් හමුවක්ද පැවතින. මීසම් සේවක ගරු රන්ජන් මාල් මොරායස් සහයක ගරු පී. රොමේෂ් පියවරු ඊට සහභාගි වූහ.

තියබෝල්ඩ් සමරතුංග

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk

ක්‍රිස්තු වර්ෂ 2012 පෙබරවාරි 26 ඉරිදා

# වන්දනාවත්, වින්දනයත් අතර වෙනස කියන චතාරික සමය

ක්‍රිතුනු ඇදහිල්ලේ කේන්ද්‍රීය ධර්මතා හා බැඳි කිතුනු ජනවන්දනා සමයේ වසන්ත කාලය ගිය බදාදායින් ඇරඹිනි. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත මහා පූජාවට පෙර යෙදුන සිද්ධීන් හා සම්බන්ධ වූ වත් පිළිවෙත් රැසක් ඔවුන්වහන්සේගේ දුක්ප්‍රාප්තිය සිහිපත් කෙරෙමින්ම සමරන්නට මේ සමය තුළදී උත්සුක වන කතෝලිකයා හට මහා වන්දනා ගමනක් අරඹන්නට කාලයක් ද දැන් උදාවී ඇත. මේ සමය තුළදී පැවැත්වෙන කිතුනු ජනවන්දනා මෙහෙයන් සංකේතාර්ථයෙන්ද, සංස්කෘතික අගයෙන් ද අනූන බව කිව යුතු නොවේ. එපමණක් නොව මේ චතාරික සමය තුළ දී පවත්වන ජන වන්දනා මෙහෙයන් වටා විවිධ බැති සිරිත්, වත් පිළිවෙත් හා වතාවත් බෙහෙවින්ම ගොඩනැඟී ඇති බවත් පැහැදිලියි. ජනවන්දනා සම්ප්‍රදාය වටා ගොඩනැඟුන ඒ බැති රටාව පදනම් කර ගත් පාස්කු කලා සම්ප්‍රදායක් ද මෙරට ගොඩ නැඟී ඇති බව ප්‍රත්‍යක්ෂයි. ලතෝනි, පසන් හා කන්තාරු ගී ආර පැරණි ජන සම්බන්ධතාවය තීව්‍ර කරන්නක් වැනියි. ඒ අනුව බලන කල චතාරික සමය මෙරට කතෝලිකයනට ජන වන්දනාමය අංශයෙන් මෙන්ම සංස්කෘතික අංශයෙන් ද වැදගත් සමයකි.

පසන් ගායනය, පාස්කු දර්ශනය ආදී චතාරික කලා බිහිවී ඇත්තේ පාස්කු ජන වන්දනාව වඩාත් සාර්ථක කරනු පිණිසයි. ජනවන්දනාව ඇත්තේ ධර්මානුජීවනය වඩ වඩා වර්ධනාත්මකව පෝෂිත කරනු පිණිසයි. වඩ වඩාත් විශ්වාසය තීව්‍ර කරනු පිණිසයි. එබැවින් ජන වන්දනාවේ කේන්ද්‍රීය දැහැන් සමයත්, දහම් සමයත් වන චතාරික සමය තුළ මේ පිළිබඳ යථාර්ථය විමසා බැලීම උචිත වන බව අප අදහසයි.

ධර්මානුජීවනය හෙවත් අර්ථවත් කිතුනු ජීවිතයන් සඳහා එඩි වඩන්නට උපරිම අවස්ථාවක් විය යුතු පාස්කු ජන වන්දනාවත්, බැති සිරිතත්, වත් පිළිවෙතත්, පාස්කු කලාවත් අප අද පූර්ණ කිතුනු ජීවිතයට සැබවින්ම අත් වැලක් කර ගෙන ඇත්ද යන ප්‍රශ්නයනට සියළු කතෝලිකයනට මුහුණ දිය යුතුව තිබේ. මේ චතාරික සමය එළඹෙත්ම කතෝලිකයා පමණක් අවබෝධයෙන් කථා කරන හෘදය සාක්ෂ්‍යයෙන්ම විමසා පැහැදිලි පහන් පිළිතුරක් ඔහු හෝ ඇය උක්ත ප්‍රශ්නයට සොයා ගත යුතුයි. කලාව කලාව උදෙසාමයි කී පුරාණ රසවාදීන් මෙන් ජන වන්දනාව තුළ හුදෙක් පිළිවෙත් වාදී තෘප්තියක් පතමින් ද පාස්කුවේ යථාර්ථය අමතක කරමින් එය වන්දනාවට වඩා වින්දනයට අවස්ථාවක් කර ගන්නා පුද්ගල මූලික ජනප්‍රිය සංස්කෘතියක් අද කතෝලිකයන් අතර බිහිවෙමින් පවතී. මේ උතුම් සමයේ බැති පිළිවෙත් අකුරට පිළි පදිමින් චතාරිකයේ හතළිස් දින තුළ පාදනමස්කාරය, වන්දනා ගමන්, තුන් පැය ධ්‍යානය, ශුද්ධ වූ පැය ආදියෙහි බොහෝ සෙයින් යෙදෙන මුත් පාස්කුවට පදනම් වූ විමුක්ති පෙළහර අමතක කරන අය අද බොහෝයි. තමන්ගේ දේශපාලන දෘෂ්ඨිය තුළ විමුක්තියේ නිර්වචනයත් තමන් තුළින්ම මහා සත්‍යතාවන් සේ එළිදක්වන ඊනියා විමුක්තිකාමයකින් පිරුණු බොහෝ උදවියගේ එළිබැසීමද මේ කාල වකවානුවේ බෙහෙවින් සිදුවේ. නමුත් කුරුසියේ විමුක්තිය හා ජීවමාන සංකේතය තුළ ගොඩ නැඟෙන චින්තනයේ අමා දහම ඒ බොල් කස කරුවනට හොඳම අතුල් පහරකි.

තමන් වහන්සේ දෙසූ සහෝදරත්වයේ දහම සහෝදර දයාවේ උසස්තම ආදර්ශය වන සිය ජීවිත පූජාවේ සාක්ෂ්‍යයෙන් ඔප් නැංවූ කිතු සමිඳුන්ගේ මඟ යන කතෝලිකයා තම සමකාලීන දූත සාක්ෂ්‍ය අනාවරණය කරගත යුත්තේ සමකාලීන ජන ජීවිතය තුළයි. අද්‍යතන ජීවිත අරගලය මතයි. පොදු ජන හද ගැස්ම තුළයි. ජන වන්දනාව ඊට බාධාවක් නොව රුකුලක්ම විය යුතුයි. සංස්ථාගත පාපය නමැති විෂමාචාරය අද විවිධ රූ ගන්නා අතර, එදා මෙන්ම අදත් පිළිවෙත් වාදය තුළද කඳවුරු බදින අවස්ථා එමටයි. එදා පරිසිවරුන් මෙන් නීතියේ හා පිළිවෙතේ ජීවාර්ථය වෙනුවට එහි බාහිරයට වැඳුම් පිදුම් කිරීමෙන් තෘප්තිය හා පාප මෝචනය පතන අයට චතාරික සමය රස ගුලාවක් වී ඇත.

දෙවිඳුන් හා තම සහෝදරයා හඳුනාගැනීමේ එළියක්ද, දේව ප්‍රේමය හා සහෝදර ප්‍රේමය ජීවත් කරවීමේ අවස්ථාවක් ද විය යුතු ජන වන්දනාව හා බැති පිළිවෙත කල්පිත ලොවකට තමන් බැඳ තබන විලංගුවක් බවට හරවා ගෙන, දෙවිඳුන් පුදනවා වෙනුවට බැති පිළිවෙතට මුවාවී ආත්මාර්ථය පුදන පරිසිවරුන්ගේ අන්ධ දෘෂ්ටිය අදේව වාදීන්ගේ මිත්‍යා දෘෂ්ටියට වඩා විෂමයි. මේ චතාරික සමයේ දී අරුත් විපරිත කරන එබඳු පිළිවෙත් වාදීන්ගේ නිසරු වෑයම වෙනුවට පාස්කු පණිවුඩයේ කේන්ද්‍රීය අර්ථය වඩ වඩාත් ජනතාව හමුවේ තබන විවරණයක් මේ සමයේ ඉටුකරන වන්දනා පිළිවෙත් තුළින් මතු කිරීම අවශ්‍ය යයි. මතු කර ගැනීම අත්‍යවශ්‍ය යයි. අවුරුද්දේ අන් කිසිදු වකවානුවකට වඩා කිතුනුවන් දෙව් මැඳුර වටා එක් රොක් වන මේ චතාරික සමයේ දී සෑම ජන වන්දනා පිළිවෙතක්ම කිතුනු විමුක්ති පණිවුඩයේ හරය වන දේව ප්‍රේමයත් සහෝදර දයාවත් වෙත සැදැහැ සිත් පුබුදුවන අවස්ථා විය යුතුයි. ඒ දැහැන සමයාන්තර දැක්මක් මත පිහිටා කරන ආත්ම වංචනයකට වඩා මහත් සේ වටින්නේ එහි පැවැත්ම කිතුනු ධර්මානු ජීවනයම ජීවත් කරන බැවිනි.

# හලාවත ධීවරයා තනි නොකළ සලාපුර පදවි පියවරු



**කිතු දහම ශ්‍රී ලංකාවේ ආරම්භයේ සිටම සභාව හා ධීවර ප්‍රජාව අතර ඇත්තේ ගසට පොත්ත මෙන් දැඩි බැඳීමකි. විශේෂයෙන්ම මෙරට මුහුදුබඩ ප්‍රදේශවල ධීවර ජනතාව සභාවට ඉතාම ලැදිව කටයුතු කරන අතර සභාව ද පෙරළා ධීවරයින්ගේ ගැටළුවලදී සෘජුවම ඔවුන් වෙනුවෙන් පෙනී සිටී. ඉරණවිල ඇමරිකන් හඬ. නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය වැනි ධීවරයින්ගේ වෘත්තියට බාධා පැමිණ විය හැකි ව්‍යාපෘතිවලදී ඒවාට එරෙහිව ධීවරයින් පෙරට ආ අවස්ථාවලදී සභාව ඔවුන් වෙනුවෙන් පෙනී සිටීම ඊට මෑත කාලයේ හොඳම නිදසුන් ය.**

ඉන්ධන මිළ ඉහළ යාමට එරෙහිව, ඉන්ධන මිළ වැඩි වීමෙන් දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවන ධීවර කාර්මිකයන් නැගී සිටි අතර මීගමුව හා හලාවත ප්‍රදේශවල ධීවරයින්ගේ උද්ඝෝෂණ හා පෙළපාලි වඩාත් දැඩි හා උණුසුම් ස්වරූපයක් ගත්තේ ය. හලාවත වැල්ල ප්‍රදේශයේ උද්ඝෝෂණය පිළිබඳව සැලවූ වහාම හලාවත රදගුරු හිමිපාණන්ගේ උපදෙස් මත වැල්ල මීසම් සේවක ගරු ක්ලෝඩ් ප්‍රනාන්දු පියතුමා ද හලාවත මීසම් සේවක ගරු රොන්කල්ලි ද සිල්වා පියතුමා ද ජනතාව සන්සුන් කිරීමට ඉදිරිපත් වූහ.

එහෙත් අවාසනාවකට මෙන් උද්ඝෝෂකයින් මර්ධනය කිරීමට ආරක්ෂක අංශ විසින් එල්ල කළ වෙඩි ප්‍රහාරයකින් වැල්ල මීසමට අයත් ඇන්ටනි ප්‍රනාන්දු නම් දෙදරු පියකු මරණයට පත්විය. ඒ සමඟ ප්‍රදේශය තුළ ඉතා උණුසුම් වාතාවරනයක් ඇති විය. විශාල කැළඹීමකට හා ලේ හැලීමකට ඉඩ ඇති බව වටහා ගත් රදගුරු හිමිපාණන් කැළඹී සිටි ජනතාව හමු වී තත්ත්වය පාලනය කිරීමට පියවර ගත් අතර පියතුමන්ලා රැසක් ද එයට සහය විය. රදගුරු හිමිපාණන් නොසන්සුන්ව සිටි ධීවරයින් ආසන දෙව්මැඳුර වෙත කැඳවා ඔවුන් ආමන්ත්‍රණය කිරීමත් වැල්ල ජනතාව අතරට ගොස් ඔවුන් ඇමතීමත් තත්ත්වය සමනය කිරීමට බෙහෙවින් උපකාරී විය. මෙය සිදු වූ දිනම සවස ධීවර නියෝජිත පිරිස් හමු වූ රදගුරු හිමිපාණන් ඇතුලු පියතුමන් මෙම අවස්ථාවේ දී ඔවුන් වෙනුවෙන් අවැසි මැදිහත් වීම සිදු කරන බව අවධාරණය කරන ලදි.

සභාවේ මැදිහත්වීම නොවන්නට දරුණු ඛේදවාචකයක් සිදුවීමට ඉඩ තිබූ බව ප්‍රදේශයේ කිතුනු නොකිතුනු සියළු දෙනාගේ අදහසය. එමෙන්ම එය සියල්ලන්ගේ පැසසුමට ලක් විය.

**ලිඩ්වින් කිරිඇල්දෙණිය**

## ම්ලේච්ඡ ඝාතනය ශ්‍රී ලංකා කතෝලික රදගුරු මඬුල්ල හෙලා දකී

ශ්‍රී ලංකාවේ කතෝලික රදගුරු සමුළුවේ මහලේකම් නෝබට් එම්. අන්ද්‍රාදි අනුරාධපුර රදගුරුතුමන්ගේ අත්සනින් නිකුත් කර ඇති සම්පූර්ණ නිවේදනය මෙසේය.

පසුගිය දිනවල තෙල් මිල ඉහළ නංවන අවස්ථාවේ දී පවත්වන්නට යෙදුණු විරෝධතා රැලියකදී සිදු කරන ලද ඩබ්ලිව්. ඇන්ටනි ප්‍රනාන්දු යන තරුණ ධීවර මහතාගේ සාහසික මරණය පිළිබඳව ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව සිය බලවත් කණගාටුව පළ කර සිටියි. එතුමාගේ පවුලට හා ධීවර ජනතාවට සංසිඳිය නොහැකි දරුණු වේදනාවක් හා පාඩුවක් සිදු කරන ලද මෙම අත්තනෝමතික ඝාතනය ඉතා දැඩි ලෙස හෙලා දකින්නෙමු.

බලවත් ශෝකයට පත් එතුමාගේ පවුලේ අයට සහ ධීවර ජනතාවට සිය ඉමහත් සංවේගය පල කරන රදගුරු සමුළුව වේදනාවට පත් සියල්ලන් වෙත දේව කරුණාව අයැද සිටියි.

මිණිය නොහැකි ජීවිත වටිනාකම ඉදිරියේ දී කිසිදු තැකීමකින් තොරව සිදුකරන ලද මෙවැනි ම්ලේච්ඡ ක්‍රියා තවදුරටත් සිදු නොවන්නට වගබලා ගන්නා ලෙස ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව අවධාරණය කරයි.

# හලාවත පදවි ශාසන සේවක මණ්ඩලයේ නිවේදනය

තෙල් මිල ඉහළ දැමීමට විරෝධය පළ කිරීම සඳහා පැවති විරෝධතා ව්‍යාපාරයේ දී මියගිය හලාවත වැල්ල ප්‍රදේශයේ ඇන්ටනි ප්‍රනාන්දු මහතාගේ අභාවය පිළිබඳව හලාවත පදවි ශාසන සේවක මණ්ඩලයේ බලවත් ශෝකය ධීවර ප්‍රජාව වෙත ද ඒ මහතාගේ පවුලේ ඥාතීන් වෙත ද ප්‍රකාශ කරමු.

ධීවර කර්මාන්තයේ යෙදෙමින් දිවිගෙවන අසරණ ධීවර කාර්මිකයන් තෙල් මිළ ඉහළ දැමීම නිසා තමන්ට දරාගැනීමට සිදුව ඇති දුෂ්කරතාවයන් ප්‍රකාශ කිරීම සඳහා ඉදිරිපත් වු විට ඒ සඳහා ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදුවීම කණගාටුදායකය. නිරායුධ උද්ඝෝෂකයන් වෙත උද්ඝෝෂණයන් මැඩ පැවැත්වීමේ දී අනුගමනය කරන අවම බලය යොදවා ක්‍රියා කළ යුතුව තිබිණි. එසේ කළේ නම් මෙවන් ඛේදවාචකයක් වළක්වා ගැනීමට හැකිකමද තිබුණි.

මෙම විරෝධතා ව්‍යාපාරයේ දී මිය ගිය හා තුවාල ලද සිවිල් වැසියන් සිය සාධාරණ දුෂ්කරතාවයන් ප්‍රකාශ කිරීමට කිසිදු බලපෑමකින් තොරව ඉදිරිපත් වූ සාමාන්‍ය ධීවර ජනතාව බව ප්‍රකාශ කරමු. මෙසේ තම ජීවත් වීමේ අයිතිය වෙනුවෙන් පවත්නා බාධා ඉවත් කරන ලෙස ඉල්ලා සිදුකළ සාමකාමී විරෝධතාවය මැඩ පැවැත්වීම සඳහා ගන්නා ලද ප්‍රචණ්ඩකාරී මර්ධන ක්‍රියා පිළිවෙත හෙලා දැකිය යුතුය.

ඇන්ටනි ප්‍රනාන්දු මහතාගේ මරණයෙන් සිත් වේදනාවට පත් ජනතාව සමඟ සිටිමින් ඔවුන් සන්සුන් කරමින් ක්‍රියා කල රදගුරුතුමන් ප්‍රමුඛ මීසම් භාර පියතුමන්ලා සහ පූජක සංඝය වෙත මේ අවස්ථාවේදී පදවි ශාසන සේවක මණ්ඩලයේ ගෞරව පූර්වක ස්තුතිය පළ කරමු.

ධීවර ජනතාවගේ ගැටළු වෙනුවෙන් සභාව ඉදිරිපත් වීම අපි අගය කොට සලකමු.

## කැමිලස්ගේ —— තිත්ත ඇත්ත



## මීසමෙන් මීසමට

# ඔබගේ ජීවිතය තුළින් නියම කිතුනු සාක්ෂි දැරීමක් සිදුවිය

ඔබ දකින අන් අයට ඔබ කිතුනුවකු බව ජීවමානව දර්ශනය විය යුතුයි. කිතුනු ඔබගේ හැංගිච්ච ගතිගුණ ලැජ්ජාව, භය නිසා යටපත්වී ඇත්නම් ඔබ නියම කිතුනුවකු නොවන්නේ යැයි ගොඩැල්ල සා. සෙබස්තයින් මුනි මංගල උලෙළේ සන්ධ්‍යා මෙහෙයේදී හලාවත පදවි භාණ්ඩාගාරික අතිගරු ක්‍රිස්ටි තිසේරා පියතුමා පැවසීය.

එහිදී වැඩිදුරටත් කථාකළ ගරු පියතුමා අප ස්වාමීන් වන ක්‍රිස්තුන් වහන්සේ ගවහලක උත්පත්තියෙ පටන් අවුරුදු තිස්තුනක මුලු ජීවිත කාලය පුරා සාක්ෂි දැරුවාසේ ශුද්ධ වූ සෙබස්තියන් මුනිඳුන්ද අනිත් ප්‍රාණපරිත්‍යාගීන් සැම දෙනාද සිය ජීවිත පූජාවෙන් තමන් තුළ තිබූ කිතුනු කම ප්‍රකාශ කළ බවද, ගෙවී යන සැම තත්පරයක් තුළ ලොවේ කොහේ හෝ ජීවිත පරිත්‍යාගයක් ඔස්සේ කිතුනුකම ප්‍රකාශ වන්නේ යැයි ද පැවසීය.

මීසම් සේවක ගරු මේරියස් ප්‍රනාන්දු පියතුමා මංගල්‍ය කටයුතු සංවිධානය කළ අතර සහායක ගරු නිමන්ත පියතුමාද ඊට සහාය විය.

ඩබ්ලිව් හෙක්ටර් ප්‍රනාන්දු



වත්තල සා. ආනා සමිතිය මගින් නිමල් සපරමාදු පදනමේ සහය ඇතිව ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානයක් නොබෝදා වත්තල සා. ආනා දෙව්මැදුරු පරිශ්‍රයේදී ආරම්භ කරනු ලැබීය. එහිදී වත්තල මීසම් සේවක ගරු රූබන් ලෙස්ලි පියතුමා මුලින්ම ප්‍රතිකාර ලබාගත් අවස්ථාව මෙහි දැක්වේ. සමිතියේ සභාපති මාලින්ග ජයවර්ධන, ලේකම් සුනිල් විසිදාගම ඇතුළු නිළධාරීහුද නිමල් සපරමාදු පදනමේ සභාපතිනි නිර්මලී සපරමාදු මහත්මියද ඡායාරූපයේ වෙති. මෙම ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානයෙන් සතියේ සෑම 2 වන හා 4 වන බ්‍රහස්පතින්දා දිනවල මහජනතාවට ප්‍රතිකාර ලබාගත හැකිය.

නිමල් පෙරේරා

# දේව වචනය කියවීමට දිරියක්!



ක්‍රි.ව. 2012 වසර කොළඹ අගරදගරු වසමේ දේව වචනයේ වසර ලෙස ප්‍රකාශ කිරීම නිමිති කොටගෙන ගම්පහ මීසමට අයත් ගම්පහ, බැන්ඩියමුල්ල සහ ඉඳිගොල්ල සභාවල දේව ජනතාවට දිනපතා දේව වචනය කියවීමට හා මෙනෙහිකිරීමටද එතුළින් ශුද්ධවූ බයිබලය පරිශීලනයට යොමු කිරීමට මඟපෙන්වීමක් වශයෙන් දිනපතා දේව වචනය අඩංගු බයිබල් දිනපොත සහනදායි මිලකට මීසම් ජනතාව අතට පත් කිරීමේ උත්සවයට විශාල පිරිසක් සහභාගි වූ අතර ඒ අතරින් බොහෝ පිරිසක් එම බයිබල් දිනපොත මිලදී ගත්හ.

එම උත්සවයේදී ශුද්ධ වූ වචනයේ උතුම්කම පිළිබඳව ගම්පහ මීසම් සේවක ගරු කිංස්ලි අයිවන් පියතුමා ප්‍රකාශ කළේය. ශු. වචනය අඩංගු බයිබල් දිනපොත දේව ජනතාව වෙත පිරිනැමීමේදි ගරු පියතුමන් විසින් ඒ සඳහා මුලින්ම තෝරා ගන්නා ලද්දේ ගම්පහ මීසමේ වෙසෙන මහරගම පිළිකා රෝහලේ විශේෂඥ වෛද්‍යවරියක වන වෛද්‍ය කාන්ති පෙරේරා සහ ශ්‍රී ලංකන් ගුවන් සේවයේ ගුවන් නියමු නාලක පෙරේරා යන අයවලුන්ය.

බර්නාඩ් මනතුංග

# නිර්මල ජීවිතයකට අප දරුවන් හැඩගැස්සීමට පවුල ඉතා වැදගත් සාධකයක්

## කුරුණෑගල අනුනායක පියතුමා පෙන්නා දෙයි

**සභා ඉතිහාසය තුළ දේවමාතා වහන්සේ 500 වතාවක් දර්ශනයවී මිනිසුන්ගෙන් ඉල්ලා සිටින්නේ පව්කාරයන්ගේ සිත්හැරීම සඳහා යාච්ඤා කරන්න. පශ්චාත්තාපි ක්‍රියා කරන්න. පවුලේ ජපමාලය කියන්න. යහපත් පවුල් පසුබිමක් තුළින් නිර්මල ජීවිතයකට අපේ දරුවන් හැඩගස්වන්නැ කියා යැයි කුරුණෑගල පදවි අනුනායක අතිගරු ඔස්ටින් මාකස් පියතුමා කුරුණෑගල ශාන්ත ආනා ආසන දෙව් මැඳුරේ ලූර්දු දේවමාතා ස්වර්ණ ජයන්ති මංගලෝත්සව සන්ධ්‍යා මෙහෙයේදී ප්‍රකාශ කළේය.**

උන්වහන්සේ වැඩිදුරටත් මෙසේ පැවසූහ. වැඩිහිටි ලොව අනාගත යහපත් පුරවැසියන් ලෙස බාර ගත්න ඉන්න දරු දැරියන්, තරුණ පිරිස නිර්මල ගති පැවතුම් වලින් සන්නද්ධ ගැන්වීම සඳහා පවුල නමැති සාධකය මහත් වූ කාර්යභාරයක් ඉටුකරනවා.

ප්‍රශංසා මෙහෙය හා රෝගීන් ආශිර්වාද කිරීම, දේව මෙහෙය ප්‍රැන්සිස්කාන තෙවැනි නිකායේ ගරු එමසි ප්‍රියශාන්ත සහ සුමේධ දිසානායක පියවරුන්ගේ මෙහෙයවීමෙන් පවත්වන ලදි. නිර්මල ලූර්දු දේවමාතා මංගල්‍යය මහනුවර අම්පිටිය ජාතික දෙව්සත්හලේ අදියුරු අතිගරු එල්මෝ ඩයස් පියතුමාගේ ප්‍රධානත්වයෙන් සහ පූජක පැවදි ගිහි සැදැහැවතුන්සහභාගිත්වයෙන් පැවැත්විය.

50 වැනි නිර්මල ලූර්දු දේවමාතා වහන්සේ මංගල්‍ය පැවැත්වීමට කුරුණෑගල මීසම් සේවක ගරු ජෙරම් පෙරේරා පියතුමාගේ මෙහෙයවීම මත සහායක ගරු ජාමික පියතුමා හා කිතුනු සේවක මණ්ඩලය ඇප කැපවිය.

බී. කේ. ටී. රෙජිනෝල්ඩ්

# බොදුනුවකුගේ බැතිය දෙව්මවුන් වෙත පිරිනැමේ



මග්ගොන මුංහේන පාරේ පදිංචි දේශබන්දු පාලිත හේමසිරි සිල්වා මහතා උපතින් බෞද්ධයකු වුවත්, ඔහු තුළ දේවමාතා වහන්සේ පිළිබඳව එලගැන්වූ විශ්වාසයට සාක්ෂි දැරීමක් ලෙස වේලන්කන්නි මෑණියන්ගේ ප්‍රතිමාවක් මග්ගොන මීසමේ කිතුනු ජනතාව වෙත 2010 වසරේ දී තිළිණ කරන ලදී. තමා බෞද්ධයකු වුවත් සැබෑ විශ්වාසයකින් යුතුව එතුමියට කන්නලව් කළ බැවින්, එතුමියගෙන් ලැබුණු වරප්‍රසාද නිසා. තමාගේ විශ්වාසය දෙව්මව් කෙරෙහි ඇති වූ බව ඒ මහතා පැවසීය.

සෑම වසරකම පෙබරවාරි මස 4 වන දින මෙම ස්ථානයේම වේලන්කන්නි මෑණියන්ගේ මංගල උලෙළ සිදුකිරිමට තමා සහභාගිවන බවත්, ඒ සඳහා සෑම සහයෝගයක්ම ලබා දෙන බවත් හෙතෙම පැවසීය.

මග්ගොන මුංහේන පාරේ, 'ග්ලැඩිස් වත්ත' ඉඩමේ මෙම ප්‍රතිමාව ස්ථාපිත කර වසර දෙකක් පිරිම නිමිත්තෙන්. ශ්‍රී ලංකා අප ස්වාමිදුවගේ මංගල දිනයේදී එම උලෙළ සාර්ථක අන්දමින් පවත්වන ලදී. මග්ගොන මීසම් සේවක ගරු හේමන්ත උදය කුමාර් පෙරේරා පියතුමා හා ප්‍රැන්සිස්කන් නිකායේ, ගරු ජූඩ් අසංක පියතුමාගේ සහභාගිත්වයෙන් පැවැත්වූ දේව මෙහෙයෙන් පසුව වේලන්කන්නි මෑණියන්ගේ ප්‍රතිමාව රැගෙන පෙරහැර යෑමෙන් අවසන් වූ අතර, සැදැහැවතුන් වෙත දානය බෙදා දීමද සිදුවිය. ගරු පියතුමන් සමඟ පාලිත සිල්වා මහතාද සේයාරුවේ දැක්වේ.

ඩී. ඇන්සලම් ප්‍රනාන්දු

# පමුණුගම මඩු මංගල්ලය මාර්තු 15 දා

**පමුණුගම පැරණි මීසම් ජනතාවගේ වාර්ෂික මඩු ජපමාල මාතා මෑණියන්ගේ එකසිය තිස්තුන්වන මංගල්ලය මෙවරද මාර්තු 15 දින පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.**

මන්නාරම් රදගුරු අති උතුම් රායප්පු ජෝශප්, කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ද, පමුණුගම මීසමට සම්බන්ධ සියලු පියතුමන්ගේ සහභාගිත්වයෙන් ද පැවැත්වීමට කටයුතු යොදා ඇත. මාර්තු මස 12 දින සිට 15 දින දක්වා ආගමික කටයුතු සිදු කරන අතර මාර්තු මස 14 දින දවස පුරා දිව්‍ය සත්ප්‍රසාද දෙව්මැඳුරේ දී ගම් වශයෙන් ශු. පැය පැවැත්වේ.

සියලුම මංගල්ල කටයුතු දෙව්මැඳුරු ඉදිරි මණ්ඩපයේදී පැවැත්වේ. දාහතරවනදා දිව්‍ය සත්ප්‍රසාද දිනය නිමිත්තෙන් මණ්ඩපය අවට දිව්‍ය සත්ප්‍රසාද පෙරහැරක් ද ලූර්දු ගුහාව දක්වා ඉටිපහන් පෙරහැරක් ද පැවැත්වේ.

මෙම මංගල්ලයට විශේෂයෙන් පමුණුගම පැරණි මීසමේ උස්වැටකෙයියාව, බෝපිටිය, පමුණුගම, කැපුන්ගොඩ, දුන්ගල්පටිය ජනතාව සහභාගිවෙති. වන්දනා කරුවන්ට අවශ්‍ය පහසුකම් සැලැසීමට සිද්ධස්ථාන පාලක ගරු එමිලියානුපිල්ලේ පියතුමා සමඟ පමුණුගම මාර්තු 15 මඩුවන්දනා කමිටුව සාකච්ඡා කළ බව එහි සභාපති සනි පොන්වීර මහතා ප්‍රකාශ කරයි.

බෙන්ජමින් කිරිහෙට්ටි



බදුල්ල සා. මරියා ආසන දෙව්මැඳුරේ පැවැති 64 වැනි ජාතික නිදහස් දින සමරු මෙහෙයට පෙරාතුව ජාතික ධජය එසවූ අයුරු. මීසම් සේවක ගරු ප්‍රියලාල් කුරේ, සහයක ගරු මාලන් ඇන්තනි පියවරුන් සමඟ කොට්ඨාශ දෙකකින් දමිළ හා සිංහල නියෝජිත දෙදෙනා මෙහි වෙති.

ශ්‍රී කාන්ති ගුණවර්ධන

# මුන්දලම විල්තෙර කල්වාරි පුදබිම




මෙයට ශත වර්ෂයකට පමණ පෙර, මුන්දලම කරදිය විලට මසුන් ඇල්ලීමට ගිය කළපු බටහිර වෙරළේ පදිංචි ධීවරයකු එ කලපුවේ දැල් එලා විඩා නිවා ගැනීමට ගස් සෙවනකට වන් විට පලු ගසක බෙනයක දැවයෙන් කළ ප්‍රතිමාවක් දුටුයේය. ඒ වනාහි "සුදු අශ්වයකු පිට කඩුවක් ද අතැතිව සිටි මිනිස් රුවක්" වු ප්‍රතිමාවකි.

මේ මහා සන්තියාගු මුනි ප්‍රතිමාව ලෙස දැන හඳුනාගැනීමෙන් පසු එය බටහිර වෙරළේ පනු පිටිය දෙසට ගෙනයාමට ඔහු දැරූ උත්සාහයේ දී ඔරුව පෙරළින. දෙවන වරට ගත් උත්සාහයේ දී යළි වරක් ඔරුව පෙරළින. තුන්වන වරට ද එසේම වූයෙන් වටහා ගත් සළකුණු ඔස්සේ එය මුන්දලම් වෙරළට ගෙන ගොස් එහි කළපු ධීවරයන් හා ගම්වාසින් දැනුවත් කර පොල් අතු මඩුවක් තනවා ප්‍රතිමාව එහි තැන්පත් කරන ලද බව කියැවේ. වත්මන් දෙව් මැඳුර ගොඩ නැගුනේ එම ස්ථානයේය.

කල්වාරි යාගික වන්දනාවට සිසිල් වූ ශාන්ත පරිසරයක් මෙහි නිර්මාණය වී ඇත. කඳු මුදුන් - ගිරි කඳු උස් වූ ගල්තලා නොමැතිව නැගුන කල්වාරි පුද බිම තුළ වියපත් වූවනට - ආබාධයන්ගෙන් පෙළෙන අයට - රෝගි අයට සහභාගිවීමට පහසුය. පාදනමස්කාරයේ ආරම්භයේ සිට කුරුසියේ උකුත්වීම දක්වා භාවනා කිරිමට - යැදීමට සුදුසු වටා පිටාවක් නිර්මාණය වී ඇත. මේ සුවිශේෂ පසු බිම තුළ මෙම පුද බිමෙහි ආගමික කියැවීම් දේශනා - භාවනා - දිව්‍ය පූජා යාගයන් සිංහල - දමිළ - ඉංග්‍රීසි භාෂා තුනෙන්ම ලබා ගත හැකිය. පියතුමා නොමැති වන්දනා කණ්ඩායම් සඳහා ගරු පියතුමකුගේ සේවය අවශ්‍යනම් ලබාදීමට හැකියාව ඇත. ගෙවුන වසරේ ලද අත්දැකීම් අනුව පිට පලාත් වලින් පැමිණෙන සැදැහැවතුන්ට අවශ්‍ය පරිදි සිකුරාදා දිනයන් කල්වාරි යාගික මෙහෙයයන් සඳහා වෙන්කර ගත හැක. එම පැමිණීම හා දිනයන් මීසමේ ගරු පියතුමාට දැනුම් දෙන්නේ නම් අවශ්‍ය සහාය ලබා දිය හැකිය.

2012 විල්තෙර කල්වාරි පුදබිම චතාරික මෙහෙයයන් නිමා වන්නේ උත්ථානයේ පාස්කු ඉරුදින පෙරවරුවේ නැවුම් ආසිරි පැන් ඉස මුන්දලම කලපු පරාසය දේවශිර්වාදයෙන් ආසිරි ගැන්වීමෙන්ය. කිතුනු නො කිතුනු සියළු කළපු ධීවරයෝ ගරු මොරිස් ඇන්ඩර්සන් පියතුමා සමඟ විචිත්‍රවත් ඔරු පෙරහැරින් මෙම දියවර ආශිර්වාද මෙහෙයට සහභාගි වීමට සූදානම්ව සිටිති.

ඩැමසස් වර්ණකුල

# චතාරික සමය පශ්චත්තාපයේ සමයයි




*ශුද්ධවූ සභාවේ අතිශය අගනා වූද, වැදගත් වූද, දහම් සමයේ ආරම්භක දිනය අළු බදාදායින් ඇරඹී චතාරික සමයයි. ස්වාමින් වහන්සේගේ දූත මෙහෙවර ආරම්භයේ දී පාළුකරයේදී මුහුණ දුන් පරීක්ෂාවට එරෙහිව ලබාගත් ජයග්‍රහණය විසින් "සත්‍යයද, ජීවනය ද මාර්ගය ද මම වෙමි" යි පැවසූ ඔවුන් වහන්සේ තුළ නව ජීවයක් දරමින් අප පාපයෙන් මුදාලන අනුග්‍රහය සඳහා අපගේ ජීවිත දුර්වලකම් පිළිගෙන ජීවිතයේ සැබෑ වෙනසක් අත් දකින්නට ඔවුන් වහන්සේ අපට ආරාධනා කරනු ලබයි. උපවාසයෙන් ද, වැළපීමෙන් ද, මුළු සිතින් දැන්වත් මා වෙත හැරී එන්න. "වත ඉරාගෙන නොව සිත ඉරාගෙන නුඹේ දෙවි සමිඳුන් වෙත හැරී එන්න." (ජොවෙල් 2:12-13)*

අළු බදාදා සිට ගොබ් ඉරිදා දක්වා දින 40 තුළ, ස්වාමින් වහන්සේගේ පාළුකර ජීවිතයට පිවිසීමත්, ගොබ් ඉරිදා සිට පාස්කු ඉරිදා දක්වා ශුද්ධවූ සතියට පිවිසීමත් කිතුනු අපට වැදගත් කාල පරිච්ඡේදයකි.

අළු බදාදා මිනිසාගේ මරණය ගැන මෙනෙහි කරයි. දේව මෙහෙයන් හිදී පූජාප්‍රසාදිතුමා අපගේ නළල මත අළු තැවරීමෙන් සිහිපත් කරන්නේ "දූවිල්ලෙන් වූ නුඹ දූවිල්ලටම යන්නෙහිය" යන්නයි. (උත්. 3:19) කොතරම් උසස් මිනිසකුට වුවද මරණින් වැළකිය නොහැකිය. ඔහුද මිය යන තිරිසනුන් හා සමානය. (ගීතාවලිය 49:20)

"මනුෂ්‍යා කවරෙක් ද? ඔහුගේ පරමාර්ථය කුමක් ද? ඔහුගේ යහපත කුමක් ද? අයහපත කුමක් ද? මිනිසාට නියමිත දවස් ගණන කොතෙක් ද? ඉතා වැඩි වුණොත් අවුරුදු සීයකි. මේ අවුරුදු ස්වල්පය සදාකාලය හා සසඳා බැලුවොත් මුහුදෙන් ගත් දිය බිඳක් වෙති. වැලි ඇටයක් වෙති. එහෙත් සමිඳාණෝ ඔවුන් දැක ඉවසිලිමත් වන සේක. ඔවුන්ගේ අවසානය කොපමණ දුඃඛිත දැයි උන්වහන්සේ දකිනා සේක" (උපදේශකයා හෙවත් සිරාක් 18:8-12).

එබැවින් සමිඳුන් වෙත හැරී ඔබේ පව් අත්හරින්න. උන්වහන්සේ ඉදිරියෙහි උදක් ඉල්ලා පව් කිරීමෙන් වළකින්න. මහෝත්තමයාණන් වෙත ආපසු එන්න. අදමිටුකමින් වැළකෙන්න. දුෂ්ටකම අතිශයින් පිළිකුල් කරන්න. (උපදේශකයා හෙවත් සිරාක් 17:29)

සමිඳුන්ගේ දයාව කොපමණ මහත් ද? උන්වහන්සේ වෙත හැරෙන්නන් උදෙසා එතුමන්ගේ සමාව කොපමණ විශාල ද? (උපදේශකයා හෙවත් සිරාක් 17:29). අතීතයේ දී උන්වහන්සේ පව්කාර ස්ත්‍රියකට සමාව දුන් ආකාරය ශුද්ධ ලියවිල්ලේ සඳහන් වේ.

අතීතය දෙස අපගේ නෙත් සිත් යොමු කරමින් ආදියේ දී ස්වකීය පාපිෂ්ඨ ජීවිතය හේතු කොටගෙන එක්තරා ජුදා ස්ත්‍රියක් නායිම් නුවර අසළ ප්‍රදේශයේ ජීවත් විය. ඇයගේ නම මරියාය. එහෙත් වැව අද්දර පිහිටි ශෝභනවූ මග්දලා නුවර වාසය කිරීම හේතුකොටගෙන මග්දලාහි මරියා නොහොත් මරිය මදලේනා නමින් ප්‍රකට විය.

මරිය මදලේනා බරපතල පව්කාර ස්ත්‍රියක් විය. පරිසිවරු මේ ස්ත්‍රිය ස්වාමින් වහන්සේ වෙත රැගෙන විත්, ගුරුදේවයෙනි, මේ ස්ත්‍රිය කාමමිථ්‍යාචාරයෙහි යෙදී සිටියදීම අල්ලාගන්නා ලද්දීය. මෙබඳු අය ගල් ගසා මරා දමන්නට මෝසෙස් විසින් ව්‍යවස්ථාවෙහි අපට අණ කර ඇත. එහෙත් මැය ගැන ඔබ කියන්නේ කුමක්දැයි උන්වහන්සේගෙන් ඇසූහ. ඔවුන් මෙසේ ඇසුවේ උන්වහන්සේ පරීක්ෂාකර උන්වහන්සේට වරද තබන්නට කරුණක් සොයාගන්නා අටියෙනි. එහෙත් උන්වහන්සේ නැමී සිය ඇඟිල්ලෙන් බිම ලියූ සේක. ඔව්හු උන්වහන්සේගෙ න් දිගින් දිගටම ප්‍රශ්න කරද්දි, උන්වහන්සේ කෙළින් සිට ඔවුන් අමතා ඔබ අතරින් පවක් නැති තැනැත්තා පළමුකොට ඇට ගලක් ගසන්නැයි වදාරා නැවතත් නැමී සිය ඇඟිල්ලෙන් බිම ලියූ සේක. (ශු. ජොහාන් 8:4-8).

එක් දිනක් මරිය මදලේනා යක්ෂයා විසින් පීඩා කරනු ලැබ ජේසුස් ස්වාමින් වහන්සේ අවට සිටි සෙනඟ අතරට පැමිණි සේක. උන්වහන්සේ දුටු විගසම ඇයගේ හෘදය සම්පූර්ණයෙන් වෙනස් විය. ඇයට ආවේශ වූ යක්ෂයන් හත්දෙනාම පලා ගියහ. ඇයගේ හෘදයේ ඉතිරිවූයේ ප්‍රාණවත් වූද, ගැඹුරු වූද පශ්චත්තාපයක් පමණි. ඒ මොහොතේ පටන් ඕ තම කෘතඥතාවය ස්වාමින් වහන්සේට පෙන්වා තම පාපවලට ක්ෂමාව ලබා ගැනීම පිණිස ස්වාමින් වහන්සේගේ පාමුල වැඳ වැටෙන්නට ඉමහත් ආශාවෙන් යුක්තව සිටියහ. ඈ උන්වහන්සේ පිටුපස පා මුල සිට හඬ හඬා උන්වහන්සේගේ පාද කඳුලෙන් තෙමන්ට පටන්ගෙන ඇගේ හිස කේ වලින් පිස දමා උන්වහන්සේගේ පාද සිඹ, සුවඳ විලේපයෙන් ආලේප කළාය. එහෙත් උන්වහන්සේ ඔබේ ශ්‍රද්ධාව ඔබට ගැළවීම ගෙන දුන්නේය. ශාන්ත සිතින් යන්නැයි වදාළ සේක (ලූක් 7:50).

## ධර්ම සංග්‍රහය

අද සමාජයේ ජීවත්වන මරිය මදලේනාගේ චරිත නිරූපණය කරන අසාධාරණය, අයුක්තිය ඉටුකරන සැමට ස්වාමින් වහන්සේ සමාව දීමට සූදානම්ව සිටියි. උන්වහන්සේගේ දුක් විඳීම, මරණය, උත්ථානය සමරන්නාවූ මේ චතාරික කාලයේ ඔවුන් වහන්සේ විඳි ඒ අත්දැකීමට ගැඹුරින් අනැතුළු වීමටත්, ගැඹුරු භක්ති අභ්‍යාසයන් තුළින් මෙම ප්‍රසාද ජනක කාලය තුළ දේව වරප්‍රසාදයන් අප පවුල් තුළට බහුලව ලබා ගැනීමට අධිෂ්ඨාන කරමු.

✍ මයිකල් සෙබස්තියන්
රන්පොකුණගම

# වත ඉරාගෙන නොව සිත ඉරාගෙන නුඹේ දෙවි සමිඳුන් වෙත හැරී එන්න

පාස්කු ඉරුදිනට දින 40 ට පෙර උදාවන දිනය අළු බදාදා ලෙස අපි හඳුන්වමු. මෙදින අළු බදාදා ලෙස නම් කිරීට හේතුව එදින චතාරික සමය ආරම්භය සංකේතවත් කරමින් දේව ජනතාවගේ නළලෙහි අළු තවරා කුරුසියේ ලකුණ සටහන් කරයි. මෙම අළු තැවරීමේ සභා ක්‍රියාවලියෙන් උත්පත්ති පොතේ සඳහන් පරිදි මිනිසා දූවිල්ලෙන් සෑදුණු බව මතක් කර දෙන අතර, මරණයෙන් පසු නැවතත් දූවිල්ලට හැරෙන බවද සාන්ත සභාව අපට සිහිගන්වයි. එබැවින් මෙය අපගේ පව්කාර බව පිළිගෙන දේව තාත්තා වෙතට හැරී ඒමට කරන ආරාධනයයි.

පුරාණ ගිවිසුමේ ඉශ්රායෙල් ජනතාව අතර ද අළු තැවරීමේ හා ගෝනි රෙදි ඇඳ ගැනීමේ, පසුතැවීමේ චාරිත්‍රය පැවතුණි. ඔවුන් මෙසේ කිරීමෙන් දෙවිඳුන් කෙරෙහි වූ යටහත් පහත් බව, මිනිසා දිනක මරණයට යටත් වන බව සහ පාපි ස්වභාවය පිළිගෙන මනස්ථාපනය වීම අර්ථ ගැන්වීය. එබැවින් අළු යනු පසුතැවීමේ සලකුණකි. එමෙන්ම චතාරිකය යනු සූදානම් වීමේ කාලය හෙවත් පශ්චාත්තාපයේ සමය වන අතර මෙම සූදානම් වීමේ කාලයට ඇතුළු වීම සඳහා ඇති දොරටුව වන්නේ අළු බදාදා ය. පුරාණ ගිවිසුමේ දී ද දෙ.ව. ඊශ්‍රායෙල් ජනතාවට නොයෙක් විට දිවැසිවරුන් හරහා පසුතැවීමට වරින් වර ඇරයුම් කරමින් තෝරාගත් ජනතාව සූදානම් කළ සේක (ජොවෙල් 2:1-2). දෙවියන් වහන්සේ තම තෝරාගනත් ජනතාවට ජෝවෙල් දිවැසිවරයා තුළින් මනස්ථාපයකට ඇරයුම් කරයි.

උපවාසයෙන් ද වැළපීමෙන් ද, මුළු සිතින් දැන්වත් මා වෙත හැරී එන්න" (ජොවෙල් 2:12).

සැබෑ ලෙස මනස්ථාපනය වූ ඊශ්‍රායෙල් ජනතාවට දෙවියන් වහන්සේ එවා වදාළේ "... අළු වෙනුවට මල් මාලා ද දුක් කඳුළු වෙනුවට ප්‍රීතිය නැමැති තෛලය ද, කලකිරී සිටින්නන්ට පැසසුම් නැමැති වස්ත්‍රය ද ප්‍රදානය කරන බවයි. (යෙසායා 61:3).

සමිඳාණන් වහන්සේ මනස්ථාපනය පිණිස ඊශ්‍රායෙල් ජනතාවට බාහිර සළකුණු ලබා දුන්නේ ඔවුන් තුළ පූර්ණ සිත් හැරීමක් සඳහා ය. නමුත් මේ ජනතාව එය බාහිර සළකුණු හා සම්ප්‍රදායට පමණක් සීමා කොට, ඇතුළාන්ත වෙනසකට යොමු නොවීය. එබැවින් ගෝනි රෙදි හැඳ අළු තවරා කරනු ලැබූ උපවාස දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කරන සේක.

.... සාගින්නෙන් පෙළෙන අය සමඟ ආහාර බෙදා ගැනීමට ද ගේ දොර නැති අසරණයන් ඔබේ ගෙදරට කැඳවීම ද, ඇඳුම් නැති අය දුටු විට ඇඳුම් සපයා දීම ද සැබෑ මිතුරන් මග නොහැර යුතුකම් ඉටු කිරීම ද නියම උපවාසය වේ. (යෙසායා 58:3-8)

අප උදෙසා මනුකය ගෙන උපත ලබා දුක් විඳ මරණයට පත්වී උත්ථාන වී එම උත්ථානයේ උරුම වූ ගැළවීමේ සැබෑ හිමිකරුවන් වනු සඳහා අළු බදාදා සහ ඉන් ඇර වෙන සූදානම් කාලය තුළ නව ගිවිසුමේ ජනතාව වන අපි එදා ඊශ්‍රායෙල් ජනතාව මෙන්, විවිධ වූ ආධ්‍යාත්මික ක්‍රියාවන්හි නිරත වෙමු. ඉශ්රායෙල් ජනතාවට සැබෑ උපවාසයක් කළ යුත්තේ කෙසේ ද යන්න පෙන්වා දුන්නා සේ ශු. මතෙව් තුමා තමාගේ සුවිශේෂයේ සැබෑ සිත් හැරීමක් පිණිස සැබෑ මනස්ථාපයක් කළ යුත්තේ කෙසේ ද යන්න ක්‍රිස්තුස් වහන්සේ අපට පෙන්වා දෙයි. (මතෙව් 6:1-17). එබැවින් අපගේ නළලත මත තවරණ අළු වලට පමණක් අපගේ පසුතැවිල්ල සීමා නොකොට සැබෑ ජීවිත වෙනසක් කරා ගමන් කිරීම අප සතු වගකීමකි.

මේ අයුරින් අළු බදාදා දින මෙනෙහි කරන පණිවුඩය මුළු ශු. බයිබලයේ ම සාරංශය වේ.

✍ ගරු ප්‍රසන්න දිල්රුක් සොයුරු
ජාතික දෙව්සත්හල

☛ 15 පිටුවට



සභා පියවරු 27 කොටස

මහාචාර්ය ඇන්ටන් මීමන විසිනි

# ස්මිර්නාහී පොලිකාප් තුමා

**ස්මිර්නා හී රදගුරුතුමා ලෙස ප්‍රාණ පරිත්‍යාගවරයෙක් බවට පත්වන විට, පොලිකාප් තුමා කිතුනුවකු ලෙස අවුරුදු 86 ක් ජීවත් වී තිබූ බව ප්‍රකාශ කර තිබුණි. එතුමාගේ ප්‍රාණ පරිත්‍යාගවර භාවය සිදුවූයේ ක්‍රි.ව. 155 දී හෝ 156 දී අප නිශ්චිත වශයෙන්ම දනිමු. ඒ අනුව එතුමා ඉපදී ඇත්තේ ක්‍රි.ව. 69 දී හෝ 70 දී බව අපට නිගමනය කළ හැකිය.**

එතුමාගේ තරුණ කාලයේ දී එතුමා ශාන්ත ජුවාම් අපෝස්තුළුවරයාගේ ශ්‍රාවකයෙක් වී සිටි බව අපි නිශ්චිත ලෙසම දනිමු. එව්සේබියස් නම් සභා ඉතිහාසඥයාට අනුව පොලිකාප් තුමාව ස්මිර්නාහි රදගුරුතුමා ලෙස ජුවාම් අපෝස්තුළුවරයා විසින් පත් කරන ලදී.

රෝමානු අධිරාජ්‍යයාගේ පීඩන සමයේ දී මෙතුමා ප්‍රාණ පරිත්‍යාග වරයෙක් බවට පත්විය. ශාන්ත එව්සේබියස් තුමා පවසන ආකාරයට පොලිකාප් තුමා ප්‍රාණපරිත්‍යාගවර-යෙක් බවට පත් වී ඇත්තේ මාකස් අවුරේලියස් නමැති අධිරාජ්‍යයාගේ පාලන සමයේ දී ය. අධිරාජ්‍යයාගේ අභිලාෂයන්ට හිස නොනැමීම හේතුවෙන් මරණ දණ්ඩනයට නියම වූ මෙතුමා තම මරණ මංචකයේ දි මෙසේ පවසා ඇත. "මම අවුරුදු 86 ක් උන්වහන්සේට සේවය කර ඇත්තෙමි."

එතුමා තව දුරටත් කතා කරමින් මෙසේ ද පවසා ඇත. "ඔබගේ කැමැත්ත ඉටු කිරීම සඳහා මා කෙසේ මාගේ රජිඳුන් සහ ගැලවුම්කරුවාණන් හට අවමාන කරන්නද?" පසුව කණුවක බඳින ලදුව ගිනි තබා මරණයට පත් කරවීමට සැළසුම් කර තිබුණ ද පිළිස්සීම හේතුකොට ගෙන පොලිකාප් තුමා මරණයට පත් නොවීම නිසා කෝපයට පත් හේවායන් එතුමා හට කඩුවෙන් ඇණ මරා දැමූහ.

පොලිකාප් තුමා රෝමානු කතෝලික සභාවේ පමණක් නොව පෙරදිග ඕර්තඩොක්ස් සභාවේ ද, අපරදිග ඕර්තඩොක්ස් සභාවේ ද, ඇන්ග්ලිකානු සභාවේ ද සහ ලුතරන් සභාවේ ද ශාන්තුවරයකු ලෙස පිළිගනු ලබයි. මෙතුමාගේ මංගල්‍යය පෙබරවාරි මස 23 වෙනිදාට යෙදී ඇත.

ශාන්ත අයිරේනියස් තුමාගේ වාර්තාවන්ට අනුව ශාන්ත පොලිකාප් තුමා තම මිත්‍ර රෝමයේ බිෂොප්වරයා වූ ඇනිසීටස් තුමා මුණ ගැසීම සඳහා ක්‍රි.ව. 150 - 160 අතර රෝමයට ගිය බව සඳහන් වේ. මෙම ගමන සඳහා විශේෂයෙන් හේතුව ලෙස අයිරේනියස් තුමා සඳහන් කරන්නේ, එවකට ආසියානු සභාව සහ රෝමයේ සභාව අතර පැවති වෙනස්කම් සාකච්ඡා කිරීම සඳහා රෝමයට ගිය බවයි. මෙහි දී පාස්කු උත්සවය පැවැත්විය යුතු කාලය පිළිබඳව සාකච්ඡා කර ඇත.

පොලිකාප් තුමා ජීවත් වූ ආසියානු සභාව පාස්කු උත්සවය සමරන ලද්දේ නිසාන් මස 14 වන දිනදී ය. එය ජුදා සම්ප්‍රදායය අනුගමනය කිරීමක් ය. ඒ අනුව තම ප්‍රදේශයේ සම්ප්‍රදායයන්ට අනුකූලව පාස්කුව සැමරීමට ඔවුන් තීරණය කරන්නට ඇති බව ශාන්ත අයිරේනියස් තුමාගේ වාර්තා පවසයි.

අපෝස්තලික සභා පියවරුන් අතර ඉතා වැදගත් පුද්ගලයකු ලෙස පොලිකාප් තුමාව හඳුන්වනු ලැබුවද එතුමා පිළිබඳව සාකච්ඡා කර ඇත.

පොලිකාප් තුමා ජීවත් වූ ආසියානු සභාව පාස්කු උත්සවය සමරන ලද්දේ නිසාන් මස 14 වන දින දී ය. එය ජුදා සම්ප්‍රදායය අනුග මනය කිරීමක් ය. ඒ අනුව තම ප්‍රදේශයේ සම්ප්‍රදායයන්ට අනුකූලව පාස්කුව සැමරීමට ඔවුන් තීරණය කරන්නට ඇති බව ශාන්ත අයිරේනියස් තුමාගේ වාර්තා පවසයි. අපෝස්තලික සභා පියවරුන් අතර ඉතා වැදගත් පුද්ගලයකු ලෙස පොලිකාප් තුමාව හඳුන්වනු ලැබූවද එතුමා පිළිබඳව අපට ලැබී ඇති ඓතිහාසික තොරතුරු ඉතා සීමිතය. එම නිසා එතුමාගේ කුඩා කාලය හෝ දෙමාපියන් පිළිබඳව වැඩි යමක් කීම අපහසුය.

පොලිකාප් තුමා සහ අන්තියෝකියේ ඉග්නාසියුස් තුමා අතර මිත්‍රත්වය, මාර්සියොන් නම් දුර්මතධාරියා මුණ ගැසීම සහ පොලිකාප් තුමා වේද සාක්ෂිකරුවකු ලෙස ජීවිතය පරිත්‍යාග කිරීම ගැන තොරතුරු මූලාශ්‍ර කිහිපයකින් සොයා ගෙන ඇත. එතුමාගේ මරණය සම්බන්ධයෙන් වාර්තා වූයේ එතුමා මිය ගොස් පළමු වසර ගතවීමටත් පෙරය. එම තොරතුරු වාර්තා කර ඇත්තේ එතුමාගේම සභාවේ සාමාජිකයකු විසිනි.

පොලිකාප් තුමන් විසින් ලියන ලද ලිපි වලින් පැහැදිලි වන්නේ එතුමාගේ දේව ධර්මය පිළිබඳ අදහස් බොහෝ දුරට එතුමාගේ මිත්‍ර ඉග්නාසියුස් තුමා හා ගැලපී ඇති බවයි. ශුභාරංචි හතරේ වාර්තා වන කරුණු වලට මෙම අදහස් කිට්ටු සම්බන්ධතාවයක් දක්වයි. එතුමාගේ දේව ධර්මයේ සහ විමුක්ති මාර්ග යේ කේන්ද්‍රස්ථානය ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ය. "පොලිකාප් තුමාගේ ජීවිත පරිත්‍යාගය" නම් ග්‍රන්ථයේ වැදගත්කම රඳා පවතින්නේ එය මුල්කාලීන කතෝලික සභාව ගැන ඉතා වටිනා තොරතුරු සමූහයක් සපයන නිසාය.

ලබන සතියට ...

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්

(පසුගිය සතිය හා සබැඳේ)

**සවන් දුන්නොත් යහපත:**
දෙවිඳු වදනට සවන් දීම සැබෑ ඇදැහිලිවන්තයකුගේ හැසිරීමේ විශේෂ ගුණාංග යකි. දේව වචනයට සවන් දීම තුළින් දේවාශිර්වාද ඇදැහිලිවන්තයාට ද ඔහුගේ පරපුරට ද ගලා යන බව ශුද්ධ ලියවිල්ල නිතර සඳහන් කරයි (එපීස 4:40, 6:6).

**සිත් දැඩි කර නොගන්න.**
මෙය ප්‍රබල ආකල්ප වෙනසක් සඳහා වන දිවැසි ඔවදනකි. **මස්සා සහ මෙරිබා** යන ස්ථාන දෙකෙහි දී දේව ජනතාව දෙවියන් වහන්සේගේ මඟ පෙන්වීම නොතකා මැසිවිලි නැඟූ අන්දම ශු. බයිබලීය සම්ප්‍රදායන්හි අවධාරණාත්මකව දැක්වේ (නික්ම 17:1-17, ගීතා 78:4, ද්වි. නීති 6:16). ඉන් පෙන්නුම් කෙරෙන්නේ දෙවියන් වහන්සේගේ ගැළවීමදායක ක්‍රියාවලියට අනුකූලතාව දැක්වීම සඳහා ඔවුන් තවමත් ඇතුළාන්තයෙන් සූදානම්ව නැති බවයි.
**සතළිස් වසරක් පාළුකරයෙහි** දිගු ගමන දේව ජනතාවගේ ආධ්‍යාත්මක ජීවිතයේ තීරණාත්මක අවධියක් විණි. එය විශ්වාසයේ අභියෝගයන් පිරි ගැඹුරු අත්දැකීමක් විණි. එය තුළින් ලද ආධ්‍යාත්මික පරිණාමය පොරොන්දු දේශය සඳහා පිවිසීමට හොඳම පසුබිම වුණි. එම ජීවිත පරිත්‍යාගයෙන් පිවිසීමට හොඳම පසුබිම වුණි. එම ජීවිත පරිණාමයෙන් පසුව දේව ජනතාවගේ නව පරපුර නව පැවැත්මකට මුල පිරූහ. ගීතාවලිය 95 වැනි ගීතිකාව අපට ඇරියුම් කරන්නේ සාවද්‍ය ආකල්ප වෙනස් කරගෙන, දෙවි සමිඳුන් සහ දේව ජනතාව සමඟ නව සම්බන්ධතා පැවැත්මකට පිවිසීමටයි.

**යැදුම :**
දෙවි සමිඳාණන් වහන්ස, මේ දවස උදාවේ දී අපි ඔබවහන්සේ වෙත බැති සිතින් ද, සෙනෙහසින් ද තුති පැසසුම් පුද කරමු. මේ විශ්වය තුළ ඔබවහන්සේගේ අභිමතය පරිදි ජීවිත වර්ධනය ඇති කර ගැනීමට අපට වරම් දුන මැනව. සැබෑ ආකල්ප වෙනසක් තුළින් දෙව් මිනිස් සබඳතා ගොඩ නගාගෙන ප්‍රේමයේ සහ සේවයේ ජීවිතයකට පිවිසීමට වරම් දුන මැනව. ආමෙන්.

## පළමු සතිය ඉරුදින උදා යාම යැදුම

### 63 වැනි ගීතය

මෙම ගීතය "විශ්වාසයේ ගීත" කාණ්ඩයට අයත් වන්නකි. හැඟීම් ප්‍රබලව ප්‍රකාශ කරන භාෂා ශෛලියකින් විශ්වාසයේ ආකල්පය මෙම ගීය තුළින් විදහා දැක්වේ. සතුරු හෝ වෙනත් පීඩාවකට ලක් වූ ඇදහිලිවන්තයෙක් දෙව්මැඳුරේ දෙවි සමිඳුන් අභියස සිටිමින් උන්වහන්සේගේ රැකවරණය පතයි. අනාගතයේ දී දෙවි සමිඳානන් වහන්සේ සතුරු බලවේග පරදවාලීම නිසා උදාවන සාමයේ හා සංහිඳියාවේ බලාපොරොත්තුව ඔහු තුළ ජනිතව ඇත. දෙවියන් වහන්සේගේ යහපත්කම සියලු බාධක අභිබවා නැගී සිටීමේ යථාර්ථය ඔහුගේ ඇදහිල්ලේ පදනම වන්නේ ය. දෙවියන් වහන්සේ හා ඇදහිලිවන්තයා අතර සබැඳියාව ප්‍රබලව මෙම ගීතය තුළින් ඉස්මතු වන්නේ ය.

**ලේඛන සැලැස්ම**
★ වගන්ති 1-3 : දෙවි සමිඳාණන් අමතමින් උන්වහන්සේ ප්‍රශංසා කිරීමට ඇති ආශාව.
★ වගන්ති 4 -8 : දෙවි සමිඳුන් වෙත කෘතඥතාව දැක්වීමට හේතු
★ වගන්ති 9 - 10 : සතුරන්ට හිමිවන විපාක
★ වගන්ති 11 : රජුට හා සැදැහැවතුනට ආසිරි පැතීම

**විග්‍රහය සහ අරුත**
(අ) වගන්ති 1 - 3
මෙම මුල් කොටස තුළ ඇදහිලිවන්තයා දෙව්මැඳුර තුළ සිටිමින් තම ජීවිතයේ ඇතුළාන්තයේ දෙවි සමිඳාණන්ට විවෘත කරන අන්දම විස්තර වේ. එය දෙවිඳු අත්දැකීම පිළිබඳ ගැඹුරු ආශාවකි.
**මාහද පිපාසයෙන් පෙළෙන්නේය** : මින් දැක්වෙන්නේ ඇදහිලිවන්තයා දෙවි සමිඳාණන් හමුවන්නට දක්වන ගැඹුරු ආශාවයි. "හදවත" හා "සිරුර" යන ද්විත්ව පැති මනුෂ්‍යයකුගේ ඇතුළාන්ත හා බාහිර ප්‍රතිචාරයක් සංක්ෂිප්ත කොට පෙන්වයි (ගීතා 16:9-10). **වියළිබිම** මෙහි දී ප්‍රබල රූපකයක් ලෙස ඇදහිලිවන්තයාගේ යැදුමෙහි ඇති දැඩි ප්‍රාර්ථනය මතු කොට දක්වන්නේ ය. (ගීතා 143:6).
**මහිමාලංකාරය** : දෙවියන් වහන්සේගේ ස්වභාවය විස්තර කිරීමට හෙබ්‍රෙව් බසින් "කබෝද්" යන පදයද යෙදෙයි. ඉන් දැක්වෙන්නේ මහත් ප්‍රබල ක්‍රියා තුළින් අනාවරණය වන දෙවියන් වහන්සේගේ වැඩ සිටීමයි.

**(ආ) වගන්ති 4-8**
ඇදහිලිවන්තයා තම විශ්වාසයේ දැක්ම තුළින් දෙවියන් වහන්සේගේ සරණය පිළිබඳ අත්දැකීමක් ලබා ඇත්තේ ය. එය ප්‍රශංසාව තුළ වඩාත් දෙවි සමිඳුන් වෙත සිත යොමන්නට ඔහු හට දිරිය දෙන්නේ ය.
**මුළු ජීවිතයේ දී ම ප්‍රශංසා කරන්නෙමි :**
දෙවියන් වහන්සේගේ වරප්‍රසාදයේ බලය නිසා ඇදහිලිවන්තයාගේ ජීවිතය තුළ පරිණාමයක් උදාවන්නේ ය. දෙවි සමිඳුන්ගේ ආදරය සියලු මෙලොව සියලු වටිනාකම් ඉක්මවා යයි (ව. 3). එම ආධ්‍යාත්මික ප්‍රබෝධය ඔහුගේ හදවත පැසසුමෙන් පුරවා ඇත.
**දෑත නගන්නෙමි :**
යාච්ඤාවක ජ්වලිතභාවය බොහෝ විට ශාරීරික ඉරියව් තුළින් පෙන්නුම් කෙරේ. (ගීතා 28:2, යෙසායා 1:15). තවද නොකඩවා යාච්ඤාවේ නිරත වීමට ඇති ලැදියාව රෑ යාම වලදී යන යෙදුමෙන් පැහැදිලි වේ. (ගීතා 6:7).

**(ඇ) වගන්ති 9 - 10**
මේ කොටස තුළ දෙවියන් වහන්සේ බලය සහ යහපත්කම ඉදිරියේ සතුරන්ට උරුමවන දෛවය ප්‍රබලව විස්තර වන්නේ ය.

**මා සනසනු වස් :**
සතුරු බලවේග හමුවේ ඇදහිලිවන්තය, අත්දුටුවේ තම ජීවිතයට තර්ජනයක් බව පැහැදිලි වේ. (ගීතා 35:4).

**රජතෙම :**
මේ යෙදුම තුළින් මේ යාච්ඤාව ජෙරුසලමේ සිටි රජ කෙනෙකුගේ විය හැකි යැයි උපකල්පනය කළ හැකිය. සාම්ප්‍රදායික ගීතය නම් කොට ඇත්තේ දාවිත් රජයේ ගීයක් ලෙසිනි. රජ සහ සැදැහැවත් ජනතාව දෙවිඳු ආසිරි ලැබීමට වරම් ලැබීම මෙම ගීතයේ අරමුණයි.

**යැදුම :**
දෙවි සමිඳාණන් වහන්ස, ජීවිතයේ විවිධ සිදුවීම් මැද අපි ඔබවහන්සේගේ අබියස විශ්වාසයෙන් පසුවන්නෙමු. ඔබගේ රැකවරණය, ශක්තිය හා සෙනෙහස නිරතුරු අත්දැකීමට අපට පිහිට වුව මැනව. බාධක, කම්කටොළු හමුවේ ඔබ කෙරෙහි විශ්වාසය තබා ජීවිතයට මුහුණ දීම සඳහා අප ආසිරි ගැන්වුව මැනව.

**ලබන සතියට ....**



ශුද්ධ ලියැවිලි වසර
**(04)**
**ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා**

## 2012 දේව වචනයේ වසර - චතාරික සමයේ පළමුවැනි ඉරුදින

**තේමාව - මනස්ථාපනය හා දැහැමි ජීවිතය මනුෂ්‍යයාගේ යහපත් අපේක්ෂාවන් පලදැරීමට හේතුකාරක වේ.**

**පළමුවන කියවීම : උත්පත්ති 9:8-15**

දැහැමි ජීවිතයක් ගත කළ නෝවා හා ඔහුගේ පුත්‍රයෝ විනාශයෙන් ගැළවුනාහ. ජලගැල්මෙන් පසු දෙවියන් වහන්සේ නැවත මනුෂ්‍ය සංහතිය හා මැවිල්ල විනාශයට පත් නොකරන බවට නෝවා හා මුලු මැවිල්ල සමඟ ගිවිසුමක් කරන සේක. දේව කරුණාව සංකේතවත් කළ දේදුන්න ගිවිසුමේ ලකුණ විය. පැරණි මැද පෙරදිග වැසියන් හට දේදුන්න සංකේතවත් කළේ විනාශකාරී වැහි කුණාටුව හමාර වී ඇති බවයි. එම නිසා එය නව බලාපොරොත්තු සමුදායක සංකේතයක් ද විය. මෙයින් ඉදිරිපත් කෙරෙන පණිවුඩය වන්නේ දැහැමියා වෙත දෙවියන් වහන්සේගේ කෙළවරක් නොමැති කරුණාවයි.

**දෙවන කියවීම : 1 පේදුරු 3:18-22**
ජලගැල්මෙන් පාපිෂ්ඨයන් හට වූ විනාශය පදනම් කරගනිමින් පේදුරු තුමා පවසන්නේ ප්‍රසාද ස්නාපනයේ ජීවන ජලය මනස්ථාපනයේ



මෙන්ම ජේසුස් වහන්සේගේ මරණය හේතුකොටගෙන අපට අත්වූ ගැලවීමේ සංකේතයක් බවයි. පාපය නිසා ඇති වූ විනාශය ගෙනදුන් ජලගැල්මේ ජලයත්, ප්‍රසාද ස්නාපනයේ ජීවනදායක ජලයත් සංසන්දනය කරමින් එතුමා දැහැමි ජීවිතයක් ගත කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරයි.

**ශුභාරංචිය : මාක් 1:12-15**

ස්නාවක ජොහාන් තුමාගේ මරණයෙන් පසු නව යුගයක් ආරම්භ කරමින් ජේසුස් වහන්සේ ශුභාරංචිය දේශනා කිරීම අරඹන්නේ මනස්ථාපනය වීමේ අත්‍යවශ්‍යතාවය අවධාරණය කරමින් ය. මනස්ථාපනය යනු වැරදි මාර්ගයෙන් නිවැරදි මාර්ගයට පිවිසෙමින් ක්‍රිස්තු ඉගැන්වීම හා ආකල්ප අනුව ජීවිතය ඉදිරියට ගෙන යාමයි. එය ශුභාරංචිය පිළිගැනීමටත් එය ජීවත් කරවීමටත් ඇති අනිවාර්ය කොන්දේසියකි.

සතියේ මෙනෙහි කිරීම

**මෙනෙහි කිරීම**

දැහැමි ජීවිතය අපගේ ගැලවීම වෙත මඟ පාදන අතර පාපිෂ්ඨ ජීවිතය අපට විනාශය ළඟා කරවයි. එම නිසා මනස්ථාපනයේ අවශ්‍යතාව වටහා ගනිමු ද? ප්‍රසාද ස්නාපන ජලය ක්‍රිස්තුන් වහන්සේ තුළ අපගේ ගැලවීම සංකේතවත් කරයි. එය ක්‍රියාත්මක වන්නේ මනස්ථාපනයෙන් යුත් දැහැමි ජීවිතයක් ගත කිරීමෙන් බව අප පිළිගනිමු ද?
ශුභාරංචිය පිළිගැනීමටත් එය අනුව ජීවත් වීමටත් අපට හැකිවන්නේ සැබෑ සිත් හැරීමක් තුළින් ය. ජේසුස් වහන්සේ මෙන් පාපය උදෙසා මරණයට පත්ව උත්ථාන වූවා සේ අපි ද පාපයෙන් මිදී උන්වහන්සේ ශුභාරංචිය අනුව දිවි ගෙවීම උන්වහන්සේගේ උත්ථාන වූ ජීවිතය පිවිසීමක් නොවේද?

**ගරු හෙන්රි සිල්වා පියතුමා** 24

# උත්පත්ති පොත



(පසුගිය සතිය හා සබැඳේ)

මේ සියල්ල වෙත ආබ්‍රහම්ගේ ප්‍රතිචාරය වුයේ දෙවියන් වහන්සේ තුළ තම විශ්වාසය තැබීමයි. දේව හස්තයට භාර වීමයි.

**2. දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමඟ ඇති කර ගත් ගිවිසුම**
ආබ්‍රහම් සමඟ දෙවියන් වහන්සේ ඇති කරගත් ගිවිසුම සම්බන්ධ විස්තර දෙකක් වෙයි.
එනම් :
උත්. 15:1-21
උත්. 17:1-14
උත්. 15 හි යාවිස්ත හා එලොයිස්ත යන සම්ප්‍රදායයන් දෙක ගිවිසුමෙහි ඇතුළත් වෙනස් ස්වරූපයක් ඉදිරිපත් කරයි.
උත්. 17 හි පූජක සම්ප්‍රදාය එය ඉදිරිපත් කරන්නේ ජනවන්දනාත්මක පරිසරයකය. මෙම විස්තර දෙකෙහිම ඇතුලත් වන පොදු කරුණු ඇත.

## ගිවිසුම ඇති කර ගැනීමට හේතුව

ගිවිසුම ඇති කර ගැනිමේ හේතුව ලෙස ඉදිරිපත් කෙරෙන්නේ ආබ්‍රහම් විශ්වාසයේ අර්බුදයට මුහුණ දීමය. එනම් දේව පොරොන්දුව භාර ගැනීමෙන් පසු ආබ්‍රහම් තමනට නියම වු දේශයට පැමිණියත්, දෙවියන් වහන්සේ දුන් පොරොන්දුව ඉෂ්ට වන බවක් නොදකී. එබැවින් දෙවියන් වහන්සේ තම පොරොන්දුව අලුත් කිරිම මගින් ආබ්‍රහම්ට පිළිතුරු දෙන සේක. මෙය සිදු කරණුයේ ගිවිසුමක් මගිනි. ගිවිසුම තුළ දෙවියන් වහන්සේ ආබ්‍රහම් ට දුන් පොරොන්දු ඉටු කිරීමට තමන් බැඳි සිටින බව පෙන්නුම් කරන සේක.

ආබ්‍රහම්ට දුන් පොරොන්දුව දෙආකාරය.
1. ඔහුගෙන් විශාල පරම්පරාවක් පැවත එන බව
2. ඔහුගේ පරම්පරාව දේශය උරුම කර ගන්නා බව.

**උත්පත්ති 15 :**

පොරොන්දු ඉටු කිරීම සඳහා දෙවියන් වහන්සේ තුළ පවතින ස්ථිර අධිෂ්ඨානය මෙහිදී අවධාරණය කෙරේ. එය ඉදිරිපත් කෙරෙන්නේ. සතුන් දෙපළු කොට තැබෙන පැරණි මැද පෙරදිග පිළිවෙතක් ආශ්‍රයෙනි. දෙවියන් වහන්සේ සංකේතවත් කෙරෙමින් දෙපළු කළ සතුන් මැදින් ගමන් ගන්නේ දැල්වෙන ගිනි උදුනක් මිස ආබ්‍රහම් නොවේ. තමන් ගිවිසුම කඩකළහොත් අත්වන ඉරණම පිළිබඳව දෙපළු කළ සතුන් මැදින් ගමන් කළ යුතු වු ගිවිසුම් පාර්ශ්වකරුවනට මතක් කර දෙනු ලැබිය. වෙනත් වචන වලින් කිවහොත් මරණිය තර්ජනයක් ද සමඟ දෙවියන් වහන්සේ දුන් පොරොන්දු ඉටු කිරීම සඳහා කැප කර ගන්නා බවක් පෙන්නුම් කරයි. ඒ සමඟම පුරාණ ගිවිසුමේ කේන්ද්‍රිය සිදුවීම වන නික්මයාම පිළිබඳ අනාවරණයක්ද ආබ්‍රහම්ට දෙනු ලැබේ.
උත්. 15/12-16 "... ඉර බැස යන විට ආබ්‍රම් බර නින්දකට වැටිණි. රුදුරු භීතියකින් ඔහු වෙළි ගියේය. දෙවියන් වහන්සේ ද ඔහුට කතා කොට, මෙය සැබැවින්ම දැන ගන්න. නුඹෙන් පැවතෙන පෙළපත, විදේශිය රටක විදේශිකව සිටිනු ඇත. එහිදී ඔව්හු වහල් සේවය කරමින්..... කළ පසු ඔව්හු බොහෝ සම්පත් රැගෙන පිටත්ව යන්නාහ."
18-21 "ඒ දවසේදී සමිඳාණන් වහන්සේ ආබ්‍රම් සමඟ ගිවිසුමක් පිහිටුවමින් මිසරයේ ගංගාවේ සිට යුප්‍රටිස් මහ ගංගාව දක්වා.... සතු මේ දේශය පෙළපතට මම දෙමි" යි වදාල සේක.

## පරිච්ඡේද 17:1-14

මෙම කොටසෙහි දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමඟ ඇති කරගත් ගිවිසුම ඉදිරිපත් කෙරෙන්නේ කරුණු දෙකක් ආශ්‍රිතවය. එනම්

1. ආබ්‍රම් සිට ආබ්‍රහම් යනුවෙන් නම මාරුවීම

අබ් රම් → පියා උතුම් → විශ්වාසය නිසා උතුම් බව

අබ් රබ් අම් → පියා බොහෝ ජාතීන් → අබ්ර(හ)ම් → තමන් සතුවු විශ්වාසයේ ප්‍රතිපලය නිසා ආබ්‍රහම් ජාතීන්ගේ පියා බවට පත්වෙයි

මෙම තේරුම් කිරීම ජන වහර ආශ්‍රයෙන් බව සැලකිය යුතුය.

## 2. චර්මජේදනය

චර්මජේදනය පුරාණ මැද පෙරදිග ජනතාව අතර පැවතුන චාරිත්‍රයකි. ක්‍රි.පූ. 3000 වනවිට, අඩු තරමින් කරුණු දෙකක් මුල් කරගෙන, කානානිවරු හැර මිසර වාසීන් සහ සමහර සෙමිති වාර්ගිකයෝද චර්මජේදනය සිදු කළහ.
පළමුවෙන් එය පිරිමි දරුවකු වැඩිහිටි වියට පත්වන විට සිදු කළ චාරිත්‍රයකි. දෙවනුව එය පිටුපස සෞඛ්‍ය / හේතුන් ද විය. කෙසේ හෝ උත්. 17 සඳහන් චර්මජේදනය ආගමික අර්ථයක් සහිත විය. එනම්, දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමඟ ඇති කර ගත් ගිවිසුමේ සලකුණ චර්මජේදනය වෙයි.

(තවත් කොටසක් ලබන සතියේ...)

# කොළඹ කතෝලික මුද්‍රණාලයේ ජංගම පොත් අලෙවි හල දූරදර්ශී පියවරක්!




**කතුතුමනි,**

කොළඹ කතෝලික මුද්‍රණාලය මගින් ජංගම පොත් අලෙවි හලක් නව වසරේ ආරම්භ කිරීමේ 'ශුභාරංචිය' 'ඥානාර්ථ ප්‍රදීපය' වාර්තා කළාය. එමගින් කතෝලික ලේඛක ලේඛිකාවන්ට තම තමන් විසින් ලියා මුද්‍රණද්වාරයෙන් එළිදක්වන කතෝලික පොත් අලෙවි කරදීමට මෙම වැඩසටහනින් අතහිත දීමට අදහස් කර සිටීම වඩාත් සතුට ගෙන දෙන කරුණකි.

කොළඹ කතෝලික මුද්‍රණාලයේ අධ්‍යක්ෂ ගරු රොහාන් ද අල්විස් පියතුමාගේ සංකල්පයක් ලෙසින් ආරම්භ කර ඇති මෙම වැඩ පිළිවෙල වත්මනේ මෙන්ම අනාගත කතෝලික ලේඛක - ලේඛිකාවන්ගේ අමන්දානන්දයට හේතු යුක්ත වනවාට සැකයක් නැත. 'මුද්‍රාංකණ සතිය' ට සීමා නොකර කතෝලික පොත්පත් වසර පුරාවටම සැදැහැවත් කතෝලික ජනතාව අතරට ගෙන යාමේ මෙම දූරදර්ශී වැඩපිළිවෙල කතෝලික පොත්පත් කියැවීමේ අභිරුචිය වර්ධනය කිරීමේ වැඩ පිළිවෙලක් ද වනවාට සැකයක් නැත.

පුළුල් ප්‍රචාරක වැඩපිළිවෙලක් කතෝලික පුවත්පත් මගින් පමණක් නොව ජාතික පුවත්පත් මගින්ද මේ සත්කාර්යයට ලබා දීමේ වැදගත්කම අපි දකිමු.

ගරු රොහාන් ද අල්විස් පියතුමා මෙම වැඩ පිළිවෙලට මීසම් සේවක ගරු පියතුමන්ගේ සහයෝගය පතා ඇත. මීසම් වල ගිහි දූත සේවා වල නියැලෙන අයගේ ද සහය ලබාගෙන ගරු මීසම් සේවක පියවරුන්ගේ සුබදායී ප්‍රතිචාර මෙම වැඩපිළිවෙලට ලැබෙනු ඇතැයි අපි අපේක්ෂා කරමු. කතෝලික ලේඛක - පාඨක දෙපිරිසේම සන්තෘෂ්ටියට හේතු වන මෙම වැඩපිළිවෙල සර්ව ප්‍රකාරයෙන්ම සාර්ථක වේවා! ඒ අපගේ අහිංසක තිරසාර ප්‍රාර්ථනය යි!

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි**
ජේරලන්ද

# දහම් පාසල සාරධර්ම කියාදෙන තැනක් විය යුතු

**කතුතුමනි,**

අද සමාජයේ දරුවන් නොමනා ක්‍රියාවන්ට ඇබ්බැහි වීම හා අනිසි ආකාරයේ සමාජ රටාවන් අනුගමනය කිරීම නිසා දරුවන් විනාශය කරා ඇදී යයි.

නිවසේ පරිසරයේ වැඩෙන දරුවා වයසත් සමඟ පිවිසෙන්නේ 'විෂම සමාජය' නමැති අධිවේගී මාර්ග යටයි. එහිදී නිවස තුළ ලැබූ ආදරය, සෙනෙහස, කීකරුකම හා ගෞරවය නැමති ආයිත්තම් සියල්ලම උනා දමා හැඳ පැළැඳ ගන්නේ ඒ මාර්ග යේ ගමන් කිරීමට පහසු ඇඳි පිළි ආභරණයි.

නිවසේ පුරුදු පුහුණු වූ ගුණ ධර්ම සමඟ දහම් පාසල වෙත යොමුවන දරුවාගේ ඒ යහ ගුණ තව තවත් ඔප මට්ටම් කර ගත යුතුයි. එයට අවශ්‍ය පසු බිම දහම් පාසල් ගුරුවරුන් සතු විය යුතුයි. ඔවුන්ගේ කැඳවීම තුළ එඬේරික කාර්යය වී ඇත්තේ ද සමිඳුන් ගිය මඟ යන පුද්ගලයන් බිහි කිරීමයි.

පොතේ දැනුමට පමණක් සීමා නොකොට බයිබලය හරහා දරුවන්ට හැදියාව, විනය ආදර්ශවත් ලෙස හුවා දැක්විය හැකියි. ඒවා ඔවුන්ගේ ජීවිතයට ඒකාබද්ධ කිරිමට ගුරුවරුන් දැනුවත් කිරිම පල්ලියේ පියතුමන් සතු කාර්යයක් නොවන්නේ ද? පොතේ දැනුම පමණක් දීමෙන් දහම් පාසල් අර්ථය සඵල වේද?

ඒ නිසා කතෝලික දහම් පාසල සමාජයට ප්‍රවිෂ්ඨ වන දරුවාට ගුණ දහම නමැති සාරධර්ම පෝෂණය කරමින් සමිඳු ගිය මඟ යන්නට අත්වැලක් වේවා!

**නිරෝෂා ලක්මිණි**
රාගම

# දහම් හරය සමඟ ඉපැරැණි අගයන් ද සුරකිමු

**කතුතුමනි,**

අභිනව ලෝකයේ නවීකරණය වූ මතිමතාන්තර, අදහස් උදහස් සංඝය තුළ හුවමාරු විය යුතුය. අව්‍යාජ කිතුනු ප්‍රේමයෙන් සුපෝෂිත වාද, විවාද සහ සංවාද, සාකච්ඡා ආදිය පැවැත්වීම අම්ල වටිනාකමකින් යුතුය. මේ සියළු දැ සභාව (සංඝය) තුළ සංසරණය විය යුතුය. එමගින් සභාවේ ප්‍රගමනයේ යහපත් ප්‍රවනතා තීව්‍ර ලෙස ඉස්මතුවේ. ගරුතර පියතුමන්ගේ ද, මව්තුමියන්ගේ ද, උපදෙස් සහ මඟපෙන්වීම යටතේ සමස්ත කතෝලික සභාවම ප්‍රගතියේ සහසබඳතාවන් ගොඩ නැංවිය යුතුය.

ඉවත විසිවී ක්ෂය වී යෑමට හෝ භාවිතයට අමතක වී යෑමට හෝ කාලාන්තරයක් සුරැකීව තුබූ කතෝලික වටිනාකම්වලට ඉඩ නොහැරිය යුතුය. මේ එළැඹ තිබෙන්නේ ඒවායේ මකුළුදැල් බැඳෙන තුරු හෝ මළ බැඳි දිරාපත් වන තුරු හෝ වගකීමෙන් තොරව බලා සිටිය යුතු වකවානුවක් නොවේ. අවදියෙන් දැස් දල්වා විපරමෙන් බලා සිටිය යුතු කාලයකි. කිතුනු සාර ධර්ම වනාහී සුපිරි සුදු ජල ප්‍රවාහයකි. ගංගා අතුගංගා බෙදෙමින් ගලා බසින්නා සේ ඒවා පරපුරෙන් පරපුරට ගලා යා යුතු වන්නේ ය.

අපි සාරධර්ම, වත් පිළිවෙත් ගැන මෙන් ම දේව නමස්කාරයට අඳින පළඳින 'වස්ත්‍රාභරණ' ගැන ද සැළැකිලිමත්විය යුත්තෙමු. ඒ සියල්ල දේව ගෞරවය සුරැකෙන පරිදි ඉටුකිරීම අනිවාර්යය බැවිනි. එදා කතෝලික කිතුදම් පෝෂණයෙන් සුපෝෂිත 'මහා කළුගල් කුළුණු' වැනි පතාක යෝධයෝ සංඝයක් පාසා පැන නැංගාහ, දස්කම් විස්කම් පෑහ, කතෝලික අගයයන් සුරැකුහ. එදා මෙන් අදත්, අද මෙන් මතුත්, එම ප්‍රවනතාව ක්ෂය නොවී, දිගටම පැවැතිය යුතුය.

දහම් හරය හා සමඟ ඉපැරැණි අගයන් ද සරු දම් ද සුරැකෙන පරිදි නවීකරණය කරමින්. පැරැන්නන් විසින් දායාදකරන ලද ශ්‍රී ලංකාවේ කතෝලික සභාව (සංඝය) ඔවුනට අත හිත දෙමින් ප්‍රගතියේ රන් මාවත ඔස්සේ ඉදිරියට මෙහෙයවීම සියළුම කතෝලික බැතිමතුන්ගේ යුතුකම බව අමුතුවෙන් කිව යුතු ද?

**එන්. ඊ. පී. ජයතුංග**
රත්නපුර

# දංකොටුව සමුපකාරයෙන් සැලසූ ජනතා සහනය රටටම ආදර්ශයක් !

**කතුතුමනි,**

දංකොටුව විවිධ සේවා සමුපකාර සමිතිය මේ දිනවල ජනතා පැසසුමට ලක්වෙමින් පවතී. ඒ මන්දයත් සමුපකාරය යන්නෙහි අරුත තේරුම්ගෙන නව ආරකින් ජනතා සේවයට කැපවී සිටින නිසාය. පසුගිය නත්තල යෙදී තිබුණේ ඉරිදා දිනකය. දංකොටුව සතිපොල පැවැත්වෙන්නේ ඉරිදා සහ සඳුදා දිනවලය. මෙවර එම දින දෙක එකට යෙදීම නිසා නත්තල් උත්සවයට සැරසෙන කතෝලික ජනතාවට සහනයක් සැලසීමට සතිපොල සම්බන්ධව කටයුතු කරන බලධාරීන් විසින් පියවර ගන්නා ලදී. ඒ අනුව 24 වන සෙනසුරාදා දින සතිපොල පැවැත්වීමට කටයුතු කරන ලදී. එය දැනගත් පොදු වෙළඳපළේ දිනපතා වෙළෙඳාමේ යෙදෙන වෙළෙඳ මහතුන් එයට විරෝධතාවය දක්වන ලදී.

එම විරෝධතාවයට ප්‍රදේශයේ දේශපාලන සහයෝගයද ලැබී තිබිණි. එයින් ඔවුහු ජයගත්හ. සෙනසුරාදා දින සතිපොල නොපවත්වන්නට තීරණය විය. ජනතාවට සිදුවන්නට යන මේ අසාධාරණය දංකොටුව සමුපකාර සමිතියේ බලධාරීන්ගේ කණ වැකිණි. ඔවුන්ගේ අදහස වූයේ අපේ කාර්ය වන්නේ ජනතාවට උපකාර කිරිමය යන්නය. ඒ අනුව තම සමිතිය සතු වාහන දඹුල්ල බලා පිටත්කර හැරියේ නත්තල් උත්සව සමයට අවශ්‍ය එළවළු වර්ග වහා රැගෙන ඒමටය. එලෙස ගෙනා එළවළු වර්ග දෙසැම්බර් 24 වන සෙනසුරාදා දින උදේ සිට සවස් වන තුරු ඉතා අඩු මිළට ජනතාවට සිතැඟිසේ ලබා ගන්නට දංකොටුව විවිධ සේවා සමුපකාර සමිතියේ සමස්ත කාර්ය මණ්ඩලය කටයුතු කර තිබුණි. අවස්ථාවෙන් ප්‍රයෝජන ගෙන බොරදියේ මාලු බාන්නට බලා සිටි පොදු වෙළෙඳපල වෙළෙඳුන්ගේ සියළු බලාපොරොත්තු සුණු විසුණු වී ගියේ නිමේෂයකිනි. එම නිසා අලුත් අවුරුද්ද වෙනුවෙන් දෙසැම්බර් 31 වන සෙනසුරාදා දින පොල පැවැත්වීමට ද බාධාවක් නොවීය.

නත්තල වැනි උතුම් දිනක දංකොටුව සමුපකාර සමිතිය ඇරඹූ මෙම උතුම් කටයුත්ත දැන් තම බල ප්‍රදේශය පුරා ව්‍යාප්ත වෙමින් පවතී. බදාදා දිනවල කිරිමැටියාන සතිපොල භූමියේද ප්‍රදේශයේ සියළු දේවස්ථාන වල වාර්ෂික මංගල උත්සව යෙදෙන දිනවලද එම දේවස්ථාන භූමිවල සහනදායි මිලට නැවුම් එළවළු අලෙවි කිරීමේ වැඩසටහනක්ද ක්‍රියාත්මක වේ. එය අත්හදා බැලීමේ පළමු පියවර ගොඩැල්ල ශුද්ධ වූ සෙබස්තියන් මුනිඳුන්ගේ දෙව්මැඳුරේ වාර්ෂික මංගල්‍ය දා සිදුවූ අතර එය අති සාර්ථක බව සැලයි.

**ඩබ්ලිව්. ඇන්ටන් ජෙරාඩ් ප්‍රනාන්දු**
දංකොටුව

# තර්ටීන් ප්ලස් - තර්ටීන් මයිනස් දෝංකාරය

**කතුතුමනි,**

පසුගියදා ශ්‍රී ලංකාවට සැපත් වූ ඉන්දීය විදේශ අමාත්‍ය එස්. එම්. ක්‍රිෂ්ණා මහතා හා ශ්‍රී ලංකා ජනාධිපති තුමා සමඟ කරන ලද සාකච්ඡාවේදි මෙරට ජනවාර්ගික ප්‍රශ්නයට තර්ටීන් ප්ලස් ස්ථාවරයේ සිට ක්‍රියා කිරීමට සූදානම් බවක් මෙරට ජනපති තුමා ප්‍රකාශ කිරීම තුළින් ආණ්ඩු පක්ෂයේ බෙදීම් ඇති බවක් ජනමාධ්‍ය තුළින් අනාවරණය කර තිබුණි.

කවදත් තර්ටීන් මයිනස් ස්ථාවරයේ සිටින කැබිනට් ඇමැතිවරුන් වන හෙළ උරුමයේ පාඨලි චම්පික රණවක හා ජාතික නිදහස් පෙරමුණේ විමල් වීරවංශ මහතුන් සිය බලවත් විරෝධය මෙහි දී පළකර තිබුණි. විපක්ෂයේ ප්‍රධාන පක්ෂ වූ එ.ජා.ප.ය දහතුනෙන් ඔබ්බට ඇති යෝජනා ගැන අසමින් සුපුරුදු කල් මැරීමේ පිළිවෙත අනුගමනය කර ඇත. ජ.වි.පෙ. ද එය ම කියන අතර ද්‍රවිඩ සංධානය සෙනෙට් මණ්ඩල යෝජනාව ප්‍රතික්ෂේප කර ඇත.

13 වන ව්‍යවස්ථා වගන්ති එ.ජා.පක්ෂ රජයේ නිර්මාණයක් වන අතර වත්මන් පාර්ලිමේන්තුවේ ශ්‍රී. ල. නි. ප මන්ත්‍රීන් හා හරිහරියට එ.ජා. පක්ෂයෙන් ආ මන්ත්‍රීවරුන් සිටින හෙයින් සංශෝධනයට ගැටලුවක් නැත්තේ ආණ්ඩුවට ආ එ.ජා.පක්ෂ මන්ත්‍රීන් එ.ජා.ප ප්‍රතිපත්ති වලට විරුද්ධ නොවන හෙයිනි. ජනාධිපති තුමාගේ දැන් ශක්තිමත් කිරීමට පැමිණි මෙම පිරිස ත්‍රස්ත වාදය දුරලීමට අතදුන්නාසේ ජනවාර්ගික ප්‍රශ්නය විසඳාලීමට පටු චේතනා වලින් මිදී ජනමතයක් ඇති කිරීමට ක්‍රියා කිරීම සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහිකරවීමට දායක වීමක් වන්නේය.

**තියබෝල්ඩ් සමරතුංග**
රත්නපුර



# කොළඹ අගරදගුරු පදවියේ කතෝලික පෞද්ගලික පාඨශාලාවල ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා අයැදුම් පත්

★ කොළඹ අගරදගුරු පදවියේ කතෝලික පෞද්ගලික පාඨශාලාවල 2013 වසරේ පළමුවන ශ්‍රේණියට ළමු
ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීම පහත දැක්වෙන අයුරින් සිදුකෙරේ.

| | | | |
|---|---|---|---|
| 01. ලොයොලා විදුහල - මීගමුව | මාර්තු 12, 13, 14 සහ 15 දිනයන්හි<br>මාර්තු 16 දින | ප.ව. 2.00 සිට 4.00 දක්වා<br>ප.ව. 2.00 සිට 4.00 දක්වා | සියලුම කතෝලික දරුව<br>සියලුම අන්‍යාගමික දරු |
| 02. සා. තෝමස් කතෝලික ජාත්‍යන්තර පාසල - සීදුව | මාර්තු 15, 16, 17, 19 සහ 20 දිනයන්හි | පෙ.ව. 8.30 සිට ප.ව. 12.30 දක්වා | |
| 03. යහපත් එඬේරා කන්‍යාරාමය කොටහේන | මාර්තු 19 වන දින<br>මාර්තු 20,21 සහ 22 වන දින | පෙ.ව. 8.00 සිට පෙ.ව. 10.30 දක්වා<br>පෙ.ව. 8.00 සිට පෙ.ව. 10.30 දක්වා | යහපත් එඬේරා කන්‍යාර<br>ආදි සිසුන්ගේ දරුවන්ට<br>අනෙකුත් සියලුම කතෝ |
| 04. සුරදූත බාලිකා අපේක්ෂාවේ පාසල පයාගල | මාර්තු 19 දින | පෙ.ව. 8.00 සිට ප.ව. 1.30 දක්වා | |
| 05. සිරිකුරුස විදුහල - කළුතර සහ පයාගල ශාඛා විදුහල | මාර්තු 19 සහ 20 දින | පෙ.ව. 9.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා | |
| 06. සා. ජෝශප් විදුහල ශාඛාව එඬේරමුල්ල | මාර්තු 20, 21, 22, 23, 24 සහ 26 දිනයන්හි | පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා | |
| 07. ලොයොලා විදුහල - බෝපිටිය | මාර්තු 20 සහ 21 දිනයන්හි | ප.ව. 2.00 සිට ප.ව. 5.00 දක්වා | |
| 08. ශු. පවුලේ කන්‍යාරාමය, කළුතර | මාර්තු 22, 23 දිනයන්හි | ප.ව. 1.30 සිට ප.ව. 5.00 දක්වා | |
| 09. සා. ජෝශප් ශාඛා පාසල - මීගමුව | මාර්තු 26 වන දින සිට මාර්තු 30 දක්වා | පෙ.ව. 8.00 සිට ප.ව. 1.00 දක්වා | |
| 10. සා. ජෝශප් විදුහල - මරදාන | මාර්තු 26 දින සිට මාර්තු 30 දක්වා | පෙ.ව. 9.00 සිට ප.ව. 1.00 දක්වා | |
| 11. ආවේ මරියා ශාඛා පාසල - බෝලවලාන | මාර්තු 28, 29 සහ 30 දිනයන්හි | මධ්‍යහ්න 12.00 සිට ප.ව. 3.00 දක්වා | විදුහල් ශාලාවේ දී |
| 12. සා. බ්‍රිජට් කන්‍යාරාමය - කොළඹ 07 | මාර්තු 29 දින<br>මාර්තු 30 දින සහ අප්‍රේල් 2, 3 දිනයන්හි දී | පෙ.ව. 8.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා<br>පෙ.ව. 8.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා | සා. බ්‍රිජට් කන්‍යාරාමයේ<br>අනෙකුත් සියලුම කතෝ |
| 13. සා. බෙනඩික් විදුහල - කොටහේන | මාර්තු 31 දින සහ අප්‍රේල් 01 | පෙ.ව. 9.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා | |
| 14. ආවේ මරියා කන්‍යාරාමය - මීගමුව | මාර්තු 30 දින | පෙ.ව. 8.30 සිට මධ්‍යහ්න 12.00 දක්වා | ආවේ මරියා කන්‍යාරාම<br>ආදි සිසුන්ගේ දරුවන්ට |
| | මාර්තු 31 දින | පෙ.ව. 8.30 සිට මධ්‍යහ්න 12.00<br>ප.ව. 1.30 සිට ප.ව. 3.30 දක්වා | අනෙකුත් සියලුම කතෝ |
| 15. ද මැසනොද් විදුහල - කඳාන | අප්‍රේල් 10 සහ 11 දිනයන්හි | පෙ.ව. 8.30 සිට ප.ව. 12.30 දක්වා | |
| 16. සිරි කුරුස විදුහල - ගම්පහ | අප්‍රේල් 16, 17, 18 දිනයන්හි | පෙ.ව. 8.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා | |
| 17. ශු. පවුලේ කන්‍යාරාමය - බම්බලපිටිය | අප්‍රේල් 26, 27 | පෙ.ව. 8.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා | |
| 18. ජයලත් අප ස්වාමිදුගේ කන්‍යාරාමය මොරටුව | අප්‍රේල් 26, 27, 28 යන දිනයන්හි | පෙ.ව. 9.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා | |
| 19. ක්‍රිස්තු රාජ ශාඛා පාසල - වැලිවේරිය | අප්‍රේල් 26, 27 දිනයන්හි | මධ්‍යහ්න 12.00 සිට ප.ව. 2.00 දක්වා | |
| 20. සා. ලෝරන්ස් කන්‍යාරාමය, කොළඹ 06 | අප්‍රේල් 26 දින | මධ්‍යහ්න 12.30 සිට ප.ව. 3.00 දක්වා | සා. ලෝරන්ස් කන්‍යාරාම<br>සහ පාසලේ සහෝදරිය |
| | අප්‍රේල් 27 දින | පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා | අනෙකුත් සියලුම කතෝ |
| 21. මාරිස් ස්ටෙල්ලා විදුහල - මීගමුව | අප්‍රේල් 28 දින | පෙ.ව. 9.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා | |
| 22. සා. ජෝශප් විදුහල - නුගේගොඩ | මැයි 01 දින සිට 31 දක්වා | පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා | |
| 23. යහපත් එඬේරාගේ කන්‍යාරාමය පානදුර | මැයි 02, 03, 04 යන දිනයන්හි | පෙ.ව. 11.00 සිට ප.ව. 1.00 දක්වා | |
| 24. සා. සෙබස්තියන් විදුහල - මොරටුව | මැයි 02, 03, 04 සහ 08, 09 යන දිනයන්හි | පෙ.ව. 8.00 සිට ප.ව. 12.30 දක්වා | |
| 25. සා. පීතර විදුහල - බම්බලපිටිය | මැයි 07, 08, 09 යන දිනයන්හි<br>මැයි 10 දින | පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා<br>පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා | සියලුම කතෝලික දරුව<br>සා. පීතර විදුහලේ ආදි |
| 26. සා. පීතර විදුහල් ශාඛාව උඩුගම්පොල | මැයි 07, 08, 09 යන දිනයන්හි<br>මැයි 10 දින | පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා<br>පෙ.ව. 9.00 සිට පව. 2.00 දක්වා | සියලුම කතෝලික දරුව<br>සා. පීතර විදුහලේ ආදි |
| 27. සා. ජුඩ් ජාත්‍යන්තර පාසල - කුරණ | මැයි 13 දින | පෙ.ව. 8.00 සිට ප.ව. 5.00 | |
| 28. ක්‍රිස්තුරාජ විදුහල - පන්නිපිටිය | මැයි 14, 15, 16 යන දිනයන්හි | පෙ.ව. 10.30 සිට ප.ව. 1.30 දක්වා | |

**ඉල්ලුම්පත් ලබා ගැනීම සඳහා** පවුල් පොත, දරුවාගේ ක්‍රිස්තියානි සහතිකය සහ උප්පැන්න සහතිකය ද එක් එක් පාසලේ විශේෂ අවශ්‍යතාවය අනුව ඉල්ලන වෙනත් ලිපි ලේඛන ද ඉදි
වලට ඇතුළත් කරගැනීමට ඉඩ නොමැති හෙයින් රජයේ හා රජයට පවරා ගත් කතෝලික පාසල් වලට ද අයදුම්පත් යොමුකරන ලෙසට උපදෙස් දෙමි. ඔබගේ දරුවාව පාසලට ඇතුළත් කිරීම
ලෙසට අවවාද කරන අතර එවැනි පුද්ගලයින් පිළිබඳ තොරතුරු ලබා දෙන මෙන් ඉල්ලමි.

**ගරු රංජිත් ම**

## මගේ පියා ගෙනත් දෙන්න

මරියනී.... මහමායාවෙනී //
දරුන් දුක දත් ගැහැණුනී
දෙව්නි, බඹුනී, මිනිසුනී
අවදි වී එනු සිහිනෙනී

මහමෙර පුපුරා හැලෙන්න
හිමගිර දිය වී ගලන්න
පරසක්වල තෙක් ඇසෙන්න
මට හඬන්න ඉඩ හරින්න

මරියනී..... මහමායාවෙනි... //




විදුලි අකුණු, හෙණ ගහන්න
නොමිනිස් කැළ තුරන් වෙන්න
මව් පියවරු රොද බඳින්න
මගේ හඬට පණ පොවන්න

මරියනී.... මහාමායාවෙනී... //

රතු ලේ කඳ මඟ හෙලන්න
කළ වරදක් මට කියන්න
මට බෑ ඔබ නැතුව ඉන්න
මගේ පියා ගෙනත් දෙන්න

බොදුනුවකු දුටු ධීවර කඳුල....

කිතුනුවකු දුටු ධීවර කඳුල...



# 2013 වසරේ පළමුවන නිකුත් කිරීම

## යින් ඇතුළු කර ගැනීම සඳහා

න්
වන්

ාමයේ පෙර පාසලේ දරුවන්ට,
සහ පාසලේ සහෝදරියන්ගේ ඉගෙනුම ලබන දරුවන්ට
ලික දරුවන්ට

පෙර පාසලේ දරුවන්ට
ලික දරුවන්ට

යේ පෙර පාසලේ දරුවන්ට
සහ පාසලේ සහෝදරියන් ඉගෙනුම ලබන දරුවන්ට

ලික දරුවන්ට

යේ පෙරපාසලේ දරුවන්ට, ආදි සිසුන්ගේ දරුවන්ට
න් ඉගෙනුම ලබන දරුවන්ට

ලික දරුවන්ට

න්ට
සිසුන්ගේ දරුවන්ට

න්ට
සිසුන්ගේ දරුවන්ට

රිපත් කරන්න. ඉල්ලුම් කරන සියලුම දරුවන් පෞද්ගලික පාසල්
ට පොරොන්දු වෙමින් මුදල් ඉල්ලන අතරමැදියන්ට අසු නොවන

**දුරාවල පියතුමා** - කතෝලික පෞද්ගලික පාසල් සාමාන්‍යාධිකාරී



## අහෝ, ධීවරයාණෙනි!

කරට නොදැරිය හැකි බරක් වියැ තෙල් මිළ
දරු පවුල රැකගනු කෙළෙසදෝ?
නගින රළ රැළි පෙරළා ගෙනෙන 'සම්පත්'
ගසා කති ගොඩබිමේ 'කාක්කෝ'?
සහනයක් ඉල්ලා හඬක් නැගුවේ
නිරායුධ දෑතෙනි...
සෝ සුසුම් මුසු වදනෙනි...
ජීවිතය වෙනුවට උරුම වියැ මරණය
ධීවරයාණෙනි! වරද කොතැනද? වරද කරුවෝ
කව්රු ද? පෙළඹුවේ කව්රුද?
දිනුවේ සත්‍යයද? බලයද? අහෝ ධීවරයාණෙනි!
ඔබේ ළය මඬල දෙප ලු කළනා
අවියට වඩා ඒ අවිය...
පණගැන්වූ අතහිත සැහැසිය බිහිසුණුය
එවන් අත්හිත් ලබනවිට ජීවය
නුඹ මළා? නෑ නෑ මරා දැමුවා!
අනේ! ජේසුනි හෙට කුමක්වේදෝ?

**පිටිපන මා. ජයවීර**

# කොළඹ කතෝලික සුළමුල - 01

ආදියේ සිට ම කිතුනුවන් දිවයිනේ ජීවත් වූ බව වියත් ඉතිහාසඥයෝ අද පිළිගනිති. ප්‍රථම වර පෘතුගීසීන් මෙහි පැමිණෙන විට හෙවත් ක්‍රි.ව. 1505 දී ද මෙහි ශු. තෝමස් මුනිවරයාණන් සැලැසුම් කළ කුරුසියක් කොළඹ ද තිබී හමුවී ඇත.

ක්‍රි.ව. 1505 ලොරෙන්සෝ ද අල්මේදා දිවයිනට ගොඩ බැස කොළඹට පැමිණි විගස හෙතෙම ඉතා භක්තියෙන් යුතුව කුඩා සිද්ධස්ථානයක් ඉදි කළේ ය. "කුඩා ආරාමය" ලෙස හඳුන්වන ලද මෙය ඉදිකරන ලද්දේ අද ජනාධිපති මන්දිරයත් වරායේ දියකඩනයේ දකුණු කොනත් අතරය. මෙය "ආරාමය" ලෙස හඳුන්වනු ලැබුවත් වඩාත් සොල්දාදුවනට වැඳුම් පිදුම් සඳහා ම ස්ථානයක් වූවා මිස නේවාසික ගෘහයක් නොවීය."

මෙම ස්ථානය ලොරෙන්සෝ ගේ නාම සාන්තුවරයාණන් වූ ශු. ලෝරන්ස් මුනිවරයාණන් ගේ නමින් කැප කරන ලදි. මේ හේතුව කරණකොටගෙන කොළඹ නගරයේ අද දක්වා ම අරක්ගත් මුනිවරයාණන් ලෙස නම් කැර ඇත්තේ ශු. ලෝරන්ස් මුනිවරයාණන් ය.

පෘතුගීසින් දිවයිනට පැමිණි ඉක්බිති, ලතින් පිළිවෙත් සම්ප්‍රදාය අනුව ප්‍රථම දිව්‍ය පූජාව සිද්ධ කරන ලද්දේ මෙ තැන ය. එය සිද්ධ කරන ලද්දේ ෆ්‍රැන්සිස්කාන නිකායික ගරු වින්සෙන්තේ පියතුමන් විසිනි. මින් පෙර අනුරාධපුර යුගයේ පවත්වන ලද දිව්‍ය පූජා පර්සියාන බසින් සීරියාන වන්දනා පිළිවෙත් අනුව පුද කෙරිණි.

අප පෙර ලිපියක සඳහන් කළ පරිදි මෙය සිහිකරනු වස් මෙහි පිහිටන ලද කළුගල් කැටයක, මුහුදට මුහුණලා පෘතුගාලයේ නිල ලාංඡනය කොටා තබා ඇත.

කොළඹ නගරය ආදියේ පිහිටා තිබුණේ වඩාත් නැගෙනහිරට බරව යි. එය කොටුවටත් කැළණි නදියේ මුවදොරත්, අතර ගඟේ වංගුව වටා විය මෙය ආදියේ යෝනකයින් බහුලව විසූ ප්‍රදේශයක් වූ අතර ඔවුන් ගේ පල්ලි දෙකක් ද එහි වූ බව වාර්තා වන්නේ ය. මෙම නගරය දස වැනි සත වසරේ සිට පැවැති බව සෙල් ලිපියක සඳහන් වන්නේ ය. දිවයිනට පැමිණි මරක්කල සංචාරකයකු වූ ඉබන් බතූතා සඳහන් කැර ඇත්තේ නගරය කැලණි නදියේ ජල ගැලීම් වල දී ජලය ඉවත් වූ මුවදොර වටා නගරය පිහිටි බව ය. පසු කල පෘතුගීසි කපිතාන්වරයා මෙය හරහා බැම්මක් ඉදිකැර නගරයේ ආරක්ෂාව සඳහා බේරේ වැව ඉදි කළේ ය. නූතන කොළඹ නගරය බවට පත් වී ඇත්තේ මරක්කර ජනාවාසය නො ව පසුව පෘතුගීසින් ආරම්භ කළ ජනාවාසය යි.

පෘතුගීසීන් ආරම්භ කළ "ආරාමයත්" කර්මාන්ත ශාලාවත් 1507 දී ම අත්හැර දමන ලදී. එහෙත් ක්‍රි.ව. 1518 දී යළි බලකොටුවක් මෙහි ඉදිකරන ලදුව එය "ජයලත් අප ස්වාමිදූ" ගේ බලකොටුව නමින් හැඳින්විණ. ඇතැම් විට මෙය "ශු. බර්බරා බලකොටුව" ලෙස ද හැඳින්වී ය. මෙය ක්‍රමයෙන් දියුණු වූවත් 1524 දී පෘතුගාල රජු ගේ නියෝගය අනුව ගලවා ඉවත් කර දමන ලදි.

මෙහි දෙව් මැඳුරක් ඉදිකරන ලද බවක් සඳහන් නො වන්නේ ය. එහෙත් පෘතුගීසි හේවායින් කෝට්ටේ රජු ගේ සහයෝගය සඳහා නිතර එවන ලද හෙයින් ඔවුන් සඳහා දෙව් මැඳුරක් තනන ලදැයි විශ්වාස කළ හැකි ය. එසේ ම මෙහි ප්‍රථම වරට රැඳී සේවා කළ ගරු ජෝන් වාස් මොන්ටෙයිරෝ පියතුමන් ගේ පියතුමන් ගේ සොහොන් හිසෙහි එතුමන් ශු. ලෝරන්ස් මුනිතුමන් නමින් කැප කරන ලද දෙව්මැඳුරක් ඉදි කළ බව සඳහන් වී තිබේ.

අද වරායේ දියකඩනය ආරම්භ වන තැන එදා "සාන්ත ලෝරන්ස් තුඩුව" යනුවෙන් හැඳින්විය. එසේ කොළඹ කොටුවේ ඔරලෝසු කණුව පිහිටා ඇති කඳු ගැටය එදා "සාන්ත ලෝරන්ස් කන්ද" විය. මේ බිම් පෙදෙස ක්‍රමයෙන් නගරයක් බවට පත්වීමත් සමඟ ශු. ලෝරන්ස් තුමන් නගරයේ අරක්ගත් මුනිවරයාණන් බවට ප්‍රකාශ කරන ලදි. එතුමන් ප්‍රාණපරිත්‍යාගයකු ලෙස මරණයට පත් කරන ලද යකඩ ගරාදි මැස්ස සංකේතවත් කෙරෙන ධජය සැම පෙරහැරකම ගෙන යන ලදි. එය නගරයේ නිල ලාංඡනය සඳහා ද යොදාගනු ලැබී ය.

ගරු ජෝන් වාස් මොන්ටෙයිරෝ පියතුමෝ දිවයිනේ යටත් පිරිසෙයින් තිස් වසරක් තුළ සේවා කළෝ ය. මේ කාලය තුළ දේශීය ජනතාව අතුරින් බොහෝ දෙනෙක් කිතු දහම වැළඳගත්හ. කොළඹ දහම් දූත සේවාවන් සඳහා නිල වශයෙන් කතෝලික පියවරුන් වැඩම කළේ ක්‍රි.ව. 1544 දී ය. ඒ බුවනෙකබාහු රජු ගේ ආරාධනයෙන් ය. මෙසේ පැමිණි ෆ්‍රැන්සිස්කාන පියවරුන් කෝට්ටේ කේන්ද්‍රස්ථානය කැරගෙන ක්‍රියා කළ අතර බහුතර කතෝලික පිරිස කොළඹ සිටි හෙයින් එතුමන්ලා පසුව එහි තාපසාරාමයක් ඉදිකර ගත්හ. මෙය ශු. අන්තෝනි මුනිඳුන් ගේ නාමයෙන් කැප කෙරිණ.

ක්‍රි.ව. 1552 වන විට ජේසු නිකායික පියවරු ද මෙහි පැමිණ සිටියහ. එතුමන් මෙහි ජීවත් වූ පෘතුගීසි ජාතිකයින් ගැන ඉතා ශෝචනීය කරුණු සඳහන් කොට ලිපි ලියා ඇත. මොවුන් වැඩි දෙනකු එම රටේ වරදකරුවන්ව සිට මෙහි පැමිණ ඇති අය බවත් ඔවුන් ගේ හැසිරීම ඉතා දූෂිත, ලජ්ජා සහගත ජීවිත බවත් එම පූජකවරු ලියා චෝදනා කරත්.

කොළඹ නගර සීමාවෙන් පිටත දෙව්මැඳුරු හතක් පිහිටි බව වාර්තා ගත යි. මෙයින් පහක් කඳු මත පිහිටියේ ය. මෝදර පිහිටියේ ශු. ස්නාවක ජුවාම් මුනිඳුන් ගේ නමින් වූ අලංකාර දෙව් මැඳුර යි. එහි අනාථදරු මඩමක් ද විය. මේ සමඟතවත් ප්‍රධාන දෙව් මැඳුරක් වූයේ ධර්මෝපදේශ මධ්‍යස්ථානයක් ද සමඟ පිහිටි ශු. තෝමස් අපෝස්තුළුවරයාණන් ගේ නමින් වූ ජින්තුපිටියේ දෙව්මැඳුරයි. මෙහි "අනුරාධපුර කුරුසිය" නමින් ප්‍රසිද්ධ, අද කතෝලික කොඩියේ යොදා ඇති ශු. තෝමස් මුනිවරයාණන් ගේ කුරුසියක් ද තිබිණි.

බ්‍රිතාන්‍ය පාලන යුගයේ දී මෙම පැරැණි දෙව්මැඳුරු භූමිය බ්‍රවුන්රිජ් ආණ්ඩුකාරයාණන් විසින් රෙපරමාදු නිකායකට පවරා දෙන ලදි. මෙයින් සාන්තුවරයාණන් ගේ නම ලබා ගත් මෙම පිරිස ගල්කිස්සේ තම විදුහලට ද එය ආරූඪ කොට ඇත.

ශු. තෝමස් දෙව්මැඳුර අසළ පහත් බිම පෘතුගීසි සමයේ දී හඳුන්වනු ලැබුවේ "සන්තෝමේ" කියා ය. එහි අර්ථය වූයේ ශු. තෝමස් තනිතලාව යනුයි. පසුව එය හෙළ බසින් "සන් - තුම් - පිටිය" වූ අතර අද එය "ජින්තුපිටිය" බවට පෙරළී තිබේ.



යටගිය දවස

විශ්‍රාමික අගරදගුරු අති උතුම් **ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ**

**99**

මින් ඔබ්බට පිහිටියේ බොරලුගොඩ කන්ද යි. මෙහි "ගුඅඩලූපේ අප ස්වාමිදූ" නමින් දෙව්මැඳුර විය. මේ නාමය ක්‍රමයෙන් හෙළ බසින් "අදිලිප්පු" බවට පෙරළිණි. ඕලන්දයින් මෙය වරදවා තේරුම් ගත්තේ "අගොඅ - ද - ලූපේ" හෙවත් "වෘකයන් ගේ වගුරුබිම" සැටියට යි. මේ අනුව ඕලන්ද ජාතිකයෝ මෙයට තම බසින් එය අර්ථවත් කැර "වුල්ෆෙන්ඩාල්" යනුවෙන් නම් තැබූහ. අද දක්වා පවතින්නේ එය යි.

මේ අසළ පිහිටි අනෙක් කඳු ගැටය "හල්ෆ්ට්ඩෝර්ප් හෙවත් අද උසාවි සංකීර්ණය පිහිටා ඇති කඳු ගැටය යි. මෙහි "ජීවනයේ අප ස්වාමිදූ" ගේ දෙව්මැඳුර පිහිටියේ ය. මෙහි පහත් බිම වූයේ අද "ප්‍රයිස් පාක්" නමින් හැඳින්වෙන තනිතලාවයි. එදා එය "ජීවනයේ අප ස්වාමිදූ තනිතලාව" නමින් විය. ඕලන්ද හල්ෆ්ට් ජෙනරාල් පදිංචිව සිටියේ මෙහි ය. කොළඹ අල්ලා ගැනීමේ යුද ගැටුමේ දී ඔහු මෙහි දී මැරුම් කෑ නිසා ඔහු සිහිවීම පිණිස මෙම කඳු ගැටය "හල්ෆ්ට්ඩෝර්ෆ්" ලෙස නම් කෙරිණ.

හල්ෆ්ට්ඩෝර්ෆ් කඳු ගැටයේ අනෙක් පසින් ශු. සෙබස්තියන් මුනිඳුන් ගේ නමින් වූ දෙව්මැඳුර පිහිටියේ ය. මේ බිම් පෙදෙස අද දක්වා "සාන්ත බස්තියන්" නමින් හැඳින් වේ. මේ අසළ පළමුව රාජසිංහ රජු විසින් කපන ලද දිය ඇල පවතින්නේ ය. රජතුමා එය කොළඹ පහත් බිම් වලට ජලය සැපැයුම සඳහා කරවන ලද අතර ඕලන්දයෝ පසුව එය යළි විවෘත කළෝ කැලැණි නදියේ සිට බෝට්ටු ප්‍රවාහනය සඳහා ය.

තවත් ඉතා ජනප්‍රිය වූ දෙව්මැඳුර වූයේ ජාවත්ත කඳු ගැටයේ පිහිටි ලිවරමෙන්ටෝ (හෙවත් මුදා හැරීමේ) අප ස්වාමිදූ ගේ නමින් වූ දෙව්මැඳුර යි. මෙය පෘතුගීසි සමයේ දී වන්දනා ස්ථානයක් විය. එසේ ම ඕලන්ද පීඩන සමයේ දී කතෝලික පිරිස රැස් වූ ස්ථානය විය. (මේ ගැන වෙනත් ලිපියක අපි සඳහන් කෙළෙමු). මෙහි තිබුණු මරියෝත්තමාවන් ගේ ප්‍රතිමාව පීඩන සමයේ දී ළිඳක සඟවා තබා ඉනික්බිති ගාල්ලට ගෙන ගොස් පෙරළා කොළඹ ගෙනැවිත් අද බම්බලපිටිය දෙව්මැඳුරේ තැන්පත්කොට තිබේ.

අවසානකොට සඳහන් කළ යුතු වන්නේ කොළඹ පිහිටි, අද මිලාගිරිය නමින් හැඳින්වෙන, දෙව් මැඳුර යි. මෙය පෘතුගීසි බසින් "මිලාග්‍රේස්" නමින් හඳුන්වනු ලැබුවේ "ආශ්චර්යමත්" අප ස්වාමිදූ යන අර්ථය ඇතිව යි. මෙය අද රෙපරමාදු දෙව්මැඳුරකි. යාපනයේ ආශ්චර්යමත් අප ස්වාමිදූ ගේ නමින් වූ දෙව්මැඳුරෙන් ලබාගත් විශාල සීනුවක් ද මෙහි ඇත.

ඕලන්ද හමුදාවෝ ක්‍රි.ව. 1655 දී ප්‍රථමයෙන් ම මෙහි ඇතුළු වී එහි සිට කොළඹ පිහිටි කතෝලික දෙව්මැඳුරු සියල්ල සුනු විසුනු කැර දැමුවෝ ය. (වැඩි විස්තර මතුවට)

## කලා සංග්‍රහය

# සීනු ජස්ටින්



"ඩාං............ ඩාං ඩාං....... ඩාං...... ඩාං ඩාං........ ඩාං......"

දේවස්ථානයේ මහ සීනුව ගමේ මරණයක් සිදුවී ඇති බව මීසමට දැනුම් දෙමින් නාද වන්නට විය. "අදත් ගමේ ඉලව් ගෙයක් සිද්ද වෙලා වගේ."

"ඇයි අම්මා දන්නෙ නැද්ද? අර අගුස්තීනු මාමා ඊයෙ රෑ අන්තරා වෙලානේ."

"අගුස්තීනු මාමා ගිය ඉරිදත් පූජාවට ඇවිල්ල හිටියනේ."

"ඔව් ඊයේ උදේ හදිසියේම පපුවෙ අමාරුවක් කියලා ඉස්පිරිතාලේ ගෙනිහින් තියෙනවා. ඒත් හවස් වෙනකොට උන්දෑ අන්තරාවෙලා."

"දැන් එහෙනම් මිනිය ගෙදරට ගෙනල්ල ඇති."

"ඔව් අම්මේ මං එහෙනම් ඉලව් ගෙදර පැත්තේ ගිහින් එන්නම්."

ජස්ටින් වහා සූදානම් වී මරණ ගෙදරට යාමට සිය නිවසින් එළියට බැස්සේය.

"ජස්ටින් පුතේ උඹ දවල්ට ගෙදර එනවද?"

"කියන්ඩ බෑ."

ජස්ටින්ගේ වයස හරියටම දන්නා කෙනෙක් නැත. පමණට වඩා කරංගෑටිවූ පෙනුමක් තිබුණු ඔහුට අවුරුදු විසි පහක් පමණ වේයැයි අනුමාන කළ හැකිය. ජස්ටින් ජීවත් වන්නේ සිය මව සමඟය. ජස්ටින්ගේ පියා දක්ෂ වඩු බාස් කෙනෙක් බවත් ජස්ටින් අත දරු වයසේ දීම දිනක් දුම්රියට හැපීමෙන් මිය ගිය බවත් ගමේ වැඩිහිටියෝ කියති. එදා සිට ජස්ටින් හදා වඩා ගැනීමට ඔහුගේ මව කැතරින් නොවිඳිනා දුක් වින්දාය. ඔහු කුඩා කල සිටම සම වයසේ අනෙක් දරුවන්ට වඩා වෙනසක් පෙන්නුම් කළේය. මන්ද පෝෂණය නිසා සිරුර වැඩීම ඉතා සෙමින් සිදුවූයේ ය. එසේම ඔහුගේ මනස වැඩීමද සිදු වූයේ මන්දගාමී ලෙසය. එනිසාම පාසලට ඇතුලත් කළද සම වයසේ අනෙක් දරුවන් මෙන් නොව උගන්වන කිසි දෙයක් හරි හැටි වටහා ගැනීමට ජස්ටින්ට නොහැකි විය. සෑම දිනකම පන්තියේ ඉගැන්වූ ගුරුවරියගෙන් බැණුම් ඇසුවේය, ගුටි කෑවේය. ඔහු ටික කලකට හෝ පාසලට ගියේ අම්මාගේ බල කිරීමටය. පසුව ඔහු පාසල් යනවා වෙනුවට ගෙදරින් පිටව ගොස් ගම පුරාම ඇවිද දහවලට නිවසට යන්නට පටන් ගත්තේය. ඉන්පසු කැතරින් ඔහුට පාසල් යාමට බල කළේ නැත. එතැනින් ඔහුගේ පාසල් ගමනටද තිත තැබුණේය.

පාසල් ගමන හමාර වූ පසු ගමේ රස්තියාදුවට හුරුවූ ජස්ටින් ගමේ සිදුවන සෑම මළ ගෙදරකටම යාමට උනන්දු වූයේ මඟුල් උත්සව වලදී මෙන් නොව ආරාධනාවක් නොමැතිවම සහභාගි හැකි වීමත්, එම නිවෙස්වලින් ඔහුට බඩ කට පිරෙන්නට කෑම බීම ලැබීමත් නිසාවෙනි. කිසිම නෑ හිතවත්කමක් නොතිබුණද තම කිට්ටුම ඥාතියෙකුගේ මරණයක් මෙන් සෑම කටයුත්තකදීම කළ හැකි සෑම වැඩක්ම කැමැත්තෙන්ම කර දීමට ඔහු සෑම විටම ඉදිරිපත් විය. ඊටත් අමතරව මුලදී අවමංගල්‍ය පෙරහැරේ කුරුස සිරියස් රැගෙන යාමට සහය වුනු ජස්ටින් තරමක් ගැටවර වියට එළඹෙත්ම අවමංගල්‍ය පෙරහැරේ ඉදිරියෙන් මළ සීනුව නාද කරමින් යාමට අවස්ථාව උදා කර ගත්තේය. එදා සිට ඔහු එය දේව කාර්යයක් මෙන් ඉතා වුවමනාවෙන් කරන්නට විය. අවමංගල්‍ය පෙරහැරට අවශ්‍යවන උපකරණ දේවස්ථානයෙන් රැගෙන යාමට පිටත්වන පුද්ගලයින් සමඟ ජස්ටින් ද අනිවාර්යයෙන් එකතු වෙයි. දේවස්ථානයේ අල්තාරය පිටුපස කාමරයේ තබා ඇති අවමංගල්‍ය පෙරහැරේ රැගෙන යන භාණ්ඩ අනෙක් පැමිණි පිරිස ගනිද්දී ජස්ටින් වහාම ඉදිරිපත් වී මළ සීනුව ලබා ගනී.

"දැන් ජස්ටින් මැරුණු දවසට ඉස්සරහින් සීනුව ගගහ යන්නෙ කවුද?"

සීනුව නාද කරමින් අවමංගල්‍ය පෙරහැරේ ඉදිරියෙන් යාමට ජස්ටින්ගේ තිබෙන කැමැත්තත් වෙන අයෙකු එය ලබා ගැනීමට තැත් කරන්නේ නම් ඒ ගැන කලහ කිරීමට පවා ඔහු ඉදිරිපත් වන බවත් දන්නා පියතුමා ද ජස්ටින්ට යම් විහිළුවක් කරයි.

"ඒකට ප්‍රශ්නයක් වෙන්නේ නැහැ ස්වාමි, ජස්ටින් පෙට්ටිය ඇතුලේ ඉඳගෙන සීනුව ගගහ යයි." කටකාර තරුණයෙක් ජස්ටින් කෝප කිරීමේ අදහසින් පවසයි.

එයට කියයුතු හොඳ පිළිතුරක් මුවට ආවද පියතුමා ඉදිරියේ ගෞරවනීය කුලෑටි බවක් පෙන්වන ජස්ටින් පියතුමා දෙස කෙළින් නොබලා වැයමින් මුවට සිනාවක් නංවා ගත්තේය.

ජස්ටින් මළ ගෙදරට පැමිණෙන විට මෘත ශරීරය නිවසට ගෙනැවිත් තිබුණි. වත්තේ තැන් තැන්වල පිරිස රැස්ව සිටියෝය. ගමේ තරුණ පිරිසද නිවසේ වැඩ කටයුතුවල යෙදී සිටියේ මිය ගිය අගුස්තීනුගේ පුතාගේ ගජ මිතුරන් වූ නිසාවෙනි.

මරණ පෙරහැර යන මඟ දෙපස සුදු කඩදාසි කොඩි සිටුවීම සඳහා උණ බම්බු පතුරු කැලි ඉරමින් සිටි තැනට ගිය ජස්ටින් ද කැපූ උණ බම්බු පලන්නට විය. එතැන ගමේ තරුණයින් මෙන්ම ජස්ටින් දැක නුපුරුදු තරුණයින් කීප දෙනෙක් ද වැඩකරමින් සිටියහ. ඒ අගුස්තීනුගේ පුතාගේ වැඩපලේ මිතුරෝය.

"හැබැයි මේ සැරේ නම් ජස්ටින්ට වැඩේ හබක් වෙනවා. සීනුව ගහන්ඩ කොළඹ බිෂොප් මාලිගාවේ සීනුව ගහන හාදයව මෙරිල් එක්ක ඇවිල්ලා. දැන් එයා තමයි සීනුව ගගහ යන්න ලෑස්ති වෙන්නේ. මියගිය අගුස්තීනුගේ පුතා මෙරිල්ගේ ගමේ මිතුරන් දෙදෙනෙක් ජස්ටින් පසෙකට කැඳවා ගෙන ගොස් පහත් හඬින් ජස්ටින්ගේ කනට කර පවසමින් හොඳින් ඇඹරූ ලුණුවක් ගිල්ලුවේය.

ජස්ටින්ගේ හිත කීරි ගැසුනේය. මුලින් ඔහු එය පිළිගන්නට අකමැති විය. එහෙත් කලින් සැලසුම් කර තිබුණු පරිදි මෙරිල්ගෙ කොළඹ මිතුරෙක් පල්ලියෙන් රැගෙන විත් තිබුණු මළ සීනුව ජස්ටින් සහ ගමේ මිතුරන් දෙදෙනාට පෙනෙන අයුරින් පිටතට රැගෙන විත් පරීක්ෂා කරන්නට විය.

"දැක්කද? ඔය සීනුව බලන්නේ එයා තමයි පොර."

ජස්ටින්ගේ හිතට දුකක් සහ කෝපයක් දැණුනි. "කොහෙවත් ඉඳලා ආපු පිට එවුන්ට මේ ගමේ එහෙම සීනුව ගහන්ඩ දෙන්න බැහැනේ. මං ගිහිල්ලා අහන්නම්කෝ." ජස්ටින් මෙරිල්ගේ කොළඹ මිතුරා වෙතට යාමට සූදානම් වෙමින් පැවසීය.

"හා! හා! යන්න එපා යන්න එපා. මිනිහා කොළඹ හොඳ පොරක්ලු. හැම වෙලේම ඉනේ පිහියක් තියාගෙනලු ඉන්නේ, වලියකට ආවොත් පිහිය බස්සලා තමයිලු නවතින්නේ." එකෙක් ජස්ටින් ඉදිරියට යාම වලකාලීය.

මෙරිල්ගේ මිතුරාගේ වදනින් ජස්ටින් මඳකට පසුබා ගියේය.

"ජස්ටින් බය වෙන්ඩ එපා! ගමේ කොල්ලෙකුට සපෝට් එක දෙන්න අපි ඉන්නවා. ඒ වෙලාවට බලා ගමුකෝ අපි."

මිනිය ගෙනියන්ඩ ලෑස්තිවෙද්දිම මං ඉක්මනට ගිහින් ඒකට ඉස්සෙල්ලා සීනුව අතට ගන්නවා. එතකොට මොකවත් කරන්න බැහැනේ." මෙරිල්ගේ අනෙක් මිතුරාගේ වදනින් ධෛර්යය උපදවා ගත් ජස්ටින් පැවසීය.

ක්‍රමයෙන් අවමඟුල් පෙරහැර සුසාන භූමියට රැගෙන යන වේලාව ලං වෙමින් තිබුණි. ගමේ දේවස්ථානයේ පියතුමාද නිවසේ අවසාන ආශිර්වාදය දීම සඳහා නිවසට පැමිණියේ ය. සියල්ලෝම පාහේ නැගී සිට පියතුමා සමඟ අවසන් යාච්ඤා සඳහා සහභාගි වූහ. මොහොතින් නිවස තුළින් එක්වරම ලතෝනි විලාප හඬ නැගෙන්නට විය. මිනිපෙට්ටියේ පියන වැසීමට ඉඩ නොදෙමින් මෙරිල්ගේ මව පියනේ එල්ලෙන්නට වූවාය. එහෙත් පෙට්ටියේ පියන වැසීමට ඉදිරිපත් වූ කීප දෙනා ඇයව වලක්වාලමින් වැයමින් පෙට්ටියේ පියන වැසුවෝය.

මේ අතර වාරයේ ජස්ටින් ඉක්මනින් මළ සීනුව තබා තිබුණු මේසය වෙත ගොස් එය අතට ගන්නට සූදානම් වෙත්ම එක්වරම පිටුපසින් පැමිණි මෙරිල්ගේ මිතුරා සීනුව උදුරා ගන්නට ජස්ටින් සමඟ පොර බැදුවේය. ජස්ටින් කෙසේ හෝ සීනුව උදුරා ගත්තේය. මිතුරා සඟවාගෙන සිටින පිහියක් ගන්නට මෙන් සිය ඉන පෙදෙසට අත යැවීය. මේ සිදුවීම දෙස බලමින් ගමේ තරුණ කැල එකිනෙකා පසුපසට මුවාවෙමින් සිනාව වලක්වාගන්නට වැයම් කළේ වැඩිහිටියන් දුටුවහොත් දොස් පවරනු ඇතැයි බියෙනි.

මෙරිල්ගේ මිතුරා ලඟ පිහියක් සඟවා ගෙන ඇති බව අයෙක් කී කථාව ජස්ටින්ට එක්වරම සිහියට නැගුනි. ඔහු තමාට පිහියෙන් ඇණ තුවාල සිදුකර හෝ සීනුව ලබා ගනිතියි අනියත බියක් ජස්ටින්ගේ සිත තුළ හටගති.

බියට පත් ජස්ටින් සීනුව ද රැගෙන වහා අවමංගල්‍ය නිවස ඉදිරියෙන් දිවෙන මාර්ගය දෙසට දිව ගියේය. බලාපොරොත්තු නොවූ ලෙසින් මාර්ගයේ වේගයෙන් ධාවනය වූ වාහනයක මහ හඬින් ගැටුන ජස්ටින් විසිවී මාර්ගය මැද ඇද වැටුණි. අවමංගල්‍ය නිවසට පැමිණ සිටි ගමේ තරුණයෝ වහා ජස්ටින් වැටී සිටි දෙසට දිව ගියෝය. දෙවරක් ඇඟලු ජස්ටින් මාර්ගයේම අවසන් හුස්ම හෙළීය. මළ ගෙදර සිට පිටතට පැමිණෙමින් සිටි පියතුමාද කඩිනමින් එතැනට ලංවිය.

ජස්ටින් මළ සීනුවද තදින් අල්ලා ගෙන පපුවට තුරුළු කරගෙන මිය ගොස් තිබුණි.

"දැන් ජස්ටින් මැරුණු දවසට ඉස්සරහින් සීනුව ගගහ යන්නේ කවුද?" පියතුමාට එක්වරම පසුගිය දිනක ජස්ටින්ට කළ විහිළුව මතකයට නැගුනි.

**මර්වින් නෝනිස්**

---

# සුබස

**ෆිලීෂන් අබයකෝන්ගේ සුබස 194**

## කතිකාවයි කතිකාවතයි

**අනේ නඟණ්ඩ! කුමක් කරමෝදැයි කියමින් හඬා දිවන්නාහු හතරැස් පොකුනට වැද අපි ඔවුනොවුන් සැඟවුණ තැන්නොපාම්හයිකතිකාකොටගෙන........ වෙස්සන්තර රජතුමාගේ දූපුතුන් දුෂ්ට බමුණාගෙන් ගැලවෙන්නට කථාකරගත් සැටියි.**

නාසා - නාසිකා, කශා - කශිකා (කසය), ලතා - ලතිකා මෙන් කථා - කථිකා වුණා නිසැකයි. කතිකා අල්පප්‍රාණ වුණේ අගට එක්වුණු 'වත' යන පදයට පෑහෙන්නට විය යුතුය. සම්භාව්‍ය සාහිත්‍යය පුරා ඇත්තේ කතිකාවද කතිකාවතද අල්ප ප්‍රාණයෙනි.

කතිකාවකට භාජනය වෙයි - කතිකාවක් ගොඩනගමු ලෙස කතිකාව අද වහරේ මුල් බැස ඇත. දේශපාලන, සමාජ, කලා ආදි හැම අංශයක පැන නැගෙන ප්‍රශ්න මත වාදවිවාද සංවාද, මහජන අදහස් විමසීම් PUBLIC DIALOGUE / CONSULTATION දැන් කතිකායි. කතිකාවත් කීපයක් ඉතිහාසගත වුවද ප්‍රසිද්ධතම දඹදෙණි කතිකාවතයි. දෙවන පැරකුම්බා නිරිඳුන්ගේ අනුග්‍රහයෙන් සම්පාදිත මේ කතිකාවත දඹදෙණි රාජ්‍යයට සීමා වූ බව පෙනේ. එකල රට එක්සත් නොවී තිබිණ. පිරිහුණු සංඝ සමාජය පරිශුද්ධ කිරීම එකම අරමුණ වූ බව පැහැදිලිය. කාව්‍ය නාටක ගර්හිත විද්‍යා තමා නූගත යුතු අනුනුත් නූගැන්විය යුතුය. උපන් රෝගය නිසා යකුන් කෙළවීම්. බලිතිබීම් නොකටයුතු... කතිකාවත වචනයේ වත යනු ව්‍යවස්ථාව බව හැඟේ.

ථෙරවාදී සම්ප්‍රදායක් වන ධර්ම සංගායනාවල අභිප්‍රාය ත්‍රිපිටක බුද්ධ වචනය සජ්ඣායනා කොට ඒකමති කත්වයකට එළඹීමයි. මියන්මාරයේ පැවති අන්තිම (සයවන) ධර්ම සංගීය 1954 වෙසක් මස අරඹා අවසන් වුණේ 1956 වෙසක් මසය.

දෙවන වතිකාන ජගත් මන්ත්‍රණ සභාවට සමහරු කතිකාවත කියති. සංගායනාව කියා නම් කවුරුත් නොකියති. ඉහත කී කරුණු අනුව කතිකාවතේ ඇත්තේ සීමිත වූ ප්‍රාදේශීය වූ පරාසයක් බැවින් ලෝක කතෝලික මහා සභාවට කතිකාවත ලෙස හැඳින්වීම විශ්ව මහා සභාවේ දිගත පතළ බව පිරිහෙළීමකි. සකල ලෝක කතෝලිකයන් නියෝජනය වී ඒකරාශි වූ මේ මහා සම්මේලනයට ජගත් මන්ත්‍රණ සභාව යන නාමය අතිශයින් යෝග්‍යය.

සමස්තජාතීහුඑහිඑක්රොක්වන්නාහ. (යෙසායා 2:2) උන්වහන්සේගේ රාජ්‍යයට කෙළවරක් නොමැත්තේය. (ලූක් 1:33)

---

# සුවය සමිඳුන්ගෙන්මයි




**එඩ්වඩ් අයිවන් පෙරේරා**
**මිළ - රු. 300/=**

නිර්මාණයක් බිහිවීමට විවිධ වූ වස්තු විෂයන් තිබේ. නිර්මාණකරණයේදී මෙම අනුභූතින් පාදක කරමින් නිර්මාණ බිහි කරයි. තමන්ගේ ජීවිතයේදී ලැබූ අත්දැකීම් ඔස්සේ එම අත්දැකීම් තව අයෙකුට පහන් සිතිවිලි ආදර්ශයක් සේ ගත හැකි ගීතිකා නිර්මාණ එකතුවක් පසුගියදාක නිකුත් කෙරිනි.

පයාගල එඩ්වඩ් අයිවන් පෙරේරාගේ දෙවන නිර්මාණ එකතුව වන දෙව් උතුම් II "සුවය සමිඳුන්ගෙන්මයි" ගීතිකා අඩංගු සංයුක්ත තැටිය වර්තමානයේ ඇසෙන හරසුන් වූ ඝෝෂාකිරි ගීතයන්ට වැට බඳිනා අපූර්වත වූ ගීත සමුච්ඡයකි. එඩ්වඩ් අයිවන් මහතා මෙම සංයුක්ත තැටියේ එන සියලු ගී පද රචනා කොට ඇති අතර තනු නිර්මාණයෙන් ද දායක වී ඇත. ඩී. රත්නායක සංගීතය මෙහෙයවා ඇත.

ගරු ශ්‍රියානන්ද ප්‍රනාන්දු, ගරු අජිත් පෙරේරා (නි.ම.නි) පියතුමන්ලා ද මෙහි ගීත ගයන පිරිසට එක්ව ඇත.

හරවත්වූ ගීත එකතුවක් කිතුනු ගීතිකා අතරට එක් කළ පයාගල එඩ්වඩ් අයිවන් පෙරේරා මහතාට ප්‍රදීපය සුබ පැතුම්!

---

**156**

*ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි සොයුරු*




නෑයන් බලලා කැවුම් බෙදන්නට වරෙව් — වරෙව්!
මීයක් කඩලා අත ලෙව කන්නට වරෙව් — වරෙව්!
ඉනි මං බැඳලා පයින් ගහන්නට වරෙව් — වරෙව්!
නැටුමක් නටලා බෙරේ පලන්නට වරෙව් — වරෙව්!

මේ යන හැටි දැක්කම නම් අන්ද — කයිප්පු
තැන තැන මිනිසුන් ඉන්නව බීල — කසිප්පු
පොඩි මිනිසුන් හොඳටම ඇති කාල — පරිප්පු
මද කිපිලද පාලකයන් වීල — කුලප්පු

**ගායනය :දන්කොටුවේ සූරසේන**

---

# සෙනෙහසේ ගීතය

**ගරු බෙන්සිරි පෙරේරා පියතුමා**
**මිළ රු. 300/=**

මා හට අපූර්ව වූ ගීතිකා එකතුවක් රසවිඳීමට ලැබුණි. ඒ ගරු බෙන්සිරි පෙරේරා පියතුමන්ගේ නවතම නිර්මාණ එකතු ව වූ "සෙනෙහසේ ගීතය" නම් වූ සංයුක්ත තැටියයි. මෙම ගීතිකා එකතුවේ සුවිශේෂත්වයක් ඇත. එනම් සුවිශේෂයෙහි සඳහන් බයිබලීය පාඨ ඔස්සේ මෙම නිර්මාණය කිරීමයි. මීට පෙරදීද ගරු බෙන්සිරි පියතුමා නිකුත් කළ "දෙවිඳු පසස ගී", "ජේසුනි ඔබට නමෝ" සංයුක්ත තැටිද ශු. බයිබලයේ ගීතාවලිය හා කිතු වදන් ඔස්සේ නිර්මාණය කෙරිනි.

ගරු පියතුමන්ගේ ගීතිකා එකතුව සැදැහැවත් ජනයා දෙවිඳුන්ට සමීප කරවයි. මෙහි පද රචනා අප සිත් ඇද බැඳ තබා ගන්නා අතර තනු නිර්මාණයද ඇසිය හැකි, ඇසීමට හිත යොමු කරනා ලගන්නා සුළු අයුරින් නිර්මාණය කොට තිබීම පැසසිය යුතුයි. මෙම




සංයුක්ත තැටියේ ගීතිකා 16 ක් අඩංගු වන අතර මෙහි සියලු ගීතයන් හි පැබැඳුම හා සත්සර නාද රටාවන් ගරු බෙන්සිරි පියතුමාගෙ නි. සංගීත අධ්‍යක්ෂණයෙන් සෝමපාල රත්නායක සංගීතවේදීයා දායක වී ඇත. ගරු පියතුමන්ලා කිහිප දෙනෙකු සමඟින් තව පිරිසක් එක්ව මෙහි ගායනයෙන් දායකවී ඇත.

හරවත් වූ නිර්මාණ අන්තර්ගත "සෙනෙහසේ ගීතය" සංයුක්ත තැටිය සැදැහැවත් ජනයාව දේව වන්දනාව සඳහා යොමුකරවයි. ගරු බෙන්සිරි පියතුමාට ප්‍රදීපය දේව ආශිර්වාදය පතයි.!

**කුමර නයනජිත්**

බැසිල් ෆොන්සේකා විසිනි

# කුවේට් රජ කුමරුවා කිතු දහම වැළඳ ගනී

නව වසරේ ජනවාරි මස 16 වැනිදා කුවේට් හා අනෙකුත් අරාබි රටවල් පුදුමයට පත් කළ ආරංචියක් පැතිර ගියේය. එම පුවත විසුරුවා හරිනු ලැබුවේ, "අල් හකිකා" නම් කිතුනු චන්ද්‍රිකා මාධ්‍ය ජාලය විසිනි. ඒ පුවත වූයේ, කුවේට් රජ පවුලට අයත් අබ්දුල්ලා අල්. ෂබා කුමරුවා එම මාධ්‍ය ජාලය ඔස්සේ තමා කිතු දහම වැළඳ ගත් බව ලොවට ප්‍රකාශ කිරීමයි.

"කිතුනුවකු වීම නිසා මා මරා දමනු ලැබුවොත්, මා ජේසුන් වහන්සේ මුහුණට මුහුණ හමු වී සදාතනික ජීවිතයට ඇතුලු වෙනවා." කුමරුවා චන්ද්‍රිකා මාධ්‍ය ඔස්සේ එලෙසින් ද ප්‍රකාශ කළේය. කුවේට් රජ පරම්පරාව විසින් මෙම කුමරුවා කිතු දහම වැළඳ ගැනීම ප්‍රතික්ෂේප කරන නමුත්, "අල් හකිකා" මාධ්‍ය ජාලය විසින් එය සත්‍ය බැව් ද සනාථ කොට ඇත. තවද ඉරාණයේ "මොහබත් ප්‍රවෘත්ති" මාධ්‍ය ජාලය විසින් ද අබ්දුල්ලා අල් - ෂබා නම් කුවේට් රජ දරුවා කිතු දහම වැළඳගෙන ඇති බැව් ද සනාථ කොට ඇත. තවද ඇතැම් ස්වාධීන අරාබි ප්‍රවෘත්ති ආයතන විසින් ද කුවේට් රජ පවුලේ මෙම කුමරුවාගේ සිත් හැරීම වාර්තා කරති බැව් ද දැක්වේ. අරාබි කරය පුරා කිතුනු පීඩනය මෑත කාලයේ දී ඇඩි ලෙස වර්ධනය වී තිබුණත්, චන්ද්‍රිකා මාද්‍ය ජාලය වැනි සංනිවේදන මාර්ගයන් ඔස්සේ කිතු දහම ජනයා අතරට ගෙන යාම බලවතුන්ට පවා වලකාලීමට නොහැකි වී ඇතැයි වාර්තා වේ. නවීන විද්‍යුත් මාධ්‍ය ජාලයන්ට හුරු වී සිටින තරුණ තරුණියන් විශාල වශයෙන් ජේසුන් වහන්සේ අන්තර් ජාලය තුළින් හමුවීම වැළැක්වීමට බැරි බැව් රජ පවුලක කුමරුවාගේ සිත් හැරීමෙන්ම අවබෝධ වනු ඇතැයි ද වාර්තා වේ.



## මැක්සිකෝවේ දහම් සේවා යුවළක් මරා දැමේ

හැත්තෑ හය හැවිරිදි ජෝන් කඩියාස් සහ හැට හත් හැවිරිදි වොන්ඩා කැසියාන් නම් යුවල බැප්ටිස් සභාවේ දහම් සේවකයන් ලෙසින් 28 වසරක් සේවයෙහි යෙදී සිටියහ. පසුගිය ජනවාරි මස 31 වෙනිදා ඔවුන්ගේ නිවසට කඩා වැදුනු කීප දෙනෙක් ඔවුන් දෙපළ ඝාතනය කොට මුදල් ද, බඩු බාහිරාදිය ද, වාහනයක් ද පැහැර ගෙන පළා ගියහ.

ඔවුන් ජීවත් වෙන ප්‍රදේශය පුරා මත් ද්‍රව්‍ය පැතිර පවතින අතර ඊට එරෙහිව මෙම යුවළ ජනතාව දැනුවත් කිරීමේ ද නියැලී සිටියහ. මත් ද්‍රව්‍ය ජාවාරම් කරුවන් විසින් නිරන්තරයෙන් කිතු දහමට විරුද්ධව කටයුතු කරනු ලබන්නේ ඔවුන්ගේ එම ජාවාරමට කිතුනු උගැන්වීම් හරස් වන නිසාය. සතියකට ඉහතදී මත් ද්‍රව්‍ය භාවිතයට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට පියවර ගත් ප්‍රදේශයේ නගරාධිපති වරයා ද ඝාතනය කර තිබිණි.

මෙම තත්ත්වය යටතේ, එළැඹ ඇති තර්ජනයට මුහුණ දීම සඳහා ප්‍රදේශයේ කිතුනු නායකයෝ පෙරමුණ ගෙන සිටිති.

## කතෝලික බැංකු කළමණාකරුවෙක් එපා යයි ඔහුගේ රථයට ගිනි

සති කීපයකට ඉහත දී පකිස්තානයේ ලාහෝර් හි දි බැංකුවක කළමණාකරුවකු වශයෙන් කතෝලිකයකු පත් කැරුණා. ඔහු උපාධිධරයෙක්, බැංකු කළමණාකරණය පිළිබඳ අධ්‍යනය හා පළපුරුද්ද ලබා ඇත. එහෙත් ඒ කිසිවක් ඉස්ලාම් ත්‍රස්තයන්ට එලක් නොවීය.

'තනතුර අතහැර යා යුතුයි. නැතිනම් මුළු පවුලම විනාශ කරනවා.' ඔහුට ලැබුණු දුරකථන පණිවුඩ වල එලෙස සඳහන් විය. ඔහුගේ බිරිඳ පාසල් ගුරුවරියකි. ඔහුගේ හය හැවිරිදි දුව පාසල් යයි. දැන් දැන් ඔහුට ලැබී ඇති සටහන් වල කියැවෙන්නේ ඔහුගේ දියණිය පැහැරගෙන මරා දමන බවයි. එම තර්ජන ක්‍රියාවට නංවන බැව් තහවුරු කරමින් පසුගිය දා රාත්‍රියේ බැංකු කළමණාකරුගේ රථය ගිනි තබා විනාශ කර තිබිණි.

ත්‍රස්තයන්ගේ අණ නොපිළිපැද්ද නිසා දැන් ඔහුගේ හා පවුලේ අයගේ ජීවිත වලට තව තවත් තර්ජන එල්ල වෙමින් පවතී. එම නිසාවෙන් රැකියාව අතහැර දමා බිරිඳ හා දුවණිය සමඟ සැඟවී ජීවත් වේ.

## 2011 දී පකිස්තානයේ සුළුතර ආගමික හිංසනය උග්‍ර යි.

පකිස්තානයේ සමාජ ගත කොට ඇති ඒක පාක්ෂික ආගම් පරිභව නීතිය නිසා සුළුතර ආගමිකයන් විශාල සංඛ්‍යාවක් 2011 වර්ෂය පුරා දරුණු පීඩාවන්ට පත්ව ඇත. මෙම "කලු නීතිය" යටතේ පසුගිය වසරේ සුළුතර ආගමිකයන් 161 දෙනෙක් සිරභාරයට ගෙන 09 දෙනෙකු මරා දමා ඇත.

මෙම සංඛ්‍යාව සනාථ කරනු ලැබ ඇත්තේ, ආසියානු මිනිස් අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව විසිනි. එම හෙළිදරව්වට අනුගත වෙමින් අනවර්ථ නමකින් මුස්ලිම් ජාතික නීතිඥ මහතෙකු විසින් කිතුනු පුවත් වලට පවසා ඇත්තේ, එල්ල කොට ඇති චෝදනා වලින් 95% ක් බොරු චෝදනා බවය. සුළුතර ආගමිකයන් පීඩාවට ලක් කිරීමත් සමඟ මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියාකරුවන් හා මාධ්‍යවේදීන් ද නිරන්තරයෙන් හිංසාවට පත් කැරෙනා බැව් ද එම කොමිෂන් සභාව විසින් වාර්තා කරැත.

වර්ෂ 2011 දී මිනිස් අයිතිවාසිකම් හුවා දක්වන ලද ක්‍රියා කරුවන් 18 දෙනෙක් ද, මාධ්‍යවේදීන් 16 දෙනෙක් ද මරා දමා ඇතැයි ආසියා මිනිස් අයිතිවාසිකම් කොමිෂන් සභාව විසින් ද හෙළි දක්වා ඇත. තවද කිතුනු හා හින්දු දැරියන් 1800 ක් පමණ සංඛ්‍යාවක් පැහැරගෙන ගොස් අපචාරයට ලක් කොට බලෙන් ඉස්ලාම් දහමට හරවා ඇතැයි ද එම වාර්තාවෙන් කියැවේ. එබැවින් පකිස්තානයේ අධිකරණ ක්‍රියාවලියේ සංශෝධනයක් ඇති කිරීමේ කාලය දැනටමත් ඉක්ම ගොස් ඇතැයි ද ආසියානු මිනිස් අයිතිවාසිකම් කොමිසම අවධාරණය කරයි.

## නිරන්තරයෙන් පසුම්බියේ තබා ගන්නා ඇදැහිල්ලේ "හැඳුනුම් පතක්"

බ්‍රිතාන්‍ය කතෝලික සභාව නව ආරයේ ඇදැහිල්ලේ හැඳුනුම් පතක් සිය ඇදැහිලිවන්තයන්ට ලබා දෙයි. එම ඇදැහිල්ලේ හැඳුනුම්පත් ලක්ෂ 10 ක් පෙබරවාරි මාසය තුළදී පදවි 24 ක ඇදැහිලිවන්තයන්ට නොමිලේ ලබා දෙනු ඇත. "මුදල් කාඩ් පත් ඇතුළු විවිධ අන්‍යතා හැඳුනුම් පත් සෑම දෙනා ලඟ තබා ගන්නා අයුරු දැක පුරුදු දර්ශනයකි. මෙම ඇදැහිල්ලේ හැඳුනුම්පත් මඟින් අපි කිතු තුමන්ගේ අනුගාමිකයකු බව අපි එකිනෙකාට මෙන්ම, අනෙක් අයට ද හුවා දැක්වීමක් ලෙස ගිණිය හැක." ඇදැහිල්ලේ හැඳුනුම් පත හඳුන්වා දෙමින් එම අදහස් ප්‍රකාශ කරනු ලැබුවේ, බ්‍රිතාන්‍යයේ දහම් ප්‍රචාරය පිළිබඳ දෙපාර්තමේන්තුවේ සභාපති අතිඋතුම් ක්‍රිරාන් කොන්රි රදගුරු හිමිපාණන් විසිනි.

මෙම ඇදැහිල්ලේ හැඳුනුම් පත "බැංකු මුදල් කාඩ්" ප්‍රමාණයේ එකකි. එහි එක පැත්තක දැක්වෙන දෑ මෙසේය. "ජේසුස් වහන්සේ හඳුනා ගැනීමේ ප්‍රීතිය බෙදා ගන්න, නිරන්තරයෙන් යැදුමේ යෙදෙන්න, නිරන්තරයෙන් සක්‍රමේන්තු ලබා ගන්න, තමාට මෙන් අන් අයට ද ප්‍රේම කරන්න, ලබා ඇති දීමනා බෙදා ගන්න, කිතු සමිඳුන් මෙන් නිරන්තරයෙන් සමාව දානය කරන්න" වශයෙනි.

හදිසි අවස්ථාවකදී කතෝලික පියතුමෙකුට දැන්වීම සඳහා, හිමිකරුගේ ඇමතුම් විස්තර ද වේ. 2012 ඔක්තෝබර් මාසයෙන් ඇරඹෙන ඇදැහිල්ලේ වර්ෂය සඳහා ගනු ලබන ඇදැහිල්ලේ ක්‍රියා වලියේ එක් පියවරක් වශයෙන් මෙම ඇදැහිල්ලේ හැඳුනුම් පත හැඳින්විය හැකි බැව් ද කතෝලික පුවත් වාර්තා කරයි. තවද අතිඋතුම් කොන්රි රදගුරු හිමිපාණෝ මෙළෙසින් ද අවධාරණය කරත්." කවුරුන් ඉදිරිපිටදී හෝ සිය පසුම්බිය පාවිච්චි කරනා සෑම විටකදීම තමන්ගේ ඇදැහිල්ල ප්‍රකාශ කිරීමට අවස්ථාවක් උදා වෙනවා. කවුරුන් හෝ කිතු දහම ගැන ඇසුවහොත් ඇදැහිල්ලේ හැඳුනුම් පත දක්වමින් කරුණු ඉදිරිපත් කළ හැකි වෙනවා."

## ගර්ජන හමුවේ පිලිපීන කතෝලිකයෝ "ජේසු ප්‍රතිමාව" සමඟින් වීථි පුරා

පිලිපීන ජනාධිපතිගේ ඉල්ලීම ද නොතකා, ලක්ෂ 30 කට වැඩි කතෝලිකයෝ "නාසරෙත් ජේසු" නම් ප්‍රතිමාව රැගෙන කිලෝමීටර් 5 කට වැඩි දුරක් වීථි පෙරහැරක් පසුගියදා පැවැත්වූහ. මැනිලා හි මුහුදුකරයේ රිෂාල් පිටියේ, අතිඋතුම් ලුවි අන්තෝනියෝ අගරදගුරු හිමිපාණන් විසින් පවත්වනු ලැබූ දිව්‍ය යාගයෙන් පසුව පෙරහැර ආරම්භ කැරිණි. "නාසරෙත් ජේසු" නම් එම ප්‍රතිමාව වර්ෂ 1606 දී මැක්සිකෝවෙන් මැනිලාවට රැගෙන විත් ඇති බැව් විශ්වාස කැරේ. එලෙස ගෙන ආ නැව මුහුදේදී ගිනිබත් වූවත් ප්‍රතිමාව දැවී ගොස් නොමැත. ප්‍රතිමාවේ තැන් තැන් හි ගිනි සළකුණු පමණක් දක්නට ලැබේ. දෙවැනි ලෝක මහා යුද්ධයේදී ද මෙම ප්‍රතිමාව බෝම්බ ප්‍රහාර වලට ලක්වී ඇතත් විනාශ වී නොමැත. එබැවින් "නාසරෙත් ජේසු" ප්‍රතිමාව ප්‍රාතිහාර්ය ජනක ලෙසින් පිලිපීන කතෝලිකයන්ගේ ජීවිත වලට බලපා ඇත.

දක්ෂිණ පිලිපීනයේ ත්‍රස්ත කණ්ඩායම් විසින් පෙරහැරට පහරදීමට සැළසුමක් ඇති හෙයින් පෙරහර නවතාලීම සඳහා ජනාධිපති වරයා විසින් ඉල්ලීමක් කරනු ලැබුවත් කතෝලික ජනතාව සිය අදැහිල්ලේ බලයෙන් එම පෙරහැර පැවැත්වීමට තීරණය කළෝය. අල් කයිදා කණ්ඩායමේ ද සහය ත්‍රස්තයන්ට ඇතැයි පැවැසුව ද පිලිපීන කතෝලිකයෝ සිය ඇදැහිල්ලේ පෙරහැර නිර්භයව පැවැත්වූහ. මේ අතරතුරේ දී රජය විසින් සියලු ආරක්ෂක සංවිධාන සළසා තිබිණි. 15,000 කට වැඩි ආරක්ෂක භටයෝ සීරුවෙන් සිටියහ. සියළු ආකාරයේ ආචාර වෙඩි මුරවල් ද, ජංගම දුර කථනද තහනම් කර තිබිණි. මේ සියළු ක්‍රියාකාරකමක් හමුවේ ඇදැහිල්ලේ බලය ජය ගනිමින්, "නාසරෙත් ජේසු" රැගත් කතෝලික පෙරහැර සාර්ථක වූයේ ආසියාවේ බහුතර කතෝලික ජනතාව වෙසෙන දේශය පිලිපීනය යයි නැවතත් සහතික කරමිනි.

## හින්දු ත්‍රස්ත සිසුහු කිතුනු පාසල් හා ගුරුවරුන්ට පහර දෙති

ඉන්දියාවේ ජනතා භාරත පක්ෂයට අයත් අන්තවාදී සිසු පිරිසක් ජනවාරි මස 31 වෙනිදා කර්නාටක හි ශාන්ත ජෝශප් විදුහලටත්. වහම්ස්ගාර්ත් හි නිර්මල බාලිකා විදුහලටත් පහර දුන්නෝය. එම පහරදීම් හේතු කොට ගෙන පාසල් ගොඩනැගිලි කැඩී බිඳී ගිය අතර ඇතැම් පාසල් දරුවන් හා ගුරුවර ගුරුවරියන් තුවාල ලබා ඇත.

මෙම සාපරාධී ක්‍රියාවන්ගෙන් පාසල් ගොඩනැගිලි හා පාසල් දරුවන්ට සිදුවන හානි වලකාලීමට බලධාරින් විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගන්නා අතර, එබඳු ත්‍රස්ත ක්‍රියාවන්ට භාරතීය ජනතා පක්ෂයේ අනුබල ලැබෙන බව සුපතළ සත්‍යයකැයි, ඉන්දීය ජගත් කිතුනු සංසදයේ සභාපති කේ. ජෝර්ජ් මහතා පවසයි. "අකිල් භාරතීය විද්‍යාර්ථී පරිෂාද්" යන අන්තවාදි හින්දු ශිෂ්‍ය ව්‍යාපාරය භාරතීය ජනතා පක්ෂයේ ආශිර්වාදය සහිතව කිතුනු පාසල් දරුවන්ට හා ගුරුවරුන්ට බොහෝ තන්හි දී හිරිහැර කිරීම නිරන්තරයෙන් කරනු ලබන බැව් ද ඉන්දීය කිතුනු සංසදය විසින් අවධාරණය කැරේ.

එසේ හිරිහැර කිරීමට මොනයම් හෝ කුඩා කරුණක් උත්සුක වන බැව් ද පෙනී ගොස් ඇත. කර්නාටක හී ශාන්ත ජෝශප් විද්‍යාලීය විදුහල්පති ජේසු නිකායික ගරු මෙල්වින් මෙත්දෙන්කා පියතුමා සිර බාරයට ගතයුතු යයි කෑ මොර දෙමින් පාසලට පහරදී ඇත්තේ එතුමා පූජකයෙකු නිසා මිස අන් කරුණක් නිසා නොවේ. නිර්මල බාලිකා විදුහලේ විදුහල්පතිනිය ද සිර භාරයට ගැනීම සඳහා පාසලට පහර දී ඇත්තේ ඈ ප්‍රැන්සිස්කාන නිකායේ ගරු සහෝදරියක් වීම නිසාය.

## උතුරු කොරියාවේ නව පාලනයෙන් ආගමික නිදහස ලැබේ ද?

දස වසරකට වැඩි කාලයක් පුරා, ලෝකයේ වෙසෙන කිතුනුවන් දරුණුතම පීඩනයට පාත්‍ර කරනු ලබන දේශය උතුරු කොරියාව වශයෙන් වාර්තා වේ. ජාත්‍යන්තර ආගමික නිදහස පිළිබඳ කොමිෂන් සභාව විසින් උතුරු කොරියාව වෙත ආගමික නිදහස ඉල්ලා ඉදිරිපත් කරන ලද ආයාචනය උතුරු කොරියානු නව නායක 20 හැවිරිදි කිම් ජෝං යුං වෙත ඉදිරිපත් කරැත.

නව නායකයා සමඟ ජාත්‍යන්තර සුහදතා පිළිබඳ කතිකාවත් හි ආගමික නිදහස පිළිබඳ කාරණයට ප්‍රමුඛත්වය දෙන ලෙසට ඇමෙරිකාන ජනාධිපති වරයා ඇතුළු ලෝක නායකයන්ගෙන් ද ඉල්ලීමක් වේ. නව නායකයාගේ පියා ද සීයා ද විසින් උතුරු කොරියාව වසර 63 ක කාලයක් පාලනය කොට ඇත.

ඇත්තෙන්ම උතුරු කොරියාව පවුල් බල වාදයේ ප්‍රමුඛ ස්ථානයක් ගන්නා බැව් වාර්තා වේ. න්‍යෂ්ටික අවි ආයුධ තනමින් අද්විතීය බල හමුදාවක් ගොඩනැඟීමට සකල සම්පත් වියදම් කිරීමේ හේතුවෙන් පසුගිය වසර ගණනාව තුළ දී මිලියන 2 කට වැඩි සංඛ්‍යාවක් සාගින්නෙන් විනාශ වු බව ද වාර්තා වේ. තවද ලක්ෂ දෙකකට වැඩි සංඛ්‍යාවක් සිර ගෙවල් වල සිර කර ඇති අතර ඉන් 70,000 ක් පමණ ජනතාව කිතුනුවන් බැව් ද හෙළි දැක්වේ. එහෙත් උතුරු කොරියාවේ මිලියන 20 ක් පමණ වන ජනගහනය තුළ රහසේ සිය ඇදැහිල්ල තුළ ජීවත් වෙමින් එකිනෙකාට සාක්ෂි දරන කිතුනු සංඛ්‍යාව 200,000 කට වැඩි යයි කිතුනු පුවත් විසින් වාර්තා කරැත.

විශේෂාංග

ප්‍රදීප චරිත කතා

# සෙංකඩගලට පෙම්බැඳි "සුදු සුවාමි"

*මීට දශක පහකට, හයකට පමණ පෙර අපේ ගම් පලාත් වල නිතර දැකිය හැකි දසුනක් වූයේ සුදු දිග රැවුලක් සහිතව පාපැදියක හෝ බස්තමක් අතැතිව පාරතොටේ හමුවන සෑම ළමා ළපටි, වැඩිහිටි කාටත් තම නමින්ම අමතමින් ගම වටා යන "සුදු සුවාමි" කෙනෙකි. ගම් වැසි සැමගේ ආදරයට පාත්‍ර වූ උන්වහන්සේලා සැබවින්ම මිනිසුන්ට ආදරය කළ මිනිසාගේ මිනිසත් කමට ගරු කළ සැබෑ මානව හිතවාදී මිනිසුන් විය.*

## අභියෝග භාර ගැනීම

ඒ වන විට මෙරට කිතු සසුන පෝෂණය කරමින් ජනතාව වෙත සමිඳුන්ගේ ආදරය නිසි අයුරින් වටහා දීමට අවශ්‍ය වූ දේව ජනතා සේවකයින් යුරෝපීය රට වලින් අප රටට ගෙන්වා ගැනීමට සිදුවී තිබුණි. සැබවින්ම එම කාර්යය එක්තරා ආකාරයකට අභියෝගාත්මක විය. මන්ද යුරෝපයේ සියලු සැප සම්පත් අත හැර තම විශ්වාසයට හා පිළිගැනීමට අවනතව අතිශය දුෂ්කර කාර්යය භාරයක් සඳහා පැමිණීමට මිනිසුන් ලෙස කවරකු අවනත වේද යන්න එක්තරා ආකාරයකට ප්‍රශ්නාර්ථයකි. එහෙත් එවැන්නක් ඉතිහාසයේ සිදුවී ඇත. මානව ඉතිහාසයේ විශ්වාසය තුළ අභියෝග භාරගත් මිනිසා ලෙස ශුද්ධ බයිබලය ඉදිරිපත් කරනු ලබන්නේ ආබ්‍රහම් නම් පීතෘවරයා ය.

"සමිඳාණන් ආබ්‍රහම්ට කතා කොට නුඹේ මව් බිමෙන් ද, නුඹේ නෑසියන්ගෙන් ද, නුඹගේ පියාගේ ගෘහය ද අතහැර මා පෙන්වන දේශයට යන්න" එය සැබවින්ම ආබ්‍රහම්ට අභියෝගයක් විය. සිත තුළ චකිතයක් ඇතිවූවාට ද සැකයක් නොමැත. එහෙත් සමිඳාණන් තුළ විශ්වාසය මත ඔහු ඒ දුෂ්කර මෙන්ම භයානක ගමන යාම සඳහා පිටත් විය. සැබවින්ම එය අතුරේ යන ගමනක් විය.

ඒ මඟම යමින් සුදු සුවාමිලා ද ඇඩි අධිෂ්ඨානයකින් හා විශ්වාසයකින් තමන් වෙත පැමිණි අභියෝගය බාර ගෙන සත් සමුදුර තරණය කරමින් අපට රටට පැමිණිය හ.

එසේ පැමිණියේ සංචාරය සඳහා නොව අප සැම ශාරීරිකව, මානසිකව හා ආධ්‍යාත්මිකව යන ත්‍රිත්ව සංවර්ධනයට යොමු කරමින් පූර්ණ මිනිසුන් සෑදීමේ මහා කර්තව්‍යයට උර දීමට ය. එසේ පැමිණි ඔවුන් තුළ දිස්වූයේ සැබවින්ම ජේසු ප්‍රකාශ කළ පරිදි "දේව රාජ්‍යය ප්‍රකාශ කරන ලෙස ජනතාව සොයා යන්න. එසේ යන විට කිසිත් රැගෙන නොයන්න. ඔබව පිළිගන්නා අය හා රැඳෙන්න." මෙහි අන්තර්ගතව ඇති සැබෑ අරුත වන්නේ එසේ ගිය විට එම ස්ථානයේ ජන ජීවනය හා සංස්කෘතීන් තුළට මාංශගත වීමට ඇති හැකියාවත් ඒ තුළින් එම ජන කණ්ඩායම් හා ඇතිකර ගන්නා වූ ඒකාග්‍රතාව තුළින් තම සේවාව ඉතා පුළුල් ලෙස තර ගැනීම සඳහා ඇති කර ගත හැකි හැකියාව ය. මේ වන විට පේදුරුතුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වා මුළු ශ්‍රී ලංකාව පුරාම ගොඩනගා ඇති ඒ සුවිසල් දෙව්මැදුරු, අධ්‍යාපනික ආයතන, සමාජ සත්කාරක සේවා ආයතන සියල්ලම නිහඬව ප්‍රකාශ කර සිටින්නේ මේ සුදු සුවාමිලා තුළ වූ කැපවීමත් කාර්යයේ තිබූ හසල දැනුමත් ය. මේ මොහොත වන විට කවුරු විසින් කට කයිවාරු දෙඩූව ද මේ භූමිය තම මාතෘ භූමිය කරගත් සෑම ජන කොටසකටම තම ආගමික විශ්වාසයන්ට හා සංස්කෘතික අගයන් කිසිම ආකාරයක බලපෑමකට යටත් නොවී, කිසිදු භේදයකින් තොරව පුළුල් අධ්‍යාපනයක් හා ආචාර ධර්ම වලින් පිරි හික්මීමක් සහිත සැබෑ මිනිසුන් ලෙස යම්තාක් දුරකට හෝ ජීවත් වීමට හැකි භූමියක් බවට පත්ව ඇත්තේ එම කිතුනු අධ්‍යාපන ආයතනත් ඒවා තුළ කටයුතු කළ ඒ සුදු සුවාමිලා තුළ තිබූ කැපවීම බව කෘතවේදී වූ ශ්‍රී ලාංකික ජනතාව පිළිගනී.

අප අතර ජීවත් වෙමින් අපගේ දුක් වේදනා, සතුට, සොම්නස හා මාංශගත වෙමින් තම ශ්‍රමය ආධ්‍යාත්මය පමණක් නොව මුළු ජීවිතයම කැප කළ ඒ යති වරුන් අවසන තම සිරුර පවා අප මාතෘ භූමියටම දිරා යෑමට ඉඩ හැරීමට තරම් පරිත්‍යාගශීලි වූ ඒ සුදු සුවාමිලා සැබෑ ක්‍රිස්තු අනුගාමිකයෝ ම වූහ.

මෑතක් වන තුරු මහනුවර ප්‍රදේශයේ ජීවත් වන අයට සුපුරුදු දසුනක් විය. සෑම සන්ධ්‍යාවකම කුඩයක් අතින් ගත් සුදු සුවාමි කෙනකු නුවර වැව වටා ඇවිදගෙන යන අයුරුයි. ඔහු ප්‍රංශයේ පුලුගුයුඉන් නම් ගොවි ගම්මානයෙහි 1924 පෙබරවාරි මස 25 වන දින ෆැන් හොයිස් මාරි හා මාරි ඇන් බෙච්ගුයික් මාපියන්ට පුත්‍රයා ලෙස උපත ලදී. ගමේ පාසලෙන් අධ්‍යාපනය ලද මේ දරුවා අන් දරුවන් සේම යුධ හමුදාවට බැඳුණේ ඒ වන විටත් යුරෝපයම වසා ගෙන යමින් තිබූ හිට්ලර්ගේ මූලධර්මවාදී නාසි ව්‍යාපාරයට එරෙහිව සියලුම ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් පෙරමුණ ගනිමින් සිටි නිසාවෙනි.

යුධ පෙරමුණ තුළ විශාල කාර්යය භාරයක් ඉටුකළ මාටින් කියුරේ නම් මේ තරුණයා නාසීන් අතට පත් විය. එහිදී ඔහු ලද අත්දැකීම අති බිහිසුණු මෙන්ම අභිරහස්මය අත්දැකීමක් විය. සියලු යුධ සිරකරුවන්ගේ දෑත් හා දෙ ඇස් බැඳ පෙළට සිටුවා මරා දැමීම ඇරඹින. එක් එක් සිරකරුවාට තබන වෙඩි හඬින් මාටින් කියුරේ ද තමා වෙත පියවරින් පියවර පැමිණෙන ඝාතකයාට මුහුණ දීමට සූදානමින් සිටියේය. දෙසවන් දෙදරවාගෙන තමා අසළ සිටි පුද්ගලයාට වෙඩිල්ල පත්තු වූ විට ඊළඟ වෙඩිල්ලට සූදානම් වීම සඳහා මේ ධෛර්යවන්ත තරුණයා සූදානමින් සිටියේය. කාලය ගෙවී ගියේය. එහෙත් තමා වෙත එල්ල කළ තුවක්කුවෙන් හඬ නිකුත් නොවීය. බයෙන් බිරාන්තව සිටියා මිස එනතෙන සිදුවූයේ කුමක්දැයි නොදත්බව මේ නොසැලෙන මිනිසා පැවසීය. දැනට ද මේ සුළු හඬකින් පවා තැති ගැනීමකට ලක් වන බව අත්දැකීමෙන් මම ද දනිමි.

එලෙස අභිරහස්මය ලෙසින් ජීවිතය රැකගත හැකි වූ මේ මිනිසා තම ඇතුළු හද ගැබින් එන හඬට අවනත විය. 1948 පෙබරවාරි මස 29 දින නි.ම.නි. සාමාජිකයකු ලෙස දේව ජනතා සේවය සඳහා පූජකවරය ලැබීය. වර්තමානයේ බොහෝ දෙනෙකුට සුව පහසුව සතුට හා ආරක්ෂාව සපයා ගත හැකි මඟක් කරගෙන ඇති පූජාත්වරය මාටින් කියුරේ නම් මේ මිනිසා තමා ලද කැඳවීමට තම මුළු ජීවිතයම කැප කරමින් පූජාත්වරය නම් වූ ඒ අභිරහස්මය ක්‍රියාදාමය මිනිසාගේ නිදහස හා විමුක්තිය වෙනුවෙන්ම කැපකිරීමට සමත් විය.

එම ක්‍රියාවලියේ දී උන්වහන්සේ මුහුණ දුන් පීඩාවන් සිත් තැවුල් ගා වේදනාවන් දරා ගනිමින් තමා වෙත පැමිණි සියලු දුක් දොම්නස් සතුටු සොම්නස් බවට පෙරළා ගැනීමට හා ඒ තුළින් උපදිනා ආධ්‍යාත්මික ප්‍රබෝධය සෑම මිනිසෙකුටම දානය කිරීමට තරම් බැගෑපත් විය. එසේ ජීවිතය කැප කළ මේ සුදු සුවාමි ජේසු හඬට කන් දෙමින් ධර්ම දානය, බුද්ධි දානය හා බැඳුණු මහා සේවා රැසකට උර දෙන්නට තම පීතෘ භූමියේ සිට සැතපුම් දහස් ගණනක් ඈත එපිට පිහිටි ශ්‍රී ලංකාව නම් වූ කොදෙව්වට 1948 සැප්තැම්බර් මස ළඟා විය.

එතැන් සිට ශ්‍රී ලංකාව තම මාතෘ භූමිය කරගත් මාර්ටින් ක්‍යුරේ පියතුමා මෙරට ජන ජීවිතය හා බද්ධ වෙමින් ජනතාවගේ සෝ සුසුම් දුක් කම්කටොළු වේදනා මෙන්ම සතුට සොම්නස ද සැබෑ දේව ජනතා සේවකයෝ ලෙස ජනතාව හා මාංශ ගත විය.

## මහා ඉතිහාසඥයා

1948 සිට මීසම් සේවක පියතුමකු වූ උන්වහන්සේ සාන්ත බර්නාඩ් දෙව්සත්හලේ කථිකාචාර්යවරයකු ලෙස සේවය කරමින් සිට 1958 දී මහනුවර අම්පිටිය තම ප්‍රියතම විෂය වූ ඉතිහාසය පිළිබඳ පරීක්ෂණ කිරීමත් ලංකා අප ස්වාමිදුගේ පූජක සරසවියේ කථිකාචාර්යවරයකු ලෙස මෙරටට අවශ්‍ය දේව ජනතා සේවකයන් නිර්මාණය කිරීමේ කාර්යයෙහි නියැලී සිටියේය. මානව ඉතිහාසය පිළිබඳ විද්‍යාඥයකු වූ උන්වහන්සේ කතෝලික / ක්‍රිස්තියානි සභා ඉතිහාසය හා එහි විකාශනය පිළිබඳව පරීක්ෂණ රාශියක් කර ඇත. ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳව දැනුම් සම්භාරය රාවනා යුගය සමඟ සම්බන්ධ වූ ජන ජීවිත වලටත් ඔබ්බට යමින් මෙරට විසූ බවට විශ්වාස කරන ආදි කාලීන ප්‍රාග් මානව ශිෂ්ටාචාරයේ බොහෝ කරුණු පිළිබඳව ද හසල දැනුමක් ලබා තිබිණි. උන්වහන්සේ පත පොතට ඇඩි ලෙස ඇළුම් කළ අතර තමන් වහන්සේ ජීවත් වූ සෑම ස්ථානයකම පුස්තකාලයක් ඇති කිරීමට ඇඩි වෙහෙසක් ගත් අතර ලොකු, කුඩා සැම කියවීමට දිරි ගන්වනු ලැබීය.

උන්වහන්සේගේ ඇඩි කැපවීමෙන් ගොඩනගන ලද අම්පිටිය ජාතික දෙව්සත්හලේ පුස්තකාලය ජීවමාන උදාහරණ අතරින් හොඳම උදාහරණය වේ. මේ සුදු සුවාමි මානව ඉතිහාසය පිළිබඳව අවධානය යොමු කළා සේම පරිසරය හා බැඳුණු කාලගුණයේ හා වර්ෂාපතනයේ ඇති වන වෙනස්කම් පිළිබඳව ද අවධානයක් යොමු කරනු ලැබීය. 1958 සිට විද්‍යාත්මක ක්‍රමවේද අත්හදා බලමින් එක්රැස් කරන ලද වර්ෂාපතනයේ දත්ත ඔහු සතු විය. (මහනුවර ප්‍රදේශයේ)

මේ සියල්ලෙන්ම සනාථවන සත්‍ය වන්නේ එදා ආබ්‍රහම්ට සමිඳාණන් වහන්සේ දුන් පණිවුඩයට අවනත වූවා සේ අප ආදරය කරන අප සැමගේ ගුරුවරයාණන් වූ මාටින් ක්‍යුරේ නම් සුදු සුවාමි දේව හඬ ඔස්සේ තමන්ට වෙන්වූ දේශයට පුරවරයට මාංශගත වෙමින් සැබෑ දේව ප්‍රේමයට සාක්ෂි දැරීමයි.

පුරා වසර 65 ශ්‍රී ලංකාව නම් වූ රමණීය දූපතේ සෙංකඩගල පුරවරයට ඇළුම් කළ දේව රාජ්‍යයේ වටිනාකම වන යුක්තියේ හා සාධාරණත්වයේ මිනිස් සමාජයක් සඳහා සැබෑ සාක්ෂිකරුවන් වන්නට අවැසි දේව ජනතා සේවකයන් රැසක් පේදුරුතුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වා වූ ශ්‍රී ලංකා මාතාවට නිර්මාණය කර දුන් මාටින් ක්‍යුරේ නම් වූ සුදු සුවාමි දැනට කොහුවල නි.ම.නි. නිවහනේ කාලය ගත කරමින් සිටී.

2012 වන මේ වසරේ පෙබරවාරි මස 25 දින 88 වන උපන් දිනයත් 64 වන පූජකවර සම්ප්‍රාප්තියත් සමරනා ඔබවහන්සේට ආදරණීය මතකයන් මැදින් ආසිරි පතන්නේ ඔබගේ ජීවිතය හඳුනාගත් ලාංකීය පුතුන් ය.

උස්වැටකෙයියාවේ
**සුසිල් හෙට්ටිආරච්චි**


අතිගරු මාටින් ක්‍යුරේ නි.ම.නි. පියතුමා

# දිළින්ඳන්ගේ පියා සුරලොව දිනයි



මීගමුව, දුන්ගාල්පිටිය, සෙත්තප්පාඩුව ධීවර ගම්මානයේ පිහිටි නෙදර්ලන්ත ශ්‍රී ලංකා "සන්තෝෂා" දිළිඳු ආධාර පදනමේ ශ්‍රී ලංකා පරිපාලක මානව දයාවෙන් පිරි දිළිඳු ජනතාවට ආදරණීය පියෙක් වූ විම් වැන්ඩකර් බීක් මහතා වසර 85 ක් දීර්ඝායු ලැබ 2012 ජන. 07 වන දින දෙවි සමිඳුන් තුළ සැතපුණේය.

එතුමාගේ දේහය පිළිබඳ අවසන් කටයුතු කැපුන්ගොඩ මීසම් සේවක ගරු ක්ලෝඩ් වනසිංහ පියතුමන්ගේ මෙහෙයවීමෙන් දුන්ගාල්පිටිය ශු. මරිය මග්දලේනා මුනිවරියගේ සුසාන භූමියේ දී අති මහත් ජනතා හරසර මැද සිදු කෙරිණි.

වර්ෂ 1927 දෙසැ. මස 08 වන දින නෙදර්ලන්තයේ "ඩෙන්තාක්" ප්‍රදේශයේ බැතිමත් කතෝලික පවුලක උපත ලද විම් වැන්ඩනර් මහතා මීට වසර 23 කට පෙර ශ්‍රී ලංකාවට පැමිණ, දිළිඳු ජනතාවගේ දයා සේවාව ආරම්භ කර ඇත.

ගරු මාටින් එල්සවුට් පියතුමන් විසින් 1994 දී එවකට ධීවර දිළිඳු ජන කොටස් ජීවත් වූ දුන්ගාල්පිටිය, සෙත්තප්පාඩුව ග්‍රාමය කේන්ද්‍ර කරගෙන "සන්තෝසා" ආධාර පදනම පිහිටුවීමට පුරෝගාමී වී ඇත. මෙම පදනමේ අධ්‍යක්ෂවරියක ලෙසත් ආබාධිත දරුවන්ගේ පාසලේ විදුහල්පතිනිය ලෙස ගරු ග්ලෝරියා ප්‍රනාන්දු පැවදි සොයුරිය කටයුතු කරන අතර ප්‍රදේශයේ තරුණයෙක් වන ඩී. ඩී. ගයාන් සුරංග කළමනාකරු ලෙස සේවාවේ යෙදී සිටී.

ප්‍රදේශයේ දිළිඳු දරුවන්ට නොමිලේ අමතර පංති පවත්වමින්, ආබාධිත දරුවන්ගේ පාසලක් ද පවත්වන අතර සියලු දරුවන්ට තුන්වේලම නොමිලේ ආහාර ද ලබා දීම ප්‍රදේශයේ තෝරාගත් දිළිඳු පවුල් 500 කට සෑම මාසයකම විශාල වටිනාකමකින් යුත් වියළි ආහාර පාර්සල් ලබා දීම , ප්‍රදේශයේ රෝගී අයට වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා සෑම මසකම මුදල් ආධාර ලබා දීම, විශේෂ ප්‍රතිකාර අවශ්‍ය රෝගී අයට විශේෂඥ වෛද්‍ය සේවාවන් ලබා දීම, බරපතල සැත්කම් අවශ්‍ය රෝගීන්ට ඒ සඳහා අවශ්‍ය ආර්ථික ආධාර ලබා දීම, දිළිඳු දරුවන් 300 කට පමණ පරිගණක පුහුණුව, සිංහල, ගණිතය, නැටුම්, විද්‍යාව ආදි විෂයන් සඳහා පුහුණු ගුරුවරුන් වෙතින් නොමිලේ අධ්‍යාපනය ලබා දීම. පොත් පත් 4000 කින් සමන්විත අංග සම්පූර්ණ පුස්තකාලයක් ලබා දීම උසස් අධ්‍යාපනය ලබන දිළිඳු පවුල්වල දරුවන්ට මසකට වරක් ඒ සඳහා මුදල් ආධාර ලබා දීම ආදී දයාවේ සේවාවන් රාශියක් "සන්තෝෂා" වෙතින් ලැබෙනු ඇත.

මේ සා මහත් දයාවේ සේවාවන් පරිපාලනය කරමින් දිළින්ඳන් වෙත දයාව, කරුණාව, ආදරය දැක්වූ විම් පියාණන්ගේ ආත්මයට සදාතන මෝක්ෂ සම්පත්තිය මෙසේ ප්‍රාර්ථනා කර සිටිමු.

**ජෝ. සංගපාලආරච්චි**

# සැබෑ කිතුනු මාධ්‍යවේදියා දහම ගරහන්නකු නොවේ

## නෝබට් මාවලගේ - අතීතාවර්ජනයක්



යමෙකු මියගොස් කලක් ගෙවී යන විට ඔහු හෝ ඇය පිළිබඳ මතක සටහන් ක්‍රමයෙන් වියැකී යෑම සාමාන්‍යයෙන් සිදුවන්නකි. එහෙත් සමහරුන් පිළිබඳව එය එසේ නොවේ. අදීන කිතුනු පුවත්පත් කලාවේදියකු වූ දීර්ඝ කාලයක් "ඥානාර්ථ ප්‍රදීපය" සහය සංස්කාරකවරයකු වශයෙන් කටයුතු කළ නෝබට් මාවලගේ ශූරින් ද එවැන්නෙකි.

මෙයට වසර 12 කට පෙර එනම් 2000 වසරේ පෙබරවාරි 24 වනදා අප අතරින් වියෝ වී දෙව් මව් තුරුළට ගිය නෝබට් මාවලගේ (නෝමා) සිහිපත් කිරීම අප කරනුයේ ගෞරව පූර්වක ය.

නෝබට් මාවලගේ ශූරීන් අද පුවත්පත් කලාවේදීන් හැටියට කටයුතු කරන බොහෝ දෙනකුට ගුරුවරයෙක් විය; ලිවීමේ අඩුපාඩු සෘජුවම පෙන්වා දුන් මිත්‍රයෙක් විය; තම මීසමට නැතිවම බැරිවූ දූත සේවියකු විය; ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ පුරෝගාමියකු ද විය; බිරිඳට දයාබර සැමියකු විය; දරුවන්ට ආදරවන්ත පියකු විය.

භූමිකා කීපයක සමබර ව ජීවත් වූ මාවලගේ ශූරීන් පසුකලෙක අපට සහෘදයකු විය. හමු වූ හැමවිටම ලේඛන කලාව තුළින් ඉදිරියට යාමට අපට දිරි වදන් පැවසුවේය. මාවලගේ ශූරින් ලේඛන ක්ෂේත්‍රයේ ද අංග කීපයකට හසුරු කෞෂල්‍යතා දැක්වීය. සංස්කරණයට අමතරව හෙතෙම කෙටිකතාකරණයට ද, විශේෂාංග කරණයට ද, කාව්‍යකරණයට ද එකසේ දස්කම් දැක්වූයේය. ශූර කථිකත්වයක් ප්‍රගුණ කර තිබූ මාවලගේ ශූරින් ඉතා ප්‍රසන්නව නිවේදන කටයුතු කිරීමට ද දැක්වූයේ දක්ෂතාවයකි. උත්සව සංවිධානයෙහි ද හෙතෙම දක්ෂයකු විය. මෙම කරුණු සලකා බලන කල නෝබට් මාවලගේ ශූරින් "ලොවින් එකෙක් එක් දෙයකට වෙය සමත" යන වදන බොරු කළ අයකු බව පැවසීම අතිශයෝක්තියක් නොවේ.

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි**

# "සභා මාතාව තුළ ආදරය වෙමි මම"

## මහා මෙරක් වූ කුඩා මල සහ මහා මෙහෙවර - 2

එතුමිය ජීවත් වූ තාපසාරාමය පෘථිවිය මත වූ ස්වර්ග රාජ්‍යයක් නොවීය. එය තුළ විවිධාකාරයේ චරිතයන් සමඟ එතුමියට ජීවත් වීමට සිදු විය. අප සැම කෙනෙකු මෙන් එතුමියටත් ජීවිතයේ කටුක යථාර්ථයන් සමඟ අරගල කර ඒවාට මුහුණ දිය යුතු ආකාරය සොයා ගැනීමට සිදුවිය.

ඒ සඳහා ඇයගේ මාර්ගය වූයේ ආදරයයි. අනෙකුත් මිනිසුන් සමඟ සතුටින් ජීවත් වීමේ ක්‍රමවේදය, උපාය මාර්ගය වූයේ ආදරයයි. එතුමිය අනෙකුත් පුද්ගලයන්ට ඒ පුද්ගලයන් ලෙස ආදරය කිරීමට පුරුදු විය. එතුමියට අවශ්‍ය ආකාරයට අනෙකුත් පුද්ගලයන්ව වෙනස් කර ගැනීමට නොව, ඔවුන්ගේ සැබෑ ස්වරූපයට, ස්වභාවයට ආදරය කිරීමට එතුමිය තමන්ව පුහුණු කරවන ලදී.

එතුමියගේ 'කුඩා මාර්ග ය' යනු එතුමියගේ ශුද්ධවන්ත භාවයේ මාර්ග යයි. එම මාර්ගයම එතුමියට මානසික සුවයක් සහ අධ්‍යාත්මික සෞඛ්‍ය සම්පන්න භාවයක් ගෙන දුන්නේය. අසහනකාරී ලෝකයක, අමානුෂික ලෝකයක, අධ්‍යාත්මික සුවයෙන් සහ සහනයෙන් ජීවත් විය හැක්කේ කෙසේද යන්නට මඟ පෙන්වීම එතුමියගේ අධ්‍යාත්මිකත්වයේ ගැඹුරුතම හරයයි.

එතුමිය ජීවිතයේ හැල හැප්පීම්, අරගලයන් සහ බිඳුණු භාවය තුළ ගැඹුරින් නියැලී සිටියත්, ඒවාට තම ජීවිතය පාලනය කිරීමට එතුමිය ඉඩ දුන්නේ නැත. අනෙකුත් පුද්ගලයන් එතුමියට සැලකූ ආාරයෙන් එතුමියගේ ප්‍රතිචාරයන් තීරණය වීමට එතුමිය ඉඩ දුන්නේ නැත. අනෙකුත් පුද්ගලයන්ගේ ප්‍රශ්න තුළ එරෙන්නේ නැතිව, එවායින් තමන්ගේ ජීවිතය අවුල් කරගන්නේ නැතිව, අනෙකුත් පුද්ගලයන්ට ආදරය කිරීමේ අරුම පුදුම හැකියාවක්, සුවිශේෂ දක්ෂකමක් එතුමිය සතුව තිබුණාය. මානව ජීවිතය කෙරෙහි එතුමිය සතුව පැවති ගැඹුරු දෘෂ්ටි කෝණයට පළුදු නොවන ආකාරයට, දෛනික ජීවිතයේ සංකීර්ණ යථාර්ථයන් සමඟ ගණු දෙණු කිරිමට ඉතා දුර්ලබ හැකියාවක් එතුමිය සතුව තිබුණාය.

එතුමිගේ ඉතා ගැඹුරු ජීවිත දැක්ම කිසිම හේතුවක් නිසා, කිසිම පුද්ගලයෙකුගේ අනිසි බලපෑම නිසා, එතුමිය පාවා නොදුන්නාය. එතුමියගේ ශුද්ධවන්තභාවයේ, අධ්‍යාත්මිකත්වයේ හදවත වූයේ, කේන්ද්‍රය වූයේ ජීවිතය පිළිබඳ එතුමිය සතුව පැවති ගැඹුරු දැක්මයි. එනම් එතුමිය සැම දෙයක්ම නිරීක්ෂණය කළේ සදාකාලිකත්වයේ ආලෝකයෙනි (Light of eternity), සදාකාලිකත්වයේ දෘෂ්ටි කෝණයෙනි. එනම් දෙවියන් වහන්සේ මිනිසුන් දිහා බලන ආකාරයට බැලීමට අප ඇස පුහුණු කර ගැනීමයි. ක්‍රිස්තුස් වහන්සේගේ ඇස් දෙකෙන් ලෝකය දෙස, මිනිසුන්ගේ දුර්වලතාවයන් දෙස, මානව අභ්‍යන්තර අරගලයන් දෙස බැලීමයි.

එතුමියගේ අධ්‍යාත්මික ශක්තියේ සැබෑ රහස, සැබෑ පදනම එයයි. එම දැක්ම සැම දෙයක්ම සමානුපාතිකව කිරීමට අවශ්‍ය මානසික සුවය, චිත්ත ඒකාග්‍රතාවය දානය කරන ලදී. එම දැක්ම අඛණ්ඩව පෝෂණය කිරීම සඳහා එතුමිය විසින් ගන්නා ලද තීරණයන් කිහිපයක් විය. අනෙකුත් පුද්ගලයන්ගේ



තෙරේස් තුමිය වයස අවු 13 දී ගත් ඡායාරූපයක් (1886 වසරේ දී)

ප්‍රශංසාවල් හෝ අගය කිරීම් පසු පස හඹා නොයෑමව, තමන් කරන කාර්යයට සම්පූර්ණ අවධානය යොමු කිරීම සහ අනෙකුත් පුද්ගලයන්ගේ වැඩ කටයුතු වලට අනවශ්‍ය ලෙස ඇඟිලි නොගැසීම, තමන්ගේ ශ්‍රමයේ ක්ෂණික ප්‍රතිඵල දැකීමට ඇති ආශාවෙන් බැහැර වීම, අනෙකුත් පුද්ගලයන් සමඟ ගැටිය යුතු ආකාරය ගැන ඉතා ප්‍රඥාවන්තව තෝරා බේරා ගැනීම (Knowing how to choose one's battles wisely) සහ අනෙකුත් පුද්ගලයන්ට කිව යුතු දේවල් සහ නොකිව යුතු දේවල් ඉතා ඉවසීමෙන් සහ බුද්ධිමත්ව තීරණය කිරීම ඒවා අතර වේ.

මේ සියළුම දේවල් ඇයට අධ්‍යාත්මික සෞඛ්‍යය සහ මානසික සුවය ලබා දෙන ලදී. එමෙන්ම ඊට තවත් හේතුවක් වූයේ එතුමිය තම යහපත් ක්‍රියාවන් සඳහා කිසිදු ප්‍රශංසාවක්, ප්‍රතිලාභයක් අපේක්ෂා නොකිරීමයි. දෙවියන් වහන්සේ එතුමියගෙන් බලාපොරොත්තු වන දේ ගැන පමණක් සිත යොමු කිරීමෙන්, එම ක්‍රියාවෙන් ලැබෙන ප්‍රතිඵල ගැන තැකීමක් නොකිරීමෙන්, එතුමිය අනවශ්‍ය ලෙස කරදර වූයේ නැත. අප ක්ෂණික ප්‍රතිඵල බලාපොරොත්තු වේ නම් අප ඇතුලාන්තයෙන්ම නිදහස් නැත. අප අපේක්ෂා කරන දේවල් විසින් අපව වහල් භාවයට පත් කරනු ලබයි. අනවශ්‍ය අපේක්ෂාවන් අධික වන තරමට කලකිරෙන ප්‍රමාණයද අධික වේ. එවිට අපගේ ඇතුලාන්ත නිදහසද අපට ක්‍රමයෙන් අහිමි වේ.

අපට කළ හැකි සැම ප්‍රයත්නයක්ම අප විසින් කළ යුතු වේ. නමුත් එම සැම ප්‍රයත්නයක්ම සාර්ථකත්වයට පත් වේ යැයි අප විසින් සිතිය යුතු නැත. ප්‍රයත්න දැරීම දිගටම කරගෙන යා යුතුය. නමුත් අප වැටීමට හැකි බව හෝ අසමත් විය හැකි බව සිත්හි නිධන්ව තබා ගත යුතුයි. සමහර පුද්ගලයන් මෙය විහිළුවක් යැයි සිතිය හැක.

අප අසමත් වන බව දන්නේ නම් උත්සහ කිරීමෙන් ඇති ප්‍රයෝජනය කවරෙක්ද? මෙය අධෛර්‍යමත් වීමට සහ කලකිරීමට නිශ්චිත මාර්ග යක් නොවන්නේ ද? එතුමිය මෙයට දෙන පිළිතුර නම් 'නැත' යන්නයි. සත්‍ය වශයෙන්ම කියනවානම් එම මාර්ගය කලකිරීමෙන් මිදීමට එතුමිය භාවිතා කරන ලද පිළියම වේ.

කලකිරීම අසාර්ථක වීමේ ප්‍රතිඵලයකි. එතුමියට අනුව උත්සහ දැරිම සහ ඉලක්කය එකම දෙයක් වන්නෙහිය. ඒ දෙක වෙන්කළ නොහැකිය. මාර්ගයත්, අරමුණත් දෙකම එකය. අවසාන විග්‍රහයේ දී අවසාන අරමුණ වන්නේ මාර්ගයයි අපගේ ඉලක්කය වන්නේ, යම්කිසි දෙයක් නිම කිරීමනම් එවිට එමඟින් කලකිරීමේ බීජ වපුරනු ලබයි. හේතුව අප ඉදිරියට යන්නේ නැත්නම්, වැඩිදියුණු වන්නේ නැත්නම් අපි අසමත් වෙමින් පවතින බව අපට හැඟේ. නමුත් අපගේ ඉලක්කය උත්සහය නම් එවිට යමක් සඳහා උත්සහා දැරීම තුළින්ම අපගේ ඉලක්කයට ළඟා විය හැකි බව අවබෝධ වේ.

එතුමියගේ අදහස නම් යමක් පටන් ගැනීමටත් පෙර ප්‍රතිඵල ගැන කරදර වීමේ මානසිකත්වය අප විසින් අත්හැරිය යුතු බවයි. එවැනි ඇතුලාන්ත උපේක්ෂා සහගත ආකල්පයන් අපව මානසික සුවය තුළ රදවා තබයි. අප කරන්නාවූ සැම දෙයකම ප්‍රතිඵල දැකීමේ ආශාවෙන් දුරස්ත වීමෙන් අපට පාලනය කල නොහැකි දේවල් වලින් මිදීමට අපට හැකිය. එතුමිය පවසන සැම දෙයක්ම මිනිසුන් විසින් පිළිනොගන්නා බව එතුමිය දැන සිටියාය. නමුත් එතුමිය විසින් කරන ලද්දේ දෙවියන් වහන්සේ එතුමිය ලවා ප්‍රකාශ කර විමට උවමනා වචන ප්‍රකාශ කිරීමයි. ඉන් ඔබ්බට එතුමිය කරදර වූයේ නැත.

සුබාරංචියේ සඳහන් වන වපුරන්නා මෙන් එතුමියට කළ හැක්කේ බීජ වැපිරීම පමණක් බව අවබෝධ විය. අපගේ ක්‍රියාකාරකම් වල ඵලදායි බව පදනම් වන්නේ ඒවා වපුරන භූමියේ ස්වභාවය මතයි. අපගේ වචන බීරන්ගේ කන් මත පතිත වුවහොත් යටිගිරියෙන් කෑ ගැසුවත් කිසිම දෙයක් ඉටුකර ගත නොහැක. අපට පාලනය කළ නොහැකි දේවල් සම්බන්ධයෙන් කරදර නොවීම යනු අනවශ්‍ය මැසිවිලි හැඟීම් වලින් මිදීමයි.

හරියාකාරයේ කරදර වීම් වලින් අනවශ්‍යාකාරයේ කරදර වීම් තෝරා බේරා ගැනීම නිසා එතුමිය තුළ ගැඹුරු සාමයක් සහ මානසික සුවයක් පැවතුනි. නිවැරදි ආකාරයේ අවධානය යොමු කිරීම යනු අප කරන දෙයට සම්පූර්ණයෙන්ම අවධානය යොමු කිරීමයි. වැරදි ආකාරයේ කරදර වීම යනු අපගේ ක්‍රියාවන් වල ප්‍රතිඵල ගැන මැසිවිලි නැගීමයි. එතුමිය තමන්ට අවශ්‍ය දෙය ප්‍රකාශ කිරීමෙන් පසු ඒ ගැන තවදුරටත් කරදර වූයේ නැත. එමනිසා එතුමියට ඇතුලාන්ත සාමය පහසුවෙන් නඩත්තු කළ හැකිව තිබුණි.

දෙවියන් වහන්සේ උදෙසා සැම දෙයක්ම කිරීම සහ ඊට තිළිණයක් වශයෙන් කිසිම දෙයක් බලාපොරොත්තු නොවීම මහා පරිමාණයේ ශ්‍රේෂ්ඨ ක්‍රියාවක් නොවීමට පුළුවන. එය සරලව කියතොත් ශුද්ධවන්ත ජීවිතයක් ගත කිරීම සඳහා සමීකරණයකි. අප අනෙකුත් පුද්ගලයන් අපගේ උත්සහයන් අගය කිරීම බලාපොරොත්තු වන ප්‍රමාණය වැඩි වන තරමට අපව වේදනාවට පත් කිරීමට අවස්ථාවක් ද ලබා දේ. අනෙකුත් පුද්ගලයන්ගේ කෙලෙහිගුණ නොමැති භාවය නිසා එතුමිය ශෝකයට පත් වූයේ නැත. ඊට හේතුව එතුමියගේ ආදරයේ ක්‍රියාවන් වලට කිසිදු කොන්දේසියක් ඇදී නොතිබුනු නිසයි. එතුමිය සැම දෙයක්ම නිදහසින් දානය කරන ලදි. ආදරය ගැඹුරු නිදහසේ ළදරුවෙකි.



මහාචාර්ය **ඇන්ටන් මීමන**

---

## 16 දර්ශනය යනු කුමක්ද ?

### ප්‍රඥාව, සත්‍යය සහ බුද්ධිමය නිහතමානීත්වය

ආදිතම මානවයා විශ්වය පිළිබඳ තම ජීවන අත්දැකීම් සම්භාරය ප්‍රකාශ කිරීම සඳහා යොදා ගන්නා ලද මූලිකම මාධ්‍යය වූයේ කතන්දර (Myths) සහ ජන ප්‍රවාද (Folk tales) තැනීමයි. එවැනි ජන කතා වලට මිත්‍ය කතන්දර හෝ අවිද්‍යාත්මක දේවල් යයි කීම සම්පූර්ණයෙන්ම වැරදිය. සැම ජන ප්‍රවාදයකම, සුරංගනා කතාවකම (Fairy tales), විශ්වයේ ආරම්භය පිලිබඳ කතාවකම ගැඹුරු සත්‍යයක් ගැබ්වී ඇත (Every myth has its own truth), මිනිස් ජීවිතය සහ මානව අරගලයන් පිළිබඳව ගැඹුරු අත්දැකීම් අඩංගු වී ඇත.

එක් පරම්පරාවක් විසින් තවත් පරම්පරාවකට තම ජීවිත ප්‍රඥාව උරුම කර දෙන ලද්දේ කතන්දර මඟිනි. අප තවමත් ග්‍රීක සහ රෝම කතන්දර, නෝර්ස් පුරා වෘත්තයන් (Norse Mythology), ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳ ජන සම්ප්‍රදායයන් යනාදිය ඇසීමට, කියවා තේරුම් ගැනීමට රුචියක්, ඇල්මක්. උවමනාවක්, කැමැත්තක් මහ ආශාවක් දක්වන්නේ ඒ නිසයි. ඕනෑම පුද්ගලයෙක් හොඳ කතන්දරයක් අගය කරයි. හොඳ කතන්දරයකට ආදරය කරයි (Everybody Loves a good Story). හොඳ කතන්දර වලට ආදරය කරන්නා මනුෂ්‍යත්වයට ආදරය කරන්නෙකි. (A lover of stories is a lover of humanity).

සැම කතන්දරයකම අඩංගු වූ සත්‍යයක් ඇත. එම නිසා කතන්දරයක අප සෙවිය යුත්තේ වචනාර්ථය නොව. මතුපිට අර්ථය නොව, ගැඹුරු අර්ථයයි (Deeper meaning). උදාහරණයක් ලෙස සුරංගනා කතා දෙස බලමු. සුරංගනා කතන්දර යනු මේ ලෝකයට පරිබාහිර, මිනිස් අත්දැකීම් වලට ආගන්තුක දේවල් නොව, මානව අභ්‍යන්තර අරගලයන් කතන්දර මඟින් ඉදිරිපත් කිරීමයි. මානව අත්දැකීම් වලින් උකහා ගන්නා ලද ප්‍රඥාව සංකේතානුසාරයෙන් ඉදිරිපත් කිරීමයි.

ජීවිතයේ විවිධ පැතිකඩයන් පිළිබඳ ගැඹුරු අදහස් මෙම කතන්දර තුළ සංයුක්තව අඩංගු වී ඇත. වර්තමානයේ මානව ප්‍රඥාව විවිධ විෂයය ක්ෂේත්‍රයන් වලට බෙදා වෙන් කොට තිබුනත් (දර්ශනය, මානව විද්‍යාව, දේව ධර්ම ශාස්ත්‍රය, මනෝ විද්‍යාව, වෛද්‍ය විද්‍යාව යනාදි වශයෙන්), කතන්දරයක මනෝ විද්‍යාත්මක අදහස්, දාර්ශනික අදහස්, මානව විද්‍යාත්මක අදහස්, විශ්ව විද්‍යාත්මක (Cosmology) අදහස් දේව ධාර්මික අදහස්, සමාජ විද්‍යාත්මක අදහස් යනාදි ලෙස විවිධාකාරයේ අදහස් ගැබ් වී ඇත.

කතන්දර බොහෝමයක් දැන සිටි පුද්ගලයා සැබෑ ප්‍රඥාවන්තයෙක් ලෙස සළකණු ලැබුවේ ඒ නිසයි. කතන්දර බොහෝමයක් දැන සිටීම විෂයයන් බොහෝමයක් දැන සිටීමට සමාන විය. කතන්දරයක් නියමාකාරයෙන් සන්නිවේදනය කිරීම ප්‍රඥාවනත්යෙකුගේ සැබෑ ලක්ෂණයක් විය. එවැනි පුද්ගලයන්ට සැම සංස්කෘතියක්ම ඉතා උසස් ගරු බුහුමන් ප්‍රදානය කරන ලදී. පුරාණ ජන සමාජ වලට අනාගතය සකස් කර ගැනීම සඳහා, ජන කණ්ඩායමක් ලෙස යා යුතු මඟ තීරණය කිරිම සඳහා ප්‍රඥාව, මඟ පෙන්වීම ලැබුණේ එම කතන්දර වලිනි. කේන්ද්‍රීය ජන ප්‍රවාදයක් නොමැති ජන කණ්ඩායම වල්මත් වූ ජනතාවකි. නමුත් අප දන්නා පරිදි ජන ප්‍රවාදයන් නොමැති ජන කණ්ඩායමක් නොමැත.

පුරාණ ජන සමාජ වල සිටි මිනිසුන්ට තමන්ගේ ජීවන අරගලයන් සඳහා අර්ථය ලැබුනේ වැඩිහිටියන් විසින් උරුම කර දෙන ලද කතන්දර හරහාය. ජන කතන්දර නිර්මාණය නොකරන ජාතිය ආත්මයක් නැති ජාතියකි. එය හදවතක් නොමැති ශරීරයක් මෙන්ය. ජන ප්‍රවාදයක් නොමැති ජාතියට අනාගතයක්ද නොමැත.

ජන ප්‍රවාදයන්, සුරංගනා කතා, ඓතිහාසික වෘත්තයන් යනාදිය ග්‍රීක ජාතිකයන් විසින් දර්ශනය වැඩි දියුණු කිරීමට පෙර සහ විද්‍යාත්මක ක්‍රමය සොයා ගැනීමට පෙර පැවැති දැනුම් පද්ධතියයි. ජන කතන්දර දාර්ශනික විරෝධී හෝ විද්‍යාත්මක විරෝධී හෝ අතාර්තික නොවේ. ජන කතා නූගත් පුද්ගලයන්ගේ නිර්මාණයන් යයි කීම සම්පූර්ණයෙන්ම වැරදි අදහසකි. එය වර්තමාන බුද්ධිමතුන් අතර පවතින පූර්ව නිගමනයකි.

කතන්දර නොමැතිව මානව සංහතියට පැවැත්මක් නැත. හොඳ කතන්දරයක උපකාරයෙන්, ආධාරයෙන්, පිහිටෙන් සමස්ත මානව සංහතියම ගලවා ගත හැකිය.

ආදිතම ජන සමාජ වල මිනිසුන් සමස්ත විශ්වය සහ තමන් අතර වෙනසක් දැක්කේ නැත. තමන් විශ්වයේ කොටසක් ලෙසත්, විශ්වය මානව වර්ගයාගේ කොටසක් ලෙසත් ඔවුන් සිතුවේය. ස්වභාව ධර්මයා සමඟ ඉතා සමීප සබඳතාවයක්, සහජීවනයක්, සහයෝගයක් එම ආදී කාලීන සමාජ වල පැවතියේ ඒ නිසයි. ස්වභාව ධර්මයා විනාශ නොකර. ස්වභාවික සම්පත් පරිහරණය කිරීමට ඔවුන්ට සහජ හැකියාවක් තිබුණේය.

ගස්, ගල්, ගිරි ශිඛර. සතා සිව්පාවා, ඇල දොල, ගංගා, මුහුද, දිය ඇලි, ඉර, හඳ තාරකා යනාදිය තම පවුලේ සාමාජිකයන් ලෙස සලකන ලදී. ස්වභාවික ලෝකයේ වස්තූන්ට කරන ලද හානිය තම පවුලේ සාමාජිකයන්ට කරන ලද හානියක් ලෙස සලකන ලදී. එවැනි ජන සමාජ වල පරිසර දූෂණය ඉතා අල්ප විය. එවැනි ජන කණ්ඩායම් වලින් අපට උගත හැකි දේවල් බොහෝය.

ඉදිරි කලාපයට... »



බෝල්වලාන දිසා දිව්‍ය හෘදය සංගමයේ ඥාන කාන්තිය පසුගියදා දිසානායක ගරු බැසිල් වික්‍රමසිංහ පියතුමාගේ සහයෝගය මත සිදුව දහම් සේවා ශාලාවේදී පවැත්විය. ඥානකාන්තිය අර්ථවත් කළ ගරු නුවන් රුද්‍රිගු පියතුමා සාමාජික සාමාජිකාවන් සමඟ ප්‍රදීප කැමරාවට පෙනී සිටි අවස්ථාව. (ටී. සුනිල් ප්‍රනාන්දු)

## මීසමේ ජනමාධ්‍ය උපහාරය ප්‍රදීප ලේඛකයාට



හැඳල නායක කන්ද ශා. මරියා දෙව්මැඳුරේ 150 වැනි ජුබිලි මහෝත්සවයට විවිධ අංශවලින් දායකත්වය සැපයූ අය වෙනුවෙන් ගරු උපහාර තිළි පිරිනැමීමක් සිදු කරනු ලැබීය. ජන මාධ්‍ය අංශය වෙනුවෙන් පිරිනැමුණු ගරු උපහාර තිළිණය හිමිකරගත් ප්‍රවීන මාධ්‍යවේදී ප්‍රදීප හා ද මැසෙන්ජර් ලේඛක නිමල් පෙරේරා මහතා තමන්ට හිමි ගරු උපහාර තිළිණය කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් අතින් ලබාගත් අවස්ථාව මෙහි දැක්වේ. නායකකන්ද මීසම් සේවක ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමා මෙහි වෙයි.

*(සේයා නිහාල් පින්ටෝ)*

## දනමය පුණ්‍ය ක්‍රියාවක්



කුරුකුලාව පහළ වත්ත සා. සෙබස්තියන් මාවතේ ස්ථාපිත එම මුනිඳු ප්‍රථිමා මණ්ඩපයට වසර විස්සක් පිරීම නිමිති කර ගෙන හීන්කෙන්ද කුරුකුලාව සුබ සාධක සංගමය මගින් නොමිලේ වෛද්‍ය සායනයක් සහ සිංහ සමාජය මගින් ඇස්කණ්නාඩි ලබාදීමක් සංවිධානය කැරිණ. ශුද්ධ වූ සෙබස්තියන් මුනිඳු ප්‍රතිමාව රැගත් පෙරහැරක් පවත්වා පාසල් දරුවන්ට අභ්‍යාස පොත් හා පාසල් උපකරණ ද බෙදා දෙන ලදී. ඉන් පසු දානමය පුණ්‍ය ක්‍රියාවක් ද පැවැත්විය. කුරුකුලාව මීසම් සේවක ගරු ප්‍රසාද් පොන්නම්පෙරුම, එඬේරමුල්ල මීසම් සේවක ගරු ඇන්ටන් ප්‍රේමලාල්, තේවත්තේ ගරු ෆිලීෂයන් ප්‍රදිනාන්දු නි.ම.නි පියතුමන් ද එක්වූහ. ගරු ඇන්ටන් ප්‍රේමලාල් පියතුමා ප්‍රතිමාව ආසිරිගැන්වූ අයුරු. *සටහන - හේමමාලි ගමගේ*

*ඡායාරූප - එච්. ඒ. කල්දේරා*

## කලා ඔයදී කිතුනු හමුවක්



පසුගියදා බොල්වත්ත සා. වින්සන්ද පාවුලා සමිතියේ සාමාජිකයින් පිරිසක් කලාඔය ලූර්දු මාතා දේවස්ථානය වෙත වන්දනා චාරිකාවක නිරත විය. එහිදී එම ප්‍රදේශයේ වෙසෙන දුගීන් පිරිසකට වියලි ආහාර ද්‍රව්‍ය ද බෙදා දුන් අතර කලාඔය වැඩිහිටි නිවාසයේ වෙසෙන නේවාසිකයින් හට ද එම ස්ථානයේ දී ම දිවා ආහාරය පිළියෙල කර ලබාදුනි. එම විසෙන්තියානු කණ්ඩායම එහිදී දිවා ආහාරය සැකසීමේ යෙදී සිටින අයුරු මෙම සේයාරුවෙන් දැක්වේ. *(කේ. නිහාල් ප්‍රනාන්දු)*

## පල්ලන්සේන මීසමේ පවුල් හමුවක්



රටේ ජාතික නිදහස පැවතිය යුත්තක් මෙන්ම පවුල තුළද ප්‍රීතිය හා සාමය, අඹුසැමි නිදහස ද ඇතිවිය යුතුය යන සංකල්පය අනුව ජාතික නිදහස සමරන දිනයේදී පල්ලන්සේන මීසමේ විවාහක පවුල් සඳහා දෙදිනක සමුළුවක් දවස පුරා දුවන ශු. ත්‍රිත්ව දේවස්ථානයේ දී මීසම් සේවක ගරු ජයන්ත නිමල් පියතුමාගේ සැලසුම් මත ආරම්භ විය. මෙම සමුළුව පවුල් සේවා ජාතික අධ්‍යක්ෂ ගරු ජුලියන් පැට්‍රික් පෙරේරා පියතුමාගේ ප්‍රධානත්වයෙන් මෙහෙය වූ අතර පවුල් සේවා සංවිධානයේ සාමාජික යුවලක් දේශන පැවැත්විය. *(මෙල්වින් ද කොස්තා)*

## ද මැසිනොද් විදුහලට නව රසායන විද්‍යාගාරයක්



*කඳාන ද මැසිනොද් විද්‍යාලයේ නව රසායන විද්‍යාගාරය විවෘත කිරීම මහාචාර්ය විලී මෙන්ඩිස් සහ මහාචාර්ය රොහාන් ජයසේකර යන මහතුන්ගේ ප්‍රධානත්වයෙන් පසුගියදා සිදු කෙරිණි. නව විද්‍යාගාරය විවෘත කිරීමෙන් අනතුරුව ඔවුන් එය නිරීක්ෂණය කළ අයුරු. විදුහල්පති ගරු බර්ට්‍රම් පෙරේරා සහෝදරතුමාද විදුහලේ නව නිපැයුම් සංගමයේ අනුශාසක ලක්ෂමන් නෝනිස් ගුරු මහතාද සේයාරුවේ දැක්වේ.*

(ඇන්ටන් ජයසූරිය)

## 25 වසරක සැමරුමක්



*තමන් ජීවත් වන කුඩා කිතුනු සංඝය, කොට්ඨාසය සභාව සහ මීසම තුළ විවිධ තනතුරු දරමින් ඒවා තුළින් දෙවිඳුන් මහිමයට පත් කිරීමට නිරන්තරයෙන් ඇප කැප වී කටයුතු කරන ආදර්ශවත් කිතුනු යුවළක් සිය විවාහ දිවි ගමනේ 25 වන සංවත්සරය දෙවිඳුන්ට තුති දීමේ දිව්‍ය යාගයකින් සැමරූහ. ඔවුහු නම් අංක 49, කටාන අම්බලයාය පදිංචි විල්ෆ්‍රඩ් කුමාරපේරු සහ ලියෝනි කුමාරපේරු වෙති.*

මිනු/ ආඬිමුල්ල ප්‍රාථමික මිශ්‍ර විදුහලින් මූලික අධ්‍යාපනය ලබා ද්වීතීය අධ්‍යාපනය මීගමුව මාරිස්ටෙල්ලා විදුහලින් ලැබූ කුමාරපේරු මහතා පාසල් අධ්‍යාපනය නිමා කිරීමෙන් පසු ලිපිකාර වෘත්තියට පිවිසියේය. පසුව ඉන් ඉවත්ව ව්‍යාපාරික ක්ෂේත්‍රයට යොමුවිය.

කටාන හල්පේ ශා. ප්‍රැන්සිස් ස්වියර් මුනිඳුන්ගේ දෙව්මැඳුරට අනුබද්ධ කිතුනු ඒකක නායක, කොට්ඨාස නායක තනතුරු දරා 1984 මීසම් කමිටු ලේකම් ධූරයට තේරී පත්වී අඛණ්ඩව තෙවතාවක් ඒ ධූරයේ කටයුතු කළේය.

හල්පේ මීසම් සංඝය එළිදැක්වූ "අහෝ මාගේ සෙනගෙනී" පාස්කු දැක්මේ 1999, 2000, 2003 සහ 2007 වසර වලදී එහි ප්‍රධාන භාණ්ඩාගාරික සහ රංගන ශිල්පියෙකු ලෙස විල්ෆ්‍රඩ් මහතා මාහැඟි මෙහෙයක් ඉටු කළේය.

මාරවිල මුදුකටුව ප්‍රදේශයේ උපන් ලියෝනි මහත්මියද දේවස්ථානය හා ඉතා කිට්ටු සබඳතාවයක් පවත්වා ගනිමින් නිහඬ මෙහෙවරක් ඉටු කළාය. ඔවුන් දෙපලගේ විවාහ දිවිය 1984.12.17 වන දින ඇරඹිණි. දරුවන් දෙදෙනකුගේ මාපියන් වූ ඔවුන් හල්පේ දේවස්ථානයට අනුබද්ධ විවාහ හමුවේ යාවජීව සාමාජිකයින් ලෙස දැනට කටයුතු කරන අතර ශුද්ධවූ පවුලේ ආදර්ශය තුළ මෙලොව දිවි ගෙවීමට ඔවුනට දෙව් ආසිරි බහුලව පතමු. (සිසිල් ඩැනීසියස්)

## මහජන බැංකුවේ අනුග්‍රාහක දායකත්වයෙන් ජාතික මඩු සිද්ධස්ථානයට විශ්‍රාම් ශාලාවක්



මහජන බැංකුවේ දායකත්වයෙන් ජාතික මඩු සිද්ධස්ථානයේ ඉදිකිරීමට නියමිත විශ්‍රාම ශාලාව සඳහා රුපියල් මිලියන පහක මුදල් පරිත්‍යාගයක් ඉකුත් දා අරලියගහ මන්දිරයේදී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා අතින් මන්නාරම රදගුරු අති උතුම් රායප්පු ජෝශප් හිමිපාණන් වෙත ප්‍රදානය කෙරුණි.

මෙහිදී මන්නාරම රදගුරුහිමි විසින් ආශ්චර්යවත් මඩු දේව මෑණියන්ගේ ප්‍රතිමාවේ ත්‍රිමාණ ඡායාරූපයක් අතිගරු ජනාධිපතිතුමා වෙත පිළිගන්වන ලදී. මෙම අවස්ථාවට මඩු සිද්ධාථානයේ මීසම් සේවක ගරු එමිලියානුස් පිල්ලෙයි පියතුමා, මහනුවර ශාන්ත බෙනඩික්ට් විද්‍යාලයේ විදුහල්පති ගරු සිල්වෙස්ටර් ජයකොඩි පියතුමා සහ මහජන බැංකුවේ අධ්‍යක්ෂ ආචාර්ය ඩී.ජේ.ඩී. ජයකොඩි සහ ප්‍රධාන විධායක නිලධාරී / සාමාන්‍යාධිකාරී එන්.වසන්ත කුමාර යන මහත්වරුන්ද සහභාගි වූහ. *(මහජන බැංකුව - මාධ්‍ය ඒකකය)*

## මාධ්‍යවේදියා සදා සාමයට



අභීත මධ්‍යවේදියකු ලෙස යුක්තිය හා සාධාරණය වෙනුවෙන් සිය පැන මෙහෙයවූ පමුණුගම කැපුන්ගොඩ පී. ජුලියන් නෝනිස් මහතා පසුගියදා දිවියට සමුදී දෙවිඳුන් තුළ සදා සමාදානයේ සැතපුනේය.

1948 ඔක්. මස 26 දා බැතිමත් කිතුනු පවුලක කැපුන්ගොඩසෙත්තප්පාඩුව ග්‍රාමයේදී මෙලොව එළිය දුටු ජුලියන් නෝනිස්ගේ පියා වූ ජෝශප් නෝනිස් මහතා කැපුන්ගොඩ සාන්ත අන්තෝනි දෙව්මැඳුරේ ප්‍රධාන අන්නවිධූරය දරමින් ධීවර ව්‍යාපාරිකයකු ලෙස කැපුන්ගොඩ දේව ජනතාවට අමිල සේවාවක් ඉටු කළේය.

පියාගේ අඩිපාරේ යමින් ජුලියන්ද දෙව්මැඳුරේ ආගමික හා සමාජ සේවා සංවිධාන වල පෙරමුණේ සිට ප්‍රදේශයට අමිල සේවාවක් ඉටු කළේය. ධීවර ප්‍රශ්ණ ධීවර ජනදුක ගැන නිතර ප්‍රදීපයට හා ජාතික පුවත් පත් වලට අභීත ලෙස නොපැකිලි සිය පෑන මෙහෙයවූ ඒ මහතා වර්තමාන කාදිනල් හිමිපාණන් පූජක තුමකු ලෙස කැපුන්ගොඩ සේවය කළ යුගයේ උන්වහන්සේ ළඟින්ම සිටිමින් එතුමාගේ සියළු සමාජ සත්කාර වල පෙරමුණේ සිටිමින් එතුමාට සියළු ශක්තිය ලබා දුන්නේය.

තරුණ කණ්ඩායමේ තරුණ නායකයා ලෙස කාදිනල් හිමිපාණන් ළඟින්ම ඇසුරු කළ ඔහු කාදිනල් හිමිපාණන් සමග එදා සෙත්තප්පාඩුව මෝලවත්තේ ධීවර ගම්මාන පිහිටුවීමේ පුරෝගාමින් අතර පෙරමුණේ සිටියේය. එතුමා එම ධීවර ජනපදයේ ගොඩනැගූ ධීවර නිවාස 25 න් නිවාස 12 ක්ම බෙදා දීම භාර කළේද ඔහුටය. පුතුන් දෙදෙනෙකුගේ හා දියණියන් දෙදෙනෙකුගේ පියකු වන ඔහු ප්‍රදේශයේ හැම ප්‍රජා සේවාවකදීම එඩිතරව නොබියව අභීතව පෙරමුණගත්තේය. ඔහුට සදා මොක් සුව. *(ජෝ. සංගපාලආරච්චි)*

## ප්‍රදීප ලේඛකයා සම්මාන ලබයි



පමුණුගම මහවත්ත ශු. ජුසේ මුනිඳුන්ගේ සහෝදර සමිතිය මගින් ප්‍රදේශයේ මරණාධාර සමිතියේ පුරා අවුරුදු පනහක් නිලතල ගනිමින් එහි උන්නතියට කටයුතු කළ ප්‍රධාන ලේකම් බෙන්ජමින් කිරිහෙට්ටි මහතාට හා අරමුදල ලක්ෂ දහය දක්වා තරකල භාණ්ඩාගාරික ප්‍රථශාලාචාර්‍ය ජේ.ඩී. ඇලෝසියස් නානායක්කාර මහතාට උපහාර පිදීමේ උළෙලක් සභාපති ජී. සුසන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා පැවැත්වුණි. එහිදී හිටපු ගම්සභාපති සාමවිනිසුරු පී.ඩී.ඒ. ජෝශප් මහතා විසින් එම සිහිවටන පිළිගැන්වීම මෙම ඡායාරූප වලින් දැක්වේ.

## කතෝලික ධීවරයන් .... 1 පිටුවෙන්

මේ අතර ජාත්‍යන්තර මුහුදේ දී විදේශීය අත්අඩංගුවට පත්වීම, පාරම්පරික ධීවර දූපත්, සංචාරක කලාප වලට වෙන් කිරීම ආදී ගැටළු රැසක් මතුව ඇත.

අතීතයේ දී කතෝලික සභාව සිය ජීවනාලිය ලෙස ධීවර ජනතාව සලකා ඔවුන්ගේ අභිවෘද්ධිය උදෙසා බොහෝ වැඩසටහන් මෙන්ම සහනාධාර ලබා දීමට ද යොමු වුවද කාලයාත් සමඟ ඒ තත්ත්වයන් වෙනස් වීම නිසා මේ වන විට කතෝලික ධීවරයා තනිවූ තත්ත්වයකට පත්ව තිබීම ශෝචනීය තත්ත්වයක් ලෙස ධීවරයෝ කරුණු දක්වති.

## උගත් පාඩම්... 1 පිටුවෙන්

නිර්දේශයන් ඉක්මනින් ක්‍රියාවට නැංවුවහොත් රටේ ඉදිරිය යහපතක් වේ යැයි විශ්වාස කරන බවයි. සංහිඳියාව යහපාලනය මානව අයිතීන් සහ ජනවාර්ගික ගැටලු සඳහා දේශපාලන විසඳුම් වැනි අංශ පිළිබඳව කටයුතු කිරීමට කරිටාස් ශ්‍රී ලංකා ආයතනය ප්‍රමුඛත්වයක් දී ඇති බව අවධාරණය කළ පියතුමා කතෝලික සභාවෙන් 2010 උගත් පාඩම් සහ සංහිඳියා කොමිසන් සභාව වෙත ඉදිරිපත් කළ කරුණු බොහොමයක් මෙම වාර්තාවේ අන්තර්ගත වන බව ද පැවසීය. තවද කතෝලික සැදැහැවතුන් අතර සිංහල සහ ද්‍රවිඩ ජන කොටස් සිටීම නිසා දෙකඩ වූ ශ්‍රී ලාංකීය සමාජය යළි එක් කිරීමට කතෝලික සභාවට විශේෂ කාර්ය භාරයක් ඉටුකළ හැකි බව ද පියතුමා සඳහන් කළේ ය.

මෙහි දී සහභාගි වූ බුද්ධිමතුන් අතර ඉතා යහපත් අදහස් හුවමාරුවක් ඇති වූ අතර, ඒකමතිකව එකඟ වූයේ උගත් පාඩම් කොමිසමෙහි ඇති කරුණු පුළුල් ලෙස ජනතාව දැනුවත් කිරීම කළ යුතු බවය. මෙම වැඩසටහන ගරු ආචාර්ය මර්වින් ප්‍රනාන්දු පියතුමා විසින් මෙහෙය වූ අතර, සී. ජී. ජෙයකුමාර් පියතුමා, එබනේෂ ජෝශප් දේවගැතිතුමා, ජීවන් ත්‍යාගරාජා, ආචාර්ය ජොහාන් පෙරේරා, භවානි ෆොන්සේකා, ආචාර්ය විජය ජයතිලක, මිරාග් රහීම්, ආචාර්ය ජයම්පති වික්‍රමරත්න, නීතිඥ ජාවිඩ් යූසුෆ්, රුක්ෂාන් ප්‍රනාන්දු යන කථිකයින් තම අදහස් ඉදිරිපත් කළහ.

## ඉන්දු - ශ්‍රී ලංකා ... 1 පිටුවෙන්

කොළඹ 4, ශා. පීතර විදුහලේ 80 වෙනි වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී ඉන්දීය - ශ්‍රී ලංකා මහ කොමසාරිස් අශෝක් කේ. කාන්ත මහතා එලෙස අවධාරණය කළේ එහි ප්‍රධාන ආරාධිතයා වශයෙන් සහභාගි වෙමිනි.

වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමින් අදියුරු ගරු ට්‍රැවිස් ගේබ්‍රියෙල් පියතුමන් පවසා සිටියේ නව ශ්‍රී ලංකාවක් ගොඩනැංවීමේ දී උගත් පරපුරක අවශ්‍යතාවය අවශ්‍යයෙන්ම දැනෙන නිසා පෞද්ගලික විශ්ව විද්‍යාලවල අවශ්‍යතාවය අද ශ්‍රී ලංකාවට බෙහෙවින්ම දැනෙන බවයි. විවිධාංගිකරණයේ අධ්‍යාපනයක් තුළින් ඉහළ දැනුම් මට්ටමක් ලබා ගැනුමට අධ්‍යාපන ආයතන ප්‍රමාණය ඉහළ නැංවිය යුතු බවත් වාර්ෂික වාර්තාවෙන් පෙන්වා දෙන ලදි. විදුහලේ ගරු පියතුමන් ඇතුළු ආචාර්ය මංඩලය මෙම ත්‍යාග ප්‍රදානෝත්සවය සංවිධානය කර තිබිණි.

## ජුබිලිය වෙනුවෙන්.... 1 පිටුවෙන්

මීසම් සේවක ගරු ජෙරම් පෙරේරා සහයක ගරු ජාමික සුමේධ යන පියතුමන්ලාගේ ආරාධනයෙන් කොළඹ අගරදගුරු පදවි මත්ද්‍රව්‍ය නිවාරණ අපෝස්තලික සේවා අධ්‍යක්ෂ ගරු ජූඩ් බර්නාඩ් රුද්‍රිගු පියතුමන් විසින් එම පෝෂණ වැඩසටහන මෙහෙයවන ලදි.

## වත ඉරාගෙන .... 5 පිටුවෙන්

පුරාණ ගිවිසුමේ දිවැසිවරුන්ගේ සිට නව ගිවිසුමේ ස්නාවක ජුවාම් තුමා ද අප සමිඳාණන් වන ක්‍රිස්තුන් වහන්සේ ද ආරධනා කරන්නේ පසුතැවිලි වී අප සිත් වෙනස් කොට ගෙන නව ජීවන මඟකට යොමු වීමයි.

මෙලෙස අපි සෑම වසරකම අළු බදාදා දින හා ඉන් ඇරැඹෙන චතාරික සමය තුළ මනස්ථාපනය සඳහා ආරාධනා ලැබුව ද අප තුළ ගැඹුරු ජීවිත වෙනසක් අත්දකින්නට නොහැකි වී ඇත. මන්දයත් අප සැම විටම යොමුවන්නේ අපව වෙනස් කර ගැනීමට නොව අප වෙනස් වූ බව අන් අයට පෙන්වීමට ය. දෙවිඳාණෝ අපට ආරාධනා කරන්නේ "වත ඉරාගෙන නොව, සිත ඉරාගෙන නුඹේ දෙවි සමිඳුන් වෙත හැරී එන්න..." (ජොඑල් 2:3) කියා ය.

මේ වසර අපි දේව වචනයට කැප කර ඇති අතර මේ වසරේ අළු බදාදායින් චතාරිකයට ඇතුළු වන අපට සමිඳාණෝ ආරාධනා කරන්නේ මෙම වරප්‍රසාදජනක කාලය අපතේ නොහැරිය යුතු බව නොවන්නේ ද? මේ කාලය තුළ දෙවි පියාණන්ට වඩාත් කිට්ටු වෙමින් උපවාසය හා එක්වරු ශීලය රකිමින් අපගේ මිනිස් දුබලකම් වලට මනස්ථාපනය වී යැදුම සඳහා වැඩි කාලයක් යොමු කරමින් ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම මරණය හා විජයග්‍රාහි උත්ථානයේ සාක්ෂිකරුවන් වන්නට අදිටන් කර ගනිමු.

## කලාභූෂණ සම්මානයෙන් පිදුම් ලැබූ ඇනස්ටා



මීගමුව ප්‍රදේශයේ කන්තාරු ගී ගායිකාවක්වූ, රුක්මණී දේවී අනුස්මරණ සංගමයේ නිත්‍ය ගායිකාවක වන සිරිමා ඇනස්ටා මර්සලින් කලාභූෂණ සම්මානයෙන් පිදුම් ලැබුවාය. ලේඛිකාවක් මෙන්ම කිවිදියක්ද වූ සිරිමා ඇනස්ටා මර්සලින් "වැරදුන කුරුමානම" චිත්‍රපටයේ රුක්මණී දේවී ගායනා කළ "නමෝ මරියනි" ගීතය ගායනා කරන ගායිකාවක් වන අතර දැනට ලංකාවේ කිසිම ගායිකාවක් හෝ නවක ගායිකාවක් මෙම ගීතිකාව මෙතෙක් ගයා නැත. *(හෙන්රි ප්‍රියෂාන්ත මෙන්ඩිස්)*

## වකුගඩුවක් පිරිනමා තරුණ ජීවිතයක් බේරා ගනිමු



වෙන්නප්පුව, උල්හිටියාව, කොස්ගස් හංදිය පාර, නො. 74සී හි පදිංචි, 26 හැවිරිදි තිලාන් පවිත්‍ර විතානගේ නැමැති එක් දරු පියා දරුණු වකුගඩු ආබාධයකින් පෙළෙයි.

වකුගඩු යුගලයම අක්‍රිය වී ඇති මෙම තරුණයාගේ ජීවිතය බේරා ගැනීම සඳහා "ඒ" සහ "ඕ" වර්ගයේ වකුගඩුවක් බද්ධ කළ යුතු බවට කොළඹ ජාතික රෝහලේ වකුගඩු රෝග විශේඥ වෛද්‍ය ඒ.එල්.ඇම්. නසාර් මහතා නිර්දේශ කර ඇති නිසා, එවැනි වගුගඩුවක් සහිත පරිත්‍යාග ශීලීයෙක් වෙතොත් 077-1618841, 077-9420887 හෝ 077-3860351 අංක වලට දැනුම් දෙන ලෙස ඔහුගේ බිරිඳ කාරුණිකව ආයාචනා කරයි.

ප්‍රතිකාර සඳහා විශාල මුදලක් වැයවන බැවින් ඒ සඳහා ලංකා බැංකුවේ වෙන්නප්පුව ශාඛාවේ 72608056 ගිණුම් අංකයට හැකි පමණින් මුදල් පරිත්‍යාග කරන මෙන් පරිත්‍යාග ශීලීන්ට කාරුණිකව ඇරයුම් කරමු. *(ප්‍රියන්ත පීටර්ස්)*

## දයාවේ ඉග්නේෂියානු සංගමයෙන් සත් කාර්යයක්



දයාවේ ඉග්නේෂියානු සංගමය මගින් ප්‍රථම වරට සංවිධානය කර තිබූ ලේ දන්දීමේ ව්‍යාපාරයක් පසුගිය 07 වන පෝය දින ලොයෙලා විද්‍යාලීය ප්‍රධාන ශාලාවේදී පැවැත්වුණි. එහිදී ලේ පරිත්‍යාගශීලීන් 100 වැඩි ප්‍රමාණයකගේ දායකත්වයෙන් මෙම දයාවේ උදාරතර කර්තව්‍යය සිදු වූ අතර එහිදී ලේ දන්දීමේ ව්‍යාපාරයට එක්වූ ගරු කැලිස්ටා පැවිදි සොයුරිය ඡායාරූපයේවේ. මෙය සංවිධානය කරන ලද්දේ දයාවේ සංගමය විසිනි.

## සමානතාවය සමාජගත කිරීම කිතුනු අපේ අභියෝගාත්මක වගකීමකි

"පුරාණ ගිවිසුමේ සඳහන් 'ඇසට ඇස දතට දත' යන වෛරිය න්‍යායය මුලුමනින්ම වෙනස් කරමින්, එදා සමාජය ඉතා පිළිකුලින් බැහැර කළ ලාදුරු රෝගියා සුවපත් කරමින් කිතු සමිඳුන් ලොවට පෙන්වා දුන් මානව දයාව, සමාජ සමානතාවය අද සමාජගත කිරීම කිතුනු අපේ අභියෝගාත්මක වගකීම යැයි" හලාවත රදගුරු අති උතුම් දෙව්ශිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණෝ නාත්තන්ඩිය නිර්මල ලූර්දු දේවමාතා සිද්ධස්ථානයේ දියමන්ති ජුබිලි මංගල දේව මෙහෙයේදී පැවසූහ.

"දෙව්මැඳුරු දෙවියන්ට කැපකිරීමට වඩා කිතුනු ජනතාව දෙවියන්ට කැපවීම වඩාත් වැදගත්" බව උන්වහන්සේ වැඩිදුරටත් පැවසීය.

දියමන්ති ජුබිලි වසර අරමුණු කරගෙන නිර්මල නිකායේ පියවරුන් මෙහෙයවන ලද මහා ධර්ම විවේකය මීසම් ජනතාව දහම් ප්‍රබෝධයක් ඇති කිරීමට සමත් විය. දියමන්ති ජුබිලියට නායකත්වය දෙමින් දිවා රෑ මහත් වෙහෙසක් දැරූ මීසම් පති ගරු පීටර් උපාලි චර්චිල් පියතුමා කළ සේවය සදා අමරණීයයි. *(ජෝශප් එම්මානුවෙල් පෙරේරා)*

## වසර 38 ක සේවාවකින් පසු ඉසිඹු ලබයි



වග වැලිකන්න මීසමට අයත් ලබුගම පාරේ පැල්පොල අංක 1 නිවසෙහි පදිංචි ලලනි සමරතුංග මහත්මිය ලංකා බැංකුවේ වසර 38 ක සේවා කාලයකින් අනතුරුව මාංඩලික නිලධාරිණියක ලෙස ඉකුත් දා විශ්‍රාම ලැබුවාය. හංවැල්ල මීසමට අයත් යට්ටෝවිට උපත ලද ඇය, ගරු ඇන්තනි සමරතුංග පියතුමාගේ වැඩිමහල් සොයුරිය ද වෙයි.

දියණියන් තිදෙනකුගේ සෙනෙහෙබර මවක වන ඇය වැලිකන්න ප්‍රදේශයේ ආගමික හා සමාජීය, ව්‍යාපාරික කටයුතුවල නියැලෙන නෙල්සන් රූපසිංහ මහතාගේ දයාබර බිරිඳ ද වෙයි.

ලලනි සමරතුංග මහත්මිය ලංකා බැංකුවේ කතෝලික සේවක සංගමයේ ක්‍රියාකාරී සාමාජිකාවක වූ අතර වැලිකන්න මීසම් ධර්ම සේවා සභාවේ සාමාජිකාවක ලෙසින් ද කිතුනු ඒකකයේ කංඩායම් නායිකාවක ලෙසින් ද කටයුතු කළාය. ඉසිඹු ලද සමරතුංග මහත්මියට තමන් ලද දේව දීමනා තුළින් වඩාත් ගිහි දූත සේවා වලට යොමුවීමට සමිඳු වරම් පතමු.

*තියබෝල්ඩ් සමරතුංග*

## දහම් සේවිකාව යුග දිවියට



මිනුවන්ගොඩ කලහුගොඩ ශා. මරියා දෙව්මැඳුරේ දහම් පාසලේ පුරා අවුරුදු දාහතරක් දූ දරුවන්ට දහම කියා දුන් කලහුගොඩ ජීවනී සුගන්ධිකා මෙනවිය පුරා අවුරුදු පහලොවක් ශු. පවුලේ පැවිදි නිකායේ ආඬිඅම්බලම ළදරු පාසලේ දරු දැරියන්ගේ ගුරු මාතාවක් වූවාය. ඇය පමුණුගම සමාජ සේවා පවුලක අමිල නානායක්කාර මහතාගේ අතගත්තාය. මෙම දෙපලගේ යුග දිවියට සුබ පැතුම් පතමු. *(බෙන්ජමින් කිරිහෙට්ටි)*

## කටුකුරුන්ද මීසමට වසර 30 කට පසු කුරුස ප්‍රතිමාවක්

මොරටුව කටුකුරුන්ද ශා. මරියා දේවස්ථානයේ පාස්කු සමයේ තුන්පැය ධ්‍යානය සඳහා දර්ශනය කරන ජේසුස් වහන්සේගේ ප්‍රතිමාව වසර 30 කින් පසු ඒ හා සමාන අලුත් ප්‍රතිමාවක් ලැබීමේ වාසනාව උදාවිණි. එය හිටපු මීසම්පති ගරු සමන්ත කුරේරා පියතුමාගේ මීසමට තිළිණයකි. නව ප්‍රතිමාව පිළිගැනීමට මීසම් පති ගරු ක්‍රිශාන්තස් ප්‍රනාන්දු (නි.ම.නි.) පියතුමා ඇතුළු මීසම් ජනතාව කටුකුරුන්ද පාරට එක්රැස්වී එතැන් පටන් දේවස්ථානය වෙත ප්‍රතිමාව තැන්පත් කිරීම සඳහා පෙරහරකින් ගමන් කරන ලදී. *(අසිත ප්‍රියදර්ශන)*




වත්තල ගල්වැටිය ශු. ජපමාල රාජේශ්වරියගේ දේවස්ථානයේ 125 වන ජුබිලිය සාර්ථකව සිදු කිරීමට දෙව්මව් පිහිට පතා ශු. ජපමාල සංගමයේ සාමාජික සාමාජිකාවෝ පසුගියදා මඩු සිද්ධස්ථානයේ වන්දනා චාරිකාවක යෙදුන අතර, නේවාසික ගරු නිමල් පොන්වීර පියතුමා සමග ඡායාරූපයකට පෙනී සිටි අයුරු. *(ක්ලැරන්ස් ලෙනාඩ්)*

## බර්නාඩ් සර්ගේ අළුත් පොතක්

ප්‍රවීණ ඉංග්‍රීසි ලේඛක, කලා භූෂණ සම්මාන ලාභී බර්නාඩ් ද සිල්වාගේ "An Aid To Spellings" ඔහුගේ නවතම කෘතිය වේ. මෙම ග්‍රන්ථය පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පමණක් නොව, විශ්ව විද්‍යාල සිසුන්ටත්, රජයේ හා පෞද්ගලික අංශවල සේවකයින්ටත් ඉතා ප්‍රයෝජනවත් වනු ඇත.

එක් පරිච්ඡේදයක අක්ෂර වින්‍යාස පිළිබඳ නීති රීති උදාහරණ සමග සවිස්තරව දී ඇත. මෙම කෘතියේ පිළිතුරු සමග අභ්‍යාස 25 ක් ඇතුලත් වී තිබේ. මෙම පොත පාඨකයින් අතර ඉතා ජනප්‍රිය වන බව නිසැකය. මෙය ශ්‍රී ලංකාවේ කතුවරයකු විසින් ඉංග්‍රීසි අක්ෂර වින්‍යාසය පිළිබඳ ලියන ලද පළමුවන කෘතිය වේ.

## දිව්‍ය හෘදයේ සාමාජිකාව සග සුව දිනයි

වර්ෂ 1946 මාර්තු මස තුන්වන දින ආරම්භ වූ වග මීසමේ වැලිකන්න දිව්‍ය හෘද සමිතියේ ආරම්භක සාමාජිකාව මෙන්ම දිව්‍ය හෘදය සමිතියේ පළමුවන ලේඛිකා වශයෙන් කටයුතු කළ ඩී.ඩී. මරිය නෝනා මහත්මිය පෙබරවාරි පලමුවන දින සදහටම අපෙන් සමු ගත්තාය. නෝනේ අක්කා යන අන්වර්ථ නාමයෙන් ගමේ සැම හැඳින්වූ ඇය නිතරව සිනහපිරි මුහුණින් සිටි ඉතා නිහතමානී චාම් සරල ජීවිතයක් ගත කරමින් කාගේත් සිත් දිනා ගත් අයෙකි.

වත්මන් දිව්‍ය හෘද සමිතියේ මියයන තුරුම සාමාජිකාව වූ ඇය අප සමිතියේ සාමාජිකාවන් හට තම අත්දැකීම් වලින් හා අනිකුත් සම්පත් වලින් නොමදව සහයෝගය දක්වමින් අප සැම ධෛර්යවත් කළාය. ඇය මිය යන විට වයස 92 කි.

ජේසුගේ දිව්‍ය හෘදය තුළ දෙවිඳු ඉදිරියේ වතට වත දැකීමේ භාග්‍ය ඇයට ලැබේවායි අපි සැම ප්‍රාර්ථනා කරමු.

*(ග්‍රේටා පෙරේරා)*

## බිබිල මීසමේ ගුරුවරු ප්‍රතිඥා දෙති

බිබිල මීසමේ දහම් ගුරුවර ගුරුවරියන් නම දෙනෙක් නව වසර සඳහා තම වගකීම නොපිරිහෙලා ඉටු කිරීමට දෙවි පියාණන් ඉදිරියේ ඉරුදින දිව්‍ය පූජාවේදී ප්‍රතිඥා දුන්හ.

බිබිලේ මීසම් සේවක ගරු ජූඩ් නිශාන්ත සිල්වා පියතුමා මෙහිදී දහම් ගුරුවරයාගේ කාර්ය භාරය හා වගකීම මනාව පැහැදිලි කර දෙමින් සැම විට තම ආදර්ශවත් දිවිය තුළින් දරුවන් හට දහම ඉගැන්විය යුතු බවත් එම කාර්යය පහසු කර ගැනීම සඳහා දෙමව්පියන් අතර සම්බන්ධතාවයක් තබා ගැනීම වඩාත් උචිත බවත්, තවද බුද්ධියට නොව හදවතට දහම බෙදා හැරිය යුතු බවත් ප්‍රකාශ කළේය.

*(ගරු නීටා ප්‍රනාන්දු පැවිදි සොයුරිය)*